දෙවැනි කොටස

ජනවාරි 31 දින සිද්ධියෙන් පසු මහ බැංකුවේ කටයුතු යථාතත්ත්වයට පත්වීම

1996 ජනවාරි 31 දින පෙරවරුවේ ජනාධිපති මාවතෙහි පිහිටි මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිල්ලට සහ ඒ අවට පිහිටි ගොඩනැගිලිවලට ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල විය. මෙම බෝම්බ පිපිරීම හා එයින් පසුව ඇති වූ ගින්න හේතුකොට ගෙන මහ බැංකු ගොඩනැගිල්ලට සහ මහ බැංකුවේ ඇතැම් දෙපාර්තමේන්තු ස්ථානගත කොට තිබූ අවට පිහිටි වෙනත් ගොඩනැගිලි කිහිපයකට බරපතල හානි සිදුවිය. මහ බැංකු සේවකයින් හතලිස් එක් දෙනෙකු මිය ගිය අතර විසිඑක් දෙනෙකු ස්ථිර ආබාධිත තත්ත්වයට පත් විය. තවත් සිය ගණනකට තුවාල සිදුවිය. බැංකුවේ ලී බඩු සහ උපකරණවලට විශාල වශයෙන් හානි සිදු විය. සමාජ විද්‍යාත්මක කෘතීන් ආරක්ෂිතව තබන ලද ප්‍රධාන ලේඛනාගාරයක් වූ මහ බැංකුවේ පුස්තකාලය ද ගින්නට හසු වී විනාශ විය.

ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීමේ වියදම ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 1,800 ක් ද, විනාශ වූ ලී බඩු සහ අනෙකුත් උපකරණවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 50 ක් පමණ ද වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

මෙම සිද්ධියෙන් පසු බැංකුව මුහුණ පෑ ක්ෂණික ප්‍රමුඛතාව වූයේ එහි කටයුතු යළි ආරම්භ කිරීමය. අංශ කිහිපයක් පිළිබඳව ක්ෂණිකව කටයුතු කිරීම අවශ්‍ය විය. ඊට බැංකු සේවකයන්ගේ සෞඛ්‍ය හා සුබසාධනය, චෙක්පත් නිෂ්කාශනය, ව්‍යවහාර මුදල් නිකුතුව, දේශීය හා ජාත්‍යන්තර ගෙවීම් පියවීම වැනි බැංකුවේ එදිනෙද කටයුතු යළි ආරම්භ කිරීම ඇතුළත් වූ අතර වඩාත් වැදගත් කාර්යය වූයේ මෙය තාවකාලික පසුබෑමක් බවත් බැංකුවේ කටයුතු ඉක්මණින් යථා තත්ත්වයට පත් කරන බවත් පිළිබඳව ජනතාව තුළ විශ්වාසය තහවුරු කිරීමය. බැංකුවේ බොහෝ දෙපාර්තමේන්තු රාජගිරියේ පිහිටි ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයෙහි නොපමාව ස්ථානගත කරනු ලැබිය. අනෙකුත් දෙපාර්තමේන්තු සඳහා විකල්ප ස්ථාන සොයා ගනු ලැබිය. සේවකයින් රාජකාරි සඳහා කැඳවනු ලැබූ අතර බැංකුවේ කටයුතු යළි ආරම්භ විය.

තුවාල ලැබූ සහ ඒ වන විටත් බෝම්බ පිපිරීමේ බලපෑමෙන් පීඩා විඳිමින් සිටි සේවකයින් විශාල පිරිසක් සේවය සඳහා වාර්තා කළහ. සේවා කටයුතුවලට සම්පූර්ණයෙන්ම බාධා ඇති වූයේ එක් දිනක් පමණක් වූ අතර පසු දිනයෙහි බැංකුවේ කටයුතු සුළු වශයෙන් ආරම්භ කරන ලදී. මුදල් සුරක්ෂිතාගාරය සහ බැංකුවේ ඉතා වැදගත් වාර්තා වලින් බොහෝමයක් නිරුපද්‍රිතව ඇති බව පැවසූ අධිපති තුමා බැංකුවේ ප්‍රධාන කටයුතු ඉතා ඉක්මනින් ආරම්භ කරන බවට මහජනතාවට සහතික විය.

පිපිරීමෙන් තුවාල ලැබූ මහ බැංකු සේවකයන්ගේ සහ ජීවිතක්ෂයට පත් වූ අයගේ පවුල්වල සාමාජිකයන්ගේ සුභසාධන කටයුතු කිරීමට ද නොපමාව කටයුතු කරන ලදී. මෙම සේවකයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ අවශ්‍යතාවයන් සොයා බැලීම සඳහා බැංකුවේ සේවකයන්ගෙන් සමන්විත කාර්ය බලකායක් පිහිටුවනලදී. අවශ්‍ය අවස්ථාවන්හිදී තුවාල ලැබූ සේවකයන්ට රෝහල් වලින් සහ සායන වලින් ඉහළම මට්ටමේ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හැකිවන පරිදි කාර්ය බලකාය මඟින් සතත කටයුතු සලසන ලද අතර විදේශ රෝහල්වලින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා කිහිපදෙනෙකුට මූල්‍යමය පහසුකම් සපයන ලදී. මරණයට පත් වූ සේවකයන්ගේ යැපෙන්නන්ට පමණක් නොව ස්ථිර හෝ අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ අයගේ යැපෙන්නන්ට ද ප්‍රතිලාභ සැපයීමේ වන්දි ක්‍රමයක් ද ක්‍රියාවට නංවනු ලැබිය.

බෝම්බ පිපිරීමෙන් ජීවිතක්ෂයට පත් වූ සේවකයන්ගෙන් යැපෙන්නන්ට, එම සේවකයන් ජීවත්ව සිටියේ නම් ඔවුන් විශ්‍රාම ගන්නා (උපකල්පිත) කාලය තෙක් ලබා ගත හැකිව තිබූ වේතන සහ ප්‍රතිලාභ ගෙවනු ලබන අතර ස්ථිර ආබාධිත තත්ත්වයට පත් වූ සේවකයන්ට ද ඔවුන් විශ්‍රාම ගන්නා වයස දක්වා බොහෝ දුරට ඒ හා සමාන ප්‍රතිලාභ ගෙවනු ලැබේ. විකල්පයක් වශයෙන් අවුරුදු 5 ක දළ වැටුපට සමාන එක්කළ දීමනාවක් ලබාගැනීමේ මනාපයක් ද දෙන ලදී. වෛද්‍ය මණ්ඩලයක් මඟින් නිර්දේශිත ආකාරයට, ඉපයීමේ ධාරිතාවය නැතිවීමේ ප්‍රතිශතය මත, අර්ධ ආබාධිත සේවකයන්ට වන්දි ගෙවන ලදී. බෝම්බ පිපිරීමේ බලපෑමට හසුවූ සේවකයන්ගේ සෞඛ්‍ය පහසුකම් සහ සුභසාධනය පිළිබඳව ද බැංකුව නොකඩවා කටයුතු කරගෙන යමින් සිටී.

බැංකුවේ තාවකාලික ප්‍රධාන කාර්යාලය ලෙස ග්‍රාමීය බැංකු කටයුතු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය යොදාගන්නා ලද්දේ මාස නමයක කාලයක් සඳහා පමණි. වෙනත් ස්ථානයකට පහසුවෙන් ගෙන යා හැකි ව තිබූ සමහර දෙපාර්තමේන්තු එසේ ප්‍රතිස්ථාන ගත කරන ලදී. එසේ වුව ද ඔක්තෝබර් මාසයේ අග භාගය දක්වා දෙපාර්තමේන්තු බොහෝමයක් ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයෙහි ම පවත්වා ගැනීමට සිදුවිය. දෙපාර්තමේන්තු බොහෝමයක අවශ්‍ය පමණ ඉඩ පහසුකම් නොතිබීම හේතුවෙන් ඇතැම් සේවකයින්ට කෘත්‍යලේඛණ ක්‍රමය මත සේවයට වාර්තා කිරීමට කටයුතු සලස්වන ලදී.

බෝම්බ පිපිරීමෙන් මුල් දින කිහිපය තුළ දී බැංකුව මුහුණ දුන් ප්‍රශ්න වඩා තීව්‍ර කිරීමට හේතු වූයේ පරිඝණක හා වෙනත් උපකරණ විනාශ වීම සහ මහ බැංකුවේ දත්ත පද්ධතිය පවත්වා ගැනීමට අවශ්‍ය වාර්තා අහිමි වීමය. කෙසේ වුව ද සේවකයින්ගේ කැපවීම හා දැඩි පරිශ්‍රමය හේතුවෙන් මෙයින් බොහෝමයක් ප්‍රශ්න නිරාකරණයකර ගැනීමට හැකි වූ අතර, බැංකුවේ කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට හැකිවිය.

දින කිහිපයක් තුළ දී ව්‍යවහාර මුදල් බැංකු කටයුතු සහ අර්ථ සාධක අරමුදල් වැනි බැංකුවේ ප්‍රධාන දෙපාර්තමේන්තු සම්පූර්ණයෙන් ක්‍රියාකාරිත්වයට පත්කරන ලදී. පිරික්සු ටෙලෙක්ස් පණිවිඩ තුළින් අන්තර් ජාතික බේරුම් කිරීම් වලංගු දිනයන්හි කරන ලදී. ස්විෆ්ට් සහ රොයිටර් ජාලය ද කඩිනමින් නැවත සම්බන්ධ කරන ලදී. බැංකුවේ සියළුම කටයුතු ඊළඟ මාස දෙක තුළ දී සම්පූර්ණ ක්‍රියාකාරිත්වයට පත් විය. මෙයට දේශීය හා අන්තර්ජාතික ගෙවීම් සහ බේරුම් කිරීම්, ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ ක්‍රියාවලිය, මුදල් සහ විදේශ විනිමය වෙළෙඳපොළ සහ රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධ බැංකුවේ කටයුතු ඇතුළත් විය. මෙම අංශයන්හි ක්‍රියාකාරීත්වය ඉතා ඉක්මනින් බෝම්බ පිපිරීමට පෙර පැවැති තත්ත්වයටම පත් කරන ලදී. අනෙකුත් සියළුම කටයුතු සාමාන්‍ය ආකාරයෙන් පවත්වාගෙන යන ලද අතර මාසික ශේෂ පත්‍රය සහ වාර්ෂික වාර්තාව වැනි බැංකුවේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයන් නියමිත පරිදි ප්‍රකාශයට පත් කරන ලදී.

මහ බැංකුවේ ප්‍රයත්නයට දේශීය සහ විදේශීය මූල්‍ය ප්‍රජාවගේ සහාය ලැබුණි. රාජ්‍ය බැංකු දෙක සහ ඇතැම් පෞද්ගලික වාණිජ බැංකු විසින් මුදල් නිකුත් කිරීම සහ අර්ථ සාධක අරමුදල් කටයුතු වැනි මහ බැංකුවේ එදිනෙද අත්‍යවශ්‍ය කටයුතු වලින් සමහරක් පවත්වාගෙන යාමට හැකිවන පරිදි පහසුකම් සපයන ලදී. මූල්‍ය ප්‍රජාවගේ දැඩි සහයෝගය වෙළෙඳපොලෙහි ස්ථාවරත්වය සහ විශ්වාසනීයත්වය තහවුරු කිරීමට උපකාරී විය.

1996 නොවැම්බර් මාසය තුළ දී මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයෙහි පිහිටි ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට ගෙන යන ලදී. ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයෙහි තාවකාලිකව ස්ථානගතව තිබූ මහ බැංකුවේ දෙපාර්තමේන්තු බොහෝමයක් ද ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණෙහි මහල් 10 ක් තුළ ප්‍රතිස්ථානගත කරන ලද අතර, දෙපාර්තමේන්තු කිහිපයක් තවදුරටත් ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ සිට කටයුතු කළහ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

පටුව

බැංකුවේ ගිණුම් හා කටයුතු	(I)
ව්‍යවහාර මුදල් නිකුතුව	(V)
බැංකු සංවර්ධන	(VI)
බැංකු අධීක්ෂණය	(VI)
බැංකු නොවන මූල්‍ය ආයතන	(VIII)
සංවර්ධන මුදල්	(X)
ග්‍රාමීය ණය	(XVIII)
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු	(XXI)
ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය	(XXIII)
සේවක අර්ථසාධක අරමුදල	(XXIII)
විනිමය පාලන	(XXV)
රාජ්‍ය ණය	(XXVI)
ප්‍රාදේශීය කාර්යාල	(XXX)
ලේකම් දෙපාර්තමේන්තුව	(XXXI)
ප්‍රවෘත්ති සහ ප්‍රකාශණ	(XXXI)
පර්යේෂන කටයුතු	(XXXII)
සමීක්ෂණ හා දත්ත එක් රැස් කිරීම	(XXXII)
දත්ත සැකසුම්	(XXXIII)
පුහුණු කටයුතු	(XXXIV)
කළමනාකාරීත්ව විගණන	(XXXIV)
පරිශ්‍ර	(XXXIV)
සුභසාධනය	(XXXV)
ආරක්ෂක සේවා	(XXXV)
කාර්ය මණ්ඩල පුවත්	(XXXVI)

මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

ගිණුම් සහ බැංකු කටයුතු

1996 ජනවාරි 31 දින බැංකු පරිශ්‍රයෙහි සිදුවූ බෝම්බ පිපිරීමෙන් බැංකු කටයුතු දෙපාර්තමේන්තුවට ඉමහත් අලාභයක් සිදුවූ නමුත්, ඉතා කඩිනමින් දින දෙක තුනක් ඇතුළත, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ආරම්භ කිරීමට හැකි විය. විදේශ විනිමය කටයුතු අංශය පසුදා සිටම තම කාර්යයන් ආරම්භ කළ අතර, කිසිදු ගෙවීම් අතපසු කිරීමකින් තොරව විදේශ රාජ්‍ය ණය ආපසු ගෙවීම්, විදේශ විනිමය ගනුදෙනු සහ ආයෝජන හා සම්බන්ධ ගෙවීම් නියමිත දිනවලදීම සිදු කරන ලදී. ජංගම ගිණුම් අංශය, කොළඹ කොටුව පිහිටි ලංකා බැංකු ප්‍රධාන ගොඩනැගිල්ලෙහි තාවකාලික කාර්යාලයක සිට කටයුතු මෙහෙය වූ අතර, අනෙක් අංශ රාජගිරියෙහි පිහිටි ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයෙහි සිට කටයුතු ආරම්භ කළහ. තවද බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ තිබී සොයා ගත් ස්ථිර විද්‍යුත් පරිගණක දත්ත පදනම් කර ගනිමින්, 1996 ජනවාරි මස 25 දිනට ශේෂ පත්‍රයක් සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී. බැංකුවේ ප්‍රධාන ලෙජරයෙහි කටයුතු පවත්වාගෙන යන ලද මහා පරිමාණ පරිගණක යන්ත්‍රය සම්පූර්ණයෙන්ම විනාශ වූ හෙයින්, කුඩා පරිගණක යන්ත්‍ර භාවිතා කර ගෙන මෙම දෙපාර්තමේන්තුවේදී ගොඩනගන ලද මෘදුකාංග ප්‍රකමන මගින් බැංකුවේ ලෙජර යාවත්කාලීන කර ගන්නා ලද අතර එමගින් මාසික ශේෂ පත්‍ර නියමිත කාලයට එළිදැක්වීමට හැකි විය.

1996 වර්ෂය අවසානය වන විට මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 181,564ක් වූ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 4.6 වර්ධනයක් ලෙස වාර්තා විය. 1996 දෙසැම්බර් මස 31 දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය හා 1996 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම II-I සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

වත්කම් අංශයෙහි ජාත්‍යන්තර සංචිත රුපියල් දශලක්ෂ 105,647 සිට රුපියල් දශ ලක්ෂ 103,080 දක්වා සියයට 2.4 කින් අඩුවිය. ඉකුත් වර්ෂයේදී මෙන්ම ජාත්‍යන්තර සංචිත විශාලතම වත්කම් කාණ්ඩය වූ අතර මුළු වත්කම්වලට එහි දායකත්වය 1995 වර්ෂාවසානයේ සියයට 60.9 හා සසඳන විට 1996 වර්ෂයේදී සියයට 56.8 ක් විය. මේ අතර දේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 39,950 සිට රුපියල් දශ ලක්ෂ 47,965 දක්වා සියයට 20.1 න් ඉහළ ගියේය.

දේශීය වත්කම් අතර රජයට දුන් ණය සහ අත්තිකාරම් සහ රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් පිළිවෙලින් සියයට 16.6 කින් හා සියයට 36.5 කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් ශුද්ධ ආපසු ගෙවීම් සහ අක්‍රිය ණය සඳහා වූ ප්‍රතිපාදන හේතු කොට ගෙන වාණිජ බැංකු හා අනිකුත් ණය දෙන ආයතන වලට දෙන ලද මධ්‍යම හා දිගු කාලීන ණය පහසුකම් සියයට 19.7 කින් පහළ ගියේය. එමෙන්ම වාණිජ බැංකු වලට දෙන ලද කෙටි කාලීන අත්තිකාරම්ද 1996 වර්ෂයේදී සියයට 14.9 කින් පහත වැටුණි.

වගකීම් අංශයෙහි, සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 46,685 සිට රුපියල් දශ ලක්ෂ 49,480 දක්වා සියයට 6.0 කින් ඉහළ ගියේය. රුපියල් දශ ලක්ෂ 73,320 සිට රුපියල් දශ ලක්ෂ 74,758 දක්වා සියයට 2 කින් ඉහළ ගිය තැන්පතු, මුළු වගකීම් වලින් සියයට 41.2 ක් වෙමින් වගකීම් වල විශාලතම කාණ්ඩය විය. මෙම කාණ්ඩය තුළ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය යටතේ තැන්පතු වගකීම් වෙනුවෙන් වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු, ප්‍රධාන වශයෙන් ඒවායේ රුපියල් තැන්පතු වගකීම් ඉහළ යාම හේතුකොට ගෙන සියයට 12.7 කින් වැඩි විය. ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය සහ විදේශීය බැංකු ආයතන වල තැන්පතු සියයට 6 කින් පහත වැටුණි. බැංකුවේ වත්කම් හා වගකීම් වල ප්‍රධාන අංශ සැසඳීමක් II-2 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

1995 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 22,502.4 හා සසඳන කල 1996 වර්ෂය සඳහා බැංකුවේ මුළු දළ ආදායම රුපියල් දශ ලක්ෂ 18,711.3 ක් වූ අතර පෙර වර්ෂයේ රුපියල් දශලකෂ 20,807.4 හා සසඳන කල 1996 වර්ෂයේ මුළු දළ වියදම රුපියල් දශලකෂ 17,211.3 විය. බැංකුවේ ආදායමෙන් සියයට 70 ක් පමණ විදේශීය සංචිත ආයෝජනයෙන් ජනනය වූ අතර රට තුල වූ ගණුදෙනු වලින් උපයන ලද පොලී ආදායමෙහි දායකත්වය සියයට 14.5 ක් පමණ විය. වියදම් සංචිත ගිණුම් සඳහා වෙන් කිරීම් සහ ක්ෂය සඳහා වෙන් කිරීම් හා අනෙකුත් අයකිරීම් වෙනුවෙන් ප්‍රතිපාදනද වෙන් කළ පසු ශේෂ වූ ශුද්ධ ලාභය වන රුපියල් දශ ලක්ෂ 1,500 මුදල් නීති පනතේ 39 (ඈ) වගන්තිය අනුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සඳහා රජයට ගෙවීමට වෙන් කරන ලදී.

ගණකාධිකරණ ප්‍රතිපත්ති

පොදු

ඓතිහාසික පිරිවැය පදනම මත හා පොදුවේ පිළිගැණුනු ගණකාධිකරණ මූලධර්මයන්ට අනුකූලව මේ සමග ඇති ශේෂ පත්‍රය හා ලාභාලාභ ගිණුම පිළියෙල කර ඇත.

විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

විදේශීය ව්‍යවහාර මුදල් වලින් පවත්වා ගෙන යනු ලබන වත්කම් හා වගකීම් ශේෂ පත්‍ර දිනට බලපැවැත්වුනු මධ්‍ය - විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය කර ඇත.

ආයෝජන

සියළුම ආයෝජන පිරිවැය අනුව ගණනය කර ඇත.

අත්තිකාරම්

ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති අත්තිකාරම්, මුල්‍ය සමාගම්වලින් අය විය යුතුව ඇති අක්‍රිය ණය වෙනුවෙන් ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසුව වන ශුද්ධ ශේෂය වේ.

ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් දක්වා ඇත්තේ ඒවායේ පිරිවැය වටිනාකමෙන් ක්ෂය කිරීම් අඩු කිරීමෙනි. පහත දැක්වෙන අනුපාතිකයනට අනුකූලව හීනවන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය කිරීම් ගිණුම්ගත කර ඇත.

අයිතමය	ප්‍රතිශතය (සියයට)
ගොඩනැගිලි	2
සවි කිරීම් සහ උපකරණ	10
කාර්යාලීය ලී බඩු සහ උපකරණ	10
මෝටර් රථ	10
කුඩා පරිගණක.	25

II-1 සංඛ්‍යා සටහන
ශ්‍රී ලංකා මහ බැංකුව
1996 දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය

රුපියල්

බැරකම්

1995 දෙසැම්බර් මස 31 දින			1996 දෙසැම්බර් මස 31 දින	
		ප්‍රාග්ධන ගිණුම		
1,50,00,000		ප්‍රාග්ධනය	1,50,00,000	
98,50,00,000	100,00,00,000	අතිරික්තය	98,50,00,000	100,00,00,000
		සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්		
4,488,61,01,205		නෝට්ටු	4,756,69,04,953	
179,84,01,234	4,668,45,02,439	කාසි	191,30,84,940	4,947,99,89,893
		තැන්පතු		
303,93,94,202		රජය	350,95,84,531	
4,88,79,581		රාජ්‍ය නියෝජිතව හා ආයතන	12,16,61,615	
3,185,26,85,006		වෙළඳ බැංකු	3,590,69,62,913	
3, 674,25,36,986		ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන	3,454,62,67,006	
7,39,368		භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 4,34,79,700/- හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල	10,25,595	
163,54,64,646	7,331,96,99,789	අනෙකුත්	67,27,58,388	7,475,82,60,048
	492,50,00,000	මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදල		492,50,00,000
	56,01,90,000	ප්‍රාග්ධන දායක දීමනා ගිණුම්		56,01,57,500
	4,701,61,55,976	අනෙකුත් වගකීම් හා ගිණුම්		5,084,02,66,330
	17,350,55,48,204			18,156,36,73,771

වත්කම්

1995 දෙසැම්බර් මස 31 දින			1996 දෙසැම්බර් මස 31 දින	
		ජාත්‍යන්තර සංචිතය		
3,968,19,17,863		පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂ	3,507,86,17,381	
6,591,63,11,198*		විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත්	6,789,60,66,443*	
4,86,29,262	10,564,68,58,323	විශේෂ ආපසු ගැනීම් හිමිකම්	10,55,85,513	10,308,02,69,337
		දේශීය වත්කම්		
		ණය සහ අත්තිකාරම්		
2,405,30,99,947		රජයට	2,804,57,99,947	
275,01,93,526		අනෙකුත් අයට-මධ්‍යම හා දීර්ඝ කාලීන	220,70,66,200**	
6,13,26,176		කෙටි කාලීන	5,21,62,093	
12,52,51,89,273		රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත්	1,710,02,92,629	
56,01,90,000	3,994,99,98,922	මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දායක දීමනා	56,01,57,500	4,796,54,78,369
	2,790,86,90,959	අනෙකුත් වත්කම් හා ගිණුම්		3,051,79,26,065
	17,350,55,48,204			18,156,36,73,771

*1964 පෙබරවාරි මස 01 දින රු. 55,27,675/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 දින රු. 57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697/- ක් සහ රු. 34,340/- ක් විය.)

**රුපියල් දශලක්ෂ 100.0 ක විශේෂ ණය මුදලෙන් පියවා නොමැති ප්‍රමාණය ඇතුළත් වෙයි. පියවිය යුතුව ඇති ණය ප්‍රමාණයෙන්, අය කරගත නොහැකි ණය සඳහා රු. 125,25,96,137/- ක ප්‍රතිපාදන අඩු කර ඇත.

සටහන : 1996 ජනවාරි 31 වැනි දින බැංකු පරිශ්‍රයට සිදු වූ අලාභය හේතුකොට ගෙන බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ තිබී සොයාගත් ස්ථිර විද්‍යුත් පරිගණක දත්ත පදනම් කරගෙන 1996 ජනවාරි 25 වැනි දිනට සකස් කළ ශේෂ පත්‍රයේ දැක්වූ ශේෂයන් ද ඉන් පසුව සිදු වූ ගනුදෙනු ද පදනම් කොට ගනිමින් 1996 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පත්‍රය සකස් කරන ලදී. 1996 ජනවාරි 26 වැනි දින සිට 1996 පෙබරවාරි 01 වැනි දින දක්වා සිදු වූ හඳුනා නොගත් ගනුදෙනුවල වටිනාකම අවිනිශ්චිත ගිණුම් යටතේ දක්වා ඇත.

1996 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභාලාභ ගිණුම

රුපියල්

1995		1996	1995		1996
2,080,24,18,205	සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂය කිරීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන් කිරීම්	1,721,12,91,355	2,250,24,18,205	පොලී ආදිය	1,871,12,91,355
	වර්ෂයේ ශුද්ධ ලාභය				
170,00,00,000	මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට	150,00,00,000			
2,250,24,18,205		1,871,12,91,355	2,250,24,18,205		1,87112,91,355

ඒ. එස්. ජයවර්ධන
අධිපති

එම්. බී. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී

විගණකාධිපති සටහන -

ශ්‍රී ලංකා මහ බැංකුවේ 1996 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරන මුදල් නීති පනතේ 13 (1) වගන්තිය සහ 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 42 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

එකී මුදල් නීති පනතේ 42 (2) වගන්තිය ප්‍රකාර මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේ දී ඉදිරිපත් කරනු ඇත.

1997 අප්‍රේල් මස 17 දින,
කොළඹ 7.
විගණකාධිපති දෙපාර්තමේන්තුවේදිය.

එස්. එම්. සබීර්
විගණකාධිපති

11.2 සංඛ්‍යා සටහන

1995 සහ 1996 මුදල් වර්ෂවල අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල වූ ප්‍රධාන අයිතමයන් සැසඳීම

බැරකම්					වත්කම්				
අයිතමය	1995 අවසානයේදී		1996 අවසානයේදී		අයිතමය	1995 අවසානයේදී		1996 අවසානයේදී	
	රුපියල් දශලක්ෂ	%	රුපියල් දශලක්ෂ	%		රුපියල් දශලක්ෂ	%	රුපියල් දශලක්ෂ	%
ප්‍රාග්ධනය සහ අතිරික්තය	1,000	0.6	1,000	0.6	ජාත්‍යන්තර සංචිතය	105,647	60.9	103,080	56.8
සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල්	46,685	26.9	49,480	27.2	දේශීය වත්කම්	39,950	23.0	47,966	26.4
තැන්පතු	73,320	42.3	74,758	41.2	අනෙකුත් වත්කම් *	27,909	16.1	30,518	16.8
මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල	4,925	2.8	4,925	2.7	නිකුත් කරන ලද ඇපකර වෙනුවෙන් තැන්පත්කරුවන්ගේ වගකීම්	16,255	9.4	14,152	7.8
ප්‍රාග්ධන දායක දීමනා ගිණුම	560	0.3	560	0.3	වෙළඳ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ගිණුම	3040	1.8	3,669	2.0
අනෙකුත් බැරකම් *	47,016	27.1	50,841	28.0	ගැලපීම් ගිණුම (ලැබිය යුතු මුදල්)	2,146	1.2	3,022	1.7
නිකුත් කරන ලද ඇපකර	16,254	9.4	14,152	7.8	එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂ	646	0.4	2,419	1.3
පාලන ගිණුම් සංචිත	11,623	6.7	14,829	8.2	අනෙකුත්	5,822	3.3	7,256	4.0
විශේෂ හැර ගැනීම් හිමිකම් ලැබීම	5,547	3.2	5,572	3.1					
ජාත්‍යන්තර සංචිත ප්‍රත්‍යා ගණනය ගිණුම	2,583	1.5	3,957	2.2					
ලාභාලාභ ගිණුම	4,444	2.6	4,461	2.5					
ආසියානු නිෂ්කාශන සංගම් ගිණුම්	1,511	0.9	4,634	2.6					
අනෙකුත්	5,054	2.8	3236	1.6					
එකතුව	173,506	100	181,564	100	එකතුව	173,506	100.0	181,564	100.0

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වර්ෂය තුළදී මිළදී ගන්නා ලද ස්ථාවර වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය සඳහා ප්‍රතිපාදනය කරනු ලබන අතර, වර්ෂය තුළදී ස්ථාවර වත්කම් විකුණනු ලබන හෝ ඉවත් කරනු ලබන අවස්ථාවන්හි එකී වත්කම් සඳහා එම වර්ෂය වෙනුවෙන් ක්ෂය සඳහා ප්‍රතිපාදනයන් සලසා නැත.

තොග

ලිපි ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා අයිතම වෙනුවෙන් වර්ෂය තුළදී දරනු ලැබූ සම්පූර්ණ පිරිවැය ලාභාලාභ ගිණුමට හර කර ඇති අතර, වර්ෂය අවසානයේ ඇති තොග සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර නොමැත.

අයහාර ගණනය

මුදල් පදනමක් මත ගණනය කර ඇති අක්‍රිය ණය වෙනුවෙන් වූ පොලී හැරුණු විට අනිකුත් පොලී හා ආදායම් උපචිත පදනමක් මත පොත්වල සටහන් කර ඇත.

ශුද්ධ ලාභය

ලාභාලාභ ගිණුමෙහි පෙන්වා ඇති ශුද්ධ ලාභය සියලුම වියදම් හර කිරීමෙන් හා පහත සඳහන් අයිතම සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් අනතුරුව වේ.

I. අක්‍රිය ණය සඳහා වෙන්කිරීම්
II. ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කිරීම්
III. අනිකුත් අවශ්‍ය වෙන්කිරීම් සහ මුදල් නීති පනතේ 38 වන වගන්තිය අනුව සංචිත සඳහා වෙන් කිරීම්.

මහ බැංකු පොලී අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 17 ක් වශයෙන් නොවෙනස්ව පැවැතිණි.

කෙටි කාලීන ණය

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය හා අපනයන ප්‍රතිමූල්‍ය ණය

යෝජනා ක්‍රමය යටතේ වාණිජ බැංකු වෙත ලබා දුන් ප්‍රතිමූල්‍ය ණය පිළිවෙලින් 1994 අප්‍රේල් සහ මැයි මාසවල සිට නවතා දමන ලදී. එසේ වුවද, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය නවතා දැමීමට පෙර වාණිජ බැංකු විසින් එම ක්‍රමය යටතේ ගොවීන්ට දුන් වක්‍රීය ණය ප්‍රමාණය මත ප්‍රතිමූල්‍ය දීර්ඝ කිරීමේ පහසුකම් ප්‍රදානය කරන ලදී. මෙම පහසුකම යටතේ, 1995 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 61.3 ක් වූ නොපියවා පැවැති ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය 1996 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 52.2 ක් විය.

මැදි හා දිගු කාලීන ණය

1996 වර්ෂය තුලදී මැදි හා දිගු කාලීන ණය අරමුදල රුපියල් දශ ලක්ෂ 4,925 වශයෙන් නොවෙනස්ව පැවැතිණ. මුදා හරින ලද ණය ප්‍රමාණය අඩු කළ පසු වර්ෂය තුලදී ආපසු ගෙවන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 168.5 ක් විය.

මූල්‍ය සමාගම් සඳහා පහසුකම්

1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පනතේ 20 (4) (අ) සහ 21(1) වගන්ති ප්‍රකාර දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම් සඳහා ණය පහසුකම් සැලසීම මහ බැංකුව විසින් නොකඩවා කර ගෙන යන ලදී. 1996 දී මෙම පහසුකම් යටතේ මුදා හරින ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 104 ක් වූ අතර (බොල්ණය ප්‍රතිපාදන වලට පෙර) 1996 වර්ෂය අවසාන වන විට නොපියවා පැවැති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,573 ක් විය.

සංචිත අවශ්‍යතා

වාණිජ බැංකුවල තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව වර්ෂය මුළුල්ලේම නොවෙනස්ව පැවැතිණ. වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් සඳහා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සියයට 15 ක් වූ අතර වාණිජ බැංකු ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කර ඇති විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම් වෙනුවෙන් සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 5 ක් විය. වාණිජ බැංකුවල අනිකුත් විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු වගකීම් සඳහා වන සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 15 ක් විය.

විවෘත වෙළඳපොළ කටයුතු

ද්විතියක භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ

ද්විතියක වෙළඳපොළේ භාණ්ඩාගාර බිල්පත් අලෙවිය 1995 දී රුපියල් බිලියන 17 සිට 1996 වර්ෂයේ රුපියල් බිලියන 16.5 ක් දක්වා මඳකින් අඩුවිය. එකී කාලපරිච්ඡේදය තුළ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමද රුපියල් බිලියන 35.3 සිට රුපියල් බිලියන 17 දක්වා අඩු විය. ද්විතියක වෙළඳපොළෙහි අලෙවිය පහළ මට්ටමක පැවැතීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කෙටි කාලීන ආයෝජන, භාණ්ඩාගාර බිල්පත් ද්විතියක වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිළදී ගැනීම් වෙළඳපොළට මාරු වීමය. 1996 දී භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම විශාල වශයෙන් අඩු වූයේ වෙළඳපොළෙහි පැවැති අධි ද්‍රවශීලතාවයෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

පසුගිය වර්ෂය තුළ ද්විතියික වෙළඳපොලෙහි ආයෝජනය කළ ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් වලට අදාල ඵලදායිතා අනුපාතික වර්ෂයකට සියයට 10.98 ක් සහ 19.02 අතර පැවැතුණි.

භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රතිමිලදී ගැනීමේ වෙළඳපොළ

1995 වර්ෂය හා සසඳන කල සියයට සියයක වාර්තා ගත වර්ධනයක් පෙන්නුම් කරමින් 1996 ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ අලෙවි කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 403.8 ක් විය. වර්ෂය මුලදී සියයට 16.5 ක් ව පැවැති එක්දින ප්‍රති මිළදී ගැනීම් ඵලදායිතා අනුපාතිකය බැංකු ක්‍රමයේ පැවැති අධි ද්‍රවශීලතා මට්ටම නිරූපනය කරමින් අප්‍රේල් අග වන විට සියයට 9.5 දක්වා ක්‍රමයෙන් අඩු විය. කෙසේ වුවද, රුපියල් ද්‍රවශීලතාව පිළිබඳ දැඩි පාලනයක් සමග දෙසැම්බර් අග වන විට එක්දින ප්‍රති මිළදීගැනීම් ඵලදායිතා අනුපාතිකය සියයට 12.75 දක්වා වැඩි කරනු ලැබිය.

භාණ්ඩාගාර බිල්පත් ප්‍රති විකුණුම් ගිවිසුම්

වෙළඳපලට ද්‍රවශීලතාව ගලා යැම අරමුණු කොටගෙන 1995 නොවැම්බර් මස හඳුන්වා දුන් ප්‍රති විකුණුම් පහසුකම 1996 වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක නොවිය. ඉහළ රුපියල් ද්‍රවශීලතා තත්ත්වයක් වෙළඳපොළ තුළ වූ බැවින් වසරේ ඉතිරි කාළය තුළ ප්‍රති විකුණුම් ක්‍රියාකාරිත්වයට මහ බැංකුවේ මැදහත් වීම අවශ්‍ය නොවිය.

මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර සහ කරුණාසහගත ගෙවීම්

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධව රජය වෙනුවෙන් ගෙවන ලද මුළු සහන ගෙවීම් 1995 දී රුපියල් 323,232 හා සසඳන කළ 1996 දී රුපියල් 125,953 ක් විය. 1995 රුපියල් 39,600 ක් වූ කරුණාසහගත ගෙවීම් ප්‍රමාණය හා සසඳන කල එය 1996 දී රුපියල් 7,475 ක් විය.

අපනයන කරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන

1995 දී ගෙවූ රුපියල් දශ ලක්ෂ 922.9 හා සසඳා බලන කල, රජය වෙනුවෙන් අපනයනකරුවන්ට ගෙවන ලද තීරුබදු ප්‍රතිදාන සඳහා 1996 දී මහ බැංකුව වාණිජ බැංකු වෙනුවෙන් ප්‍රතිපූර්ණය කරන ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1042.7 ක් විය.

විදේශ විනිමය කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රුපියලට සාපෙක්ෂව ඇ.එ.ජ. ඩොලරයට සම්බන්ධ ඉදිරි විනිමය මිළට ගැනීම් හා එතැන් ගැණුම් සහ විකුණුම් මගින් විදේශ විනිමය ගණුදෙනු කටයුතු දිගටම කරගෙන යන ලදී. එමෙන්ම බැංකුව විසින් සිය විදේශ විනිමය සංචිත ජාත්‍යන්තර මුදල් සහ ප්‍රාග්ධන වෙළඳපොළවල ආයෝජනය කිරීමද තව දුරටත් කරගෙන යන ලදී.

1996 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු වලින් මිළදී ගන්නා ලද විදේශ මුදල් වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 5,222 ක් වූ අතර, වාණිජ බැංකුවලට අලෙවි කරන ලද විදේශ මුදල් වල වටිනාකම

රුපියල් දශ ලක්ෂ 10,881 ක් විය. 1995 වර්ෂයේදී එකී මිළදී ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 19,187 ක් වූ අතර, විකුණුම් රුපියල් දශ ලක්ෂ 439 ක් විය.

11.3 සංඛ්‍යා සටහන
විදේශීය විනිමය ගනුදෙනු 1996
(රුපියල් දශලක්ෂ)

මාසය	එතැන් මිලදී ගැනුම්	එතැන් විකුණුම්	ඉදිරි විනිමය ගැනුම්
ජනවාරි	1,068	-	-
පෙබරවාරි	2,918	-	-
මාර්තු	880	-	-
අප්‍රේල්	-	-	
මැයි	-	4,309	-
ජූනි	-	4,826	-
ජූලි	245	-	-
අගෝස්තු	111	-	-
සැප්තැම්බර්	-	-	-
ඔක්තෝබර්	-	888	-
නොවැම්බර්	-	858	-
දෙසැම්බර්	-	-	-
එකතුව	**5,222**	**10,881**	**-**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආසියානු නිෂ්කාශණ සංගමය

1996 ජනවාරි 01 වැනි දින සිට ආසියානු නිෂ්කාශණ සංගමයේ (ආ.නි.ස.) සාමාජික රටවල් අතර ගණුදෙනුවලට අදාළ නව මූල්‍ය ක්‍රමයක් ක්‍රියාත්මක විය. නව ක්‍රියා පිළිවෙල යටතේ ආ.නි.ස. සාමාජික රටවල් අතර සියළුම ගණුදෙනු ඇමෙරිකානු ඩොලර් වලින් ගිණුම්ගත වේ. ආසියානු නිෂ්කාශණ සංගමයේ මහ ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන සාමාජික රටවල් ගණුදෙනු වලට අදාළ ගිණුම් ආසියානු මූල්‍ය ඒකකය නම් වූ පොදු ඒකකයකින් ගිණුම් ගත වන අතර ආසියානු මුදල් ඒකකයක අගය ඇමෙරිකානු ඩොලරයකට සමාන වේ. මේ යටතේ සාමාජික රටවල අදාළ බැංකු සමග නොස්ට්‍රෝ (NOSTRO) ගිණුම් විවෘතකිරීමට වාණිජ බැංකු වලට බලය පවරනු ලැබේ. සාමාජික මහ බැංකුවල මැදිහත්වීම එම ගිණුම්වලට අදාළ අතිරික්ත අරමුදල් වල ලැබීම්, ගෙවීම් හා ශේෂ තුලනය කර ගැනීම යන කාර්යයන්ට සීමා වේ. සාමාජික රටවල් අතර ශුද්ධ ගනුදෙනු බේරුම් කිරීම මාස දෙකකට වරක් ප්‍රබල මුදල් භාවිතයෙන් දිගටම සිදු කෙරේ.

පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 37,030 හා සසඳන කල 1996 වර්ෂයේදී ආ.නි.ස. හරහා සිදු වූ ගණුදෙනු වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 33,828 ක් විය. 1995 රුපියල් දශ ලක්ෂ 18,028 හා සසඳන කල 1996 වර්ෂ තුළ විදේශීය මුදලින් නිරවුල් කළ වටිනාකම රුපියල් දශ ලක්ෂ 28,271 ක් විය. පසුගිය වසර තුල ආසියානු නිශ්කාෂණ සංගමය මගින් සලසා තිබූ හුවමාරු (Swap) පහසුකම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ දායක වීම රුපියල් දශ ලක්ෂ 1,319 ක් විය.

අනිවාර්ය ඉතිරි කිරීමේ අරමුදල

1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරි කිරීමේ පනත හා 1972 අංක 15 දරණ ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීමේ නීතිය යටතේ එකතු කරන ලද මුදල් භාරකත්වය දැරීම හා රජය වෙනුවෙන් අරමුදල පරිපාලනය කිරීම මහ බැංකුව විසින් දිගටම කරගෙන යන ලදී. විමර්ශනයට ලක්වන කාලපරිච්ඡේදය තුළ ගණුදෙනු කිසිවක් සිදු නොවීය.

රාජ්‍ය ගිණුම්

රජයේ බැංකුව වශයෙන් මහ බැංකුව රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය නියෝජ්‍යත්ව ආයතන හා සමහර ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ ගිණුම් දිගටම පවත්වා ගෙන යන ලදී. 1996 දෙසැම්බර් අග වන විට ක්‍රියාත්මකව තිබූ ගිණුම් සංඛ්‍යාව පසුගිය වසරේ මෙන් 164 ක්ව පැවතුණි.

විදේශීය මූල්‍ය

සමාලෝචිත වර්ෂය තුළදී මහ බැංකුව විසින් රජය වෙනුවෙන් විවිධ විදේශ ණය සහ ප්‍රදාන යටතේ මුදා හරින ලද ණය මුදල් ලබා ගැනීම විදේශීය ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම් තවදුරටත් කරගෙන යන ලදී.

ව්‍යවහාර මුදල් නිකුතුව

ශ්‍රී ලංකා මහ බැංකුව, ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ එකම අධිකාරය වශයෙන්, දේශීය ගණුදෙනු සඳහා අවශ්‍ය, නීතියෙන් වලංගු ව්‍යවහාර මුදල් නිකුත්කිරීමේ කටයුතුවල 1996 වර්ෂය තුළදී ද තවදුරටත් නිරත විය. සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් ප්‍රමාණය, 1995 වර්ෂය අවසානයට පැවැති රුපියල් දශ ලක්ෂ 46,685 සමග සසඳන විට 1996 වර්ෂය අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 49,480 දක්වා වැඩිවිය.

1996 ජනවාරි මස 31 වැනි දින මහ බැංකු ගොඩනැගිල්ල ඉදිරියේ වූ බෝම්බ ප්‍රහාරයෙන් පසු, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වහාම, කොළඹ 10 පිහිටි මහජන බැංකුවේ වැව්තෙර ශාඛාවෙහි සහ කොළඹ කොටුවේ පිහිටි ලංකා බැංකු මූලස්ථාන ශාඛාවෙහි ව්‍යවහාර මුදල් නිකුත්කිරීමේ කවුළු දෙකක් විවෘත කර මහජනයා වෙත ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ කවුළු දෙකක් විවෘත කර මහජනයා වෙත ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

ව්‍යවහාර මුදල් නෝට්ටුවල ඇති සුරක්ෂිත භාවය නොකඩවා වැඩිදියුණු කිරීමේ මහ බැංකුවේ ප්‍රතිපත්තිය අනුව යමින්, මෑතදී නිකුත් කරන ලද මුදල් නෝට්ටු වලට වැඩිමනත් ආරක්ෂිත ලක්ෂණ දෙකක් එකතු කරන ලදී. මෙම නව මුදල් නෝට්ටු 1996 සැප්තැම්බර් මාසයේදී සංසරණය සඳහා නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් වැදගත් සිද්ධීන් අනුස්මරණය සඳහා විශේෂ කාසි නිකුත් කරයි. 1996 වර්ෂයේදී, එක්සත් ජාතීන්ගේ සංවිධානයට වසර 50 ක් පිරීම නිමිති කොටගෙන රුපියල් 5/-ක වටිනාකමින් යුත් සාමාන්‍ය සංසරණය සඳහා යෙදෙන කාසියක් නිකුත් කරන ලදී. කාසි එකතු කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා කැටපතක ඔපය ගෙනදෙන පරිදි මනා නිමාවකින් යුතුව ටංකනය කරන ලද කාසි සීමාසහිත ප්‍රමාණයක්ද නිකුත් කරන ලදී. එකසත් ජාතීන්ගේ ළමා අරමුදලට වසර 50 ක් පිරීම නිමිති කොටගෙන රු.1/- ක වටිනාකමකින් යුත් සමරු කාසියක් නිකුත් කිරීමටද අවශ්‍ය පියවර ගන්නා ලදී.

මහ බැංකුව විසින් රුපියල, ශත 50 සහ ශත 25 යන කාසිවල ලෝහ සංයුතිය කලින් පැවැති තඹ මිශ්‍රිත නිකල් වෙනුවට නිකල් ආලේපිත ලෝහමය කාසි වශයෙන් වෙනස් කරන ලදී. එසේ වී නමුදු, එම කාසිවල ස්වරූපය, විශ්කම්භය සහ බර පෙරසේම පවත්වා ගන්නා ලදී. නව කාසි, දැනට සංසරණයේ පවත්නා කාසිවලට වඩා සුළු වශයෙන් ඝනකමින් වැඩි (මි.මි. 0.2) නමුත් අනෙක් සෑම අංගයකින්ම දැනට සංසරණයේ පවත්නා කාසිවලට අංගසම වේ. ලෝහ සංයුතිය වෙනස් කරන ලද්දේ එයින් සැලකිය යුතු ප්‍රමාණයක පිරිවැය වාසියක් ලැබෙන නිසා ය. නිකල් ආලේපිත ශත 25 වටිනාකමෙන් යුතු නව කාසි, 1996 නොවැම්බර් මාසයේදී සංසරණය සඳහා නිකුත් කරන ලදී.

බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුව

බැංකු ක්‍රමයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, වාණිජ බැංකු, වාණිජ බැංකුවල ශාඛා හා විශේෂිත බැංකු පිහිටුවීම සම්බන්ධයෙන් බැංකු පනතේ විධිවිධාන ක්‍රියාවට නැංවීම, හා මූල්‍ය උපකරණ හඳුන්වා දීම සඳහා වන යෝජනා ඇගයීමද බැංකු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට ඇතුලත් වේ. තවද, මෙම දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු අධීක්ෂණය කරන අතර, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට අදාල ප්‍රතිපත්ති සම්පාදනයෙහිද නිරත වෙයි. එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ ඒවායේ කටයුතු අධීක්ෂණයද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

1996 වර්ෂය අවසානයේදී පැවැති වාණිජ බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ විශේෂිත බැංකු සම්බන්ධ තොරතුරු II-4 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. සොසයිටි ජෙනරල් නම් වූ විදේශ බැංකුවෙහි ශාඛාවක් මෙරට පිහිටුවීම සඳහා බලපත්‍රයක් 1996 දෙසැම්බර් මාසයේදී නිකුත් කරන ලදී. (මෙම බැංකුව 1997 මාර්තු මාසයේදී සිය ව්‍යාපාරික කටයුතු ආරම්භ කළේය.) 1996 වර්ෂය අවසානයේදී ඇතිවූ තවත් සිදුවීමක් නම් ඉන්දු සුවස් බැංකුවේ කොළඹ ශාඛාවේ ව්‍යාපාරික කටයුතු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් පවරා ගැනීමයි. වාණිජ බැංකු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ විශේෂිත බැංකු සංඛ්‍යාව, වාණිජ බැංකු 27 කින් (දේශීය බැංකු 8 ක් සහ විදේශ බැංකු 19 ක්) ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 17 කින් සහ විශේෂිත බැංකු 4 කින් සමන්විත විය.

බැංකු ශාඛා ව්‍යාප්තිය

1996 දී නව වාණිජ බැංකු ශාඛා 152 ක් විවෘත කිරීම සඳහා අනුමැතිය දෙනු ලැබිය. ලංකා බැංකුවෙහි හසලක ශාඛාව මහියංගනය ශාඛාව සමග ඒකාබද්ධ කිරීම සඳහාද අනුමැතිය දෙනු ලැබිය. තවද, එක් විදේශීය බැංකු ශාඛාවක් වර්ෂය තුලදී වසාදමනු ලැබිණ. වසර තුළදී විවෘත කරනු ලැබූ මුළු වාණිජ බැංකු ශාඛා ගණන 127 ක් වූ අතර, එයින් 125 ක් දේශීය වාණිජ බැංකු ශාඛාවන්ද, 2 ක් විදේශීය වාණිජ බැංකු ශාඛාවන්ද විය. වර්ෂය තුළදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැ.) ශාඛා 4 ක් ද විවෘත කරනු ලැබිය. විශේෂ බැංකු අතරින් සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ සීමාසහිත ජාතික සංවර්ධන බැංකුව එක් ශාඛාව බැගින්ද ජාතික ඉතිරිකිරීමේ බැංකුව ශාඛා 2 ක්ද, විවෘත කළේය. 1996 අවසානයේදී, මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 1,344 ක් දක්වා ශාඛා 133 කින් හෙවත් සියයට 11 කින් වැඩි විය.

බද්ධ ව්‍යාපාර

වසර තුළදී, සීමාසහිත නේපාල ලංකා බැංකුව නමින් නේපාලයෙහි එන් බී සමූහ ව්‍යාපාරය සමග බද්ධ ව්‍යාපාර සමාගමක් ඇති කොට ලංකා බැංකුව විසින් තම එතෙර ව්‍යාපාර කටයුතු පුළුල් කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන බැංකු ස්ථාපනය කිරීම

දැනට පවතින ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු පවරා ගැනීම සහ ඒවායෙහි කටයුතු පුළුල් කිරීම සඳහා, නිශ්චය කරනු ලබන ප්‍රදේශවල ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීමට රජය විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම බැංකු ස්ථාපනය කිරීම සම්බන්ධව පනත් කෙටුම්පත 1996 දෙසැම්බර් 13 වන දින රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී.

කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳාම හා වාණිජ කටයුතු වර්ධනයට සහ වෙනත් සංවර්ධන කටයුතු සඳහා ණය පහසුකම් සැපයීම තුළින් යෝජිත ප්‍රාදේශීය සංවර්ධන බැංකු සිය ප්‍රදේශයන්හි ආර්ථිකය සංවර්ධනය කරනු ඇත. පළාත් බලධාරීන් විසින් ප්‍රදේශයෙහි කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවලට ද මෙම බැංකු සිය සහාය ලබාදෙනු ඇත.

ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීමේ තීරණය කරුණු රාශියක් මත පදනම් විය. ප්‍රාදේශීයව දැනට ක්‍රියාත්මක බැංකු සහ ණය දෙන ආයතන පද්ධතියෙහි කටයුතු සීමිත වන අතර, සංවර්ධන බැංකුවකින් බලාපොරොත්තු වන පුළුල් ක්ෂේත්‍රයක කටයුතු මෙම පවතින ආයතනවලට කළ නොහැකිය. 1985 සිට පිහිටුවන ලද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ග්‍රාමීය ආර්ථිකයේ දිළිඳු අංශවලට ණය සැපයීමෙහිලා ඵලදායී මෙහෙවරක් ඉටු කර ඇතත්, ඒවාට මුහුණ දීමට සිදුව ඇති ව්‍යුහාත්මක සහ සම්පත් සම්බන්ධ සීමාවන් නිසා ප්‍රාදේශිකව සමස්ත ආර්ථික වර්ධනයෙහිලා කටයුතු කිරීමට ඒවාට නොහැකි වී ඇත. තවද, ආර්ථිකයේ එක් එක් අංශ සඳහා වෙන වෙනම බැංකු ආයතන පිහිටුවීමට ද යෝජනා ඉදිරිපත්ව ඇත. එසේ ආංශික බැංකු පිහිටුවහොත් එවැනි ආයතන සංඛ්‍යාව අනවශ්‍ය පරිදි ඉහළ යාමට හේතු වන අතර, සම්පත් අපතේ යාමටද ඉඩ ඇත. මේ නිසා ප්‍රාදේශීය සංවර්ධන බැංකු පිහිටුවීම ප්‍රාදේශීයව සමස්ත ආර්ථික සංවර්ධන කටයුතු වේගවත් කිරීමෙහිලා ඇති වඩාත් ශක්‍ය සහ නොකඩවා පවත්වාගෙන යා හැකි මාර්ගය ලෙස සලකනු ලැබ ඇත.

බැංකු අධීක්ෂණ

මහ බැංකුව සතු මෙහෙයුම් හා අධීක්ෂණ කටයුතු පිළිබඳ වගකීම දරණ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, 1996 ජනවාරි මසදී අඩාල වූ තම කාර්යයන් ඉක්මණින්ම යථා තත්ත්වයට පමුණුවාගෙන තැන්පත් කරුවන් ගේ අයිතින් ආරක්ෂා කරදීම සඳහා බැංකු ක්‍රමය තුළ යහපත් මූල්‍ය තත්ත්වයක් ඇති කිරීමට නොකඩවා කටයුතු කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව එහි කාර්යයන් ක්‍රියාත්මක කරනුයේ, කාලීන ස්ථානීය පරීක්ෂණයන් හා ස්ථානීය නොවන අඛණ්ඩ විමසිලිමත්වීම් මගිනි. ස්ථානීය පරීක්ෂණ වලදී, එක්රැස් කරගන්නා තොරතුරු මත පරීක්ෂණයට භාජන වන බැංකුවේ වත්කම් වල ගුණාත්මක භාවය පිළිබඳ ඇගැයීමක් කරනු ලබන අතර, බැංකුවල මූල්‍යමය ක්‍රියාකාරීත්වය, කළමණාකරණ ශක්තිය, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය හා ද්‍රවශීලතාවය පිළිබඳ විග්‍රහ කිරීමද, පාලන ක්‍රම හා විධි පිළිබඳ පරීක්ෂණ කිරීමද එමගින් සිදු කෙරේ.

II - 4 සංඛ්‍යා සටහන
බැංකු ආයතන සංයුතිය සහ බැංකු ශාඛා ව්‍යාප්තිය

වර්ගීකරණය	1991	1992	1993	1994	1995	1996(අ)
1. ආයතන සංඛ්‍යාව	42	43	44	44	47	48
1.1 වාණිජ බැංකු	23	23	23	23	26	27
1.1.1. දේශිය වාණිජ බැංකු	6	6	6	6	8	8
1.1.2 විදේශිය බැංකු	17	17	17	17	18	19
1.2 ප්‍රා.ග්‍රා.සං. බැංකු (ආ)	15	16	17	17	17	17
1.3 විශේෂිත බැංකු (ඇ)	4	4	4	4	4	4
1.3.1 ඉතිරි කිරීමේ බැංකු	1	1	1	1	1	1
1.3.2 සංවර්ධන බැංකු	3	3	3	3	3	3
2. බැංකු ශාඛා සංඛ්‍යාව (ඈ)	977	1,065	1,107	1,158	1,211	1,344
2.1 වාණිජ බැංකු ශාඛා (ඉ)	765	818	853	892	938	1,063
2.1.1 දේශිය බැංකු ශාඛා	739	788	819	855	899	1,023
(I) ප්‍රධාන ශාඛා	656	699	733	763	797	828
(II) කෘසේ.ම. ශාඛා	36	34	29	28	19	17
(III) කච්චේරි ශාඛා	24	24	24	23	23	23
(IV) ව්‍යාප්ති කාර්යාල/ගෙවීම් කාර්යාල (ඊ)	17	25	27	32	41	49
(V) උකස් මධ්‍යස්ථාන	4	4	4	7	15	101
(VI) විදේශිය ශාඛා (උ)	2	2	2	2	4	4
(VII) විදේශිය ව්‍යාප්ති කාර්යාල සංඛ්‍යාව	-	-	-	-	-	1
2.1.2 විදේශිය බැංකු ශාඛා	26	30	34	37	39	40
(I) ප්‍රධාන ශාඛා	25	29	33	36	37	38
(II) ව්‍යාප්ති කාර්යාල	1	1	1	1	2	2
2.2 ප්‍රා.ග්‍රා.ස.බැ. ශාඛා	124	156	163	169	171	175
2.3 විශේෂිත බැංකු ශාඛා සංඛ්‍යාව (ඌ)	88	91	91	97	102	106
2.3.1 සී/ස ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව	3	3	3	4	4	5
2.3.2 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	3	3	2	2	2	2
2.3.2 ජාතික සංවර්ධන බැංකුව	1	1	1	1	1	2
2.3.4 ජාතික ඉතිරි කිරීමේ බැංකුව	81	84	85	90	95	97

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 1985 අංක 15 දරණ ප්‍රා.ග්‍රා.සං. බැංකු පනත යටතේ පිහිටුවන ලද ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු
(ඇ) සංශෝධිත බැංකු පනතේ විධිවිධාන යටතේ විශේෂිත බැංකු ලෙස බලපත්‍රයක් අවශ්‍ය බැංකු
(ඈ) සමූපකාර ග්‍රාමීය බැංකු ඇතුලත් නැත.
(ඉ) සොසයිටි ජෙනරල් බැංකු ශාඛාව 1996 බැංකු කටයුතු ආරම්භ නොකළ නිසා එය ඇතුළත් කර නොමැත.
(ඊ) සංශෝධිතයි. උකස් මධ්‍යස්ථාන වෙනම දක්වා ඇත.
(උ) ලංකා බැංකුවේ විදේශිය කාර්යාල
(ඌ) ප්‍රධාන කාර්යාල ද ඇතුළත්ව

විමසුමට ලක්වන වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් මෙවැනි ස්ථානිය පරීක්ෂණයන් 13 ක් ආරම්භ කරනු ලැබූ අතර, පෙර වසර තුළ පරීක්ෂණ කටයුතු අරඹන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු 03 ක හා ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් ද ඇතුලත් වූ පරීක්ෂණයන් 07 ක කටයුතු මෙම වසර තුළදී නිමකරන ලදී. ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු දෙකක කටයුතුවල විශේෂයෙන් නියම කරන ලද අංශයන් කිහිපයක් ආවරණය වන අයුරින් ස්ථානිය පරීක්ෂණයන්ද 1996 වසර තුළදී සිදුකරන ලදී.

ස්ථානිය නොවන විමසිලිමත් වීමේ ක්‍රමය යටතේ, මාසික වාර්තාවන් වන වත්කම් හා වගකීම් හා ද්‍රවශීල වත්කම් සහ ත්‍රෛමාසික වාර්තාවන් වන අවධිමත් අත්තිකාරම්, ආදායම් හා වියදම්, සහ ප්‍රාග්ධන ප්‍රමාණවත් භාවය පිළිබඳ වාර්තා මගින් දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු හා ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකුවල මූල්‍යමය තත්ත්වයන් දිගටම මෙහෙයවනු ලැබිණ. වාණිජ බැංකු හා ප්‍රාදේශිය ග්‍රාමීය සංවර්ධන බැංකු මගින් සපයන ලද තොරතුරු විමර්ශණය කිරීමෙන්, සමාන බැංකු කාණ්ඩවලට හා සමස්තයක් වශයෙන් මුළු බැංකු ක්ෂේත්‍රයට සම්බන්ධව, එක් එක් බැංකුවේ මූල්‍ය තත්ත්වය, අත්තිකාරම් වනුහයේ ප්‍රමාණය හා ගුණාත්මක භාවයේ නැම්යාවන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කෙරෙන වත්කම් හා වගකීම්, ආදායම් හා වියදම් හා වත්කම් හා වගකීම්වල කල්පිරීමේ රටාව පිළිබඳ වාර්තා වැනි කාලීනව ඉදිරිපත් කෙරෙන වාර්තා මගින්, වාණිජ බැංකුවල විදේශිය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල කටයුතු මෙහෙය වීමද, දෙපාර්තමේන්තුව සතු කාර්යයකි. බැංකු පනතේ යම් යම් විධිවිධාන වලින් මෙතෙක් නිදහස්කර තිබූ බලපත්‍ර ලාභී වෙළඳ බැංකුවක එතෙර බැංකු ඒකකයන්ද, බැංකු පනත සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විධිමත් අවශ්‍යතාවයන් යටතට පත්විය.

1988 අංක 30 දරණ බැංකු පනත හා 1995 අංක 33 දරණ (සංශෝධිත) බැංකු පනතේ විධිවිධාන යටතේ වූ මෙහෙයුම් අවශ්‍යතාවයන්ට හා විධිමත් අවශ්‍යතාවයන්ට අදාළව නිකුත් කළ වෙනත් උපදෙස් මාලාවන්ට අනුකූලව බැංකු කටයුතු කරන බවට දෙපාර්තමේන්තුව විසින් නොකඩවා වගබලා ගැණුනි. මෙයට ඇතුළත් වනුයේ, අවදානම මත බර තබන ලද වත්කම්වලට අදාළව ප්‍රමාණවත් අවම ප්‍රාග්ධන අනුපාතයන් පවත්වාගැනීම හා ද්‍රවශීල වත්කම් අවම අවශ්‍යතාව සපුරාලීම, ඒක පුද්ගල ණය සීමාවන්ට අනුකූලවීම, අධ්‍යක්ෂවරුන්ට හා ඔවුන්ට සම්බන්ධිත අයට සළසන ණය පහසුකම් වල සීමාවන්, ව්‍යවස්ථාපිත කාලසීමාවන් තුළ වාර්ෂික විගණිත මූල්‍ය ගිණුම්

ඉදිරිපත් කිරීම, අක්‍රීය අත්තිකාරම් වලට අදාළ උපදෙස් මාලාවන් පිළිපැදීම හා බොල් හා අඩමාණ ණය සඳහා වෙන්කිරීම් වල ප්‍රමාණවත් භාවය ආදියයි. ඉහත සඳහන් සියලුම කරුණු සම්බන්ධව, දෙපාර්තමේන්තුව විසින්, බැංකු රෙගුලාසි හා අධීක්ෂණ පිළිවෙත් පිළිබඳ කමිටුව (BASLE Committee) මගින් නිශ්චිත කරන ලද නියමයන්ට අනුකූල වන ප්‍රමිතීන් සකසා ගන්නා ලදී. මේ විධිවිධාන යටතේ, බැංකු විසින් පවත්වා ගතයුතු සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණය එම බැංකුවල අවදානම මත බර තබන ලද මුළු වත්කම් වලින් සියයට 8 ක් වන අතර, අවම ද්‍රවශීලතා අනුපාතය විශේෂිත මුළු වත්කම් වලින් සියයට 20 ක් වේ.

1987 වර්ෂයේ ආරම්භ කරන ලද තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය, විමර්ශණයට භාජනය කරන ලද වර්ෂය තුළදී ද මෙම දෙපාර්තමේන්තුව විසින්, පරිපාලනය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 3 ක්ද, විවිධ සේවා සමූපකාර සමිති 5 ක් ද, ලියාපදිංචි වී ඇති අතර, රක්ෂණ වාරිකය එක් කාර්තුවකට රු. 100 කට ශත 3.75 ක් වශයෙන් පැවතිණ. වාරික මුදල් ලෙසින් 1996 වසර තුළදී අරමුදලට එකතු වූ මුදල රු. 10,61,660 කි. 1996.12.31 දිනට මුළු අරමුදල රු. 1,55,71,710 ක් විය.

1979 වර්ෂයේදී ශාඛා කාර්යාලයක් පිහිටුවන ලද ඉන්දුසුවස් (BANQUE INDOSUEZ) බැංකුව ශ්‍රී ලංකාවෙන් තම කටයුතු අවසන් කිරීම පිණිස මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තේය. මෙම බැංකුවෙහි විශේෂයෙන් නියම කරන ලද ඇතැම් වත්කම් හා සියලුම වගකීම් භාරගන්නා බවට හැටන් නැෂනල් බැංකුව, ඉන්දුසුවස් බැංකුව සමග ගිවිසුමකට එළැඹිණ. බැංකු පනතේ නියෝග ප්‍රකාර ඉන්දුසුවස් බැංකුව විසින්, එහි සියලුම බැඳීම් හා වගකීම් නිසි අයුරින් සපුරා ඇත්ද, යන්න පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව විසින් වගබලා ගන්නා ලදී.

බැංකු පනතට කරන ලද සංශෝධන :

1988 අංක 30 දරණ බැංකු පනතට, 1995 අංක 33 දරණ පනත මගින් කරන ලද සංශෝධනයන්ට අනුව, 1988 බැංකු පනතේ අදාළ වගන්ති ප්‍රකාර, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධානයන් කෙටුම්පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ පවත්නා සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සමාන පදනමක් ඇති කිරීමත්, රෙගුලාසි හා අධීක්ෂණ කටයුතු පිළිබඳ මහ බැංකුවේ කාර්ය භාරය ශක්තිමත් කිරීමත්, මෙම සංශෝධන මගින් අපේක්ෂා කෙරේ.

මෙම විධානයන් නම් :

අංක 17 "අ" වගන්ති ප්‍රකාර, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් කොටස් ආයෝජනයෙහි යෙදීමේදී, ලැයිස්තුගත පොදු සමාගමක හැර කිසිම සමාගමක කොටස් අත්පත් කරගැනීම හෝ දැරීම, මෙම වගන්තිය මගින් සීමා කෙරේ. මෙම යෝජිත විධිවිධාන මගින්, බැංකුවක් විසින් පොදු සමාගමක කොටස් දැරීමේදී එය බැංකුවේ ප්‍රාග්ධන අරමුදලින් සියයට 10 නොඉක්මවිය යුතු බවත්, එවැනි ආයෝජනයන් හි මුළු එකතුව බැංකුවක ප්‍රාග්ධන අරමුදලින් සියයට 30 නොඉක්මවිය යුතු බවත්, අවධාරණය කෙරේ. කෙසේ නමුත්, මෙම කොටස් අත්පත්කර ගැනීම හෝ දැරීම අදාල ලැයිස්තුගත පොදු සමාගමේ ගෙවා නිම් ප්‍රාග්ධනයෙන් සියයට 20 නොඉක්මවිය යුතුවේ.

අංක 48 "අ" වගන්ති ප්‍රකාර, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිශ්චල දේපළ මිළට ගැනීම හා අත්පත්කර ගැනීමේ දී, යම් නිශ්චල දේපළක් අත්පත්කර ගැනීම හෝ එයට යම් අයිතියක් කියාපෑම, මුදල් මණ්ඩලය විසින් නිගමනය කළයුතු බවට සීමා පැනවේ. බැංකුවක මෙම යෙදවුම් වල මුළු එකතුව එම බැංකුවේ ප්‍රාග්ධන අරමුදලින් සියයට 15 නොඉක්මවිය යුතු බවට යෝජිත විධිවිධානයන් මගින් අවධාරණය කෙරේ.

මෙම සීමාවන් පැනවීම් මගින්, බැංකු අරමුදල් එහි මූලික ව්‍යාපාර කටයුතු වලින් බැහැරව නොයොදවන බවට වග බලා ගැනේ.

මෙතෙක් මුදල් නීති පනතේ අංක 102 වගන්තිය ප්‍රකාර බලපැවැත්වූ ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ අවශ්‍යතාවය, 1995 අංක 33 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ අංක 19(7) වගන්ති ප්‍රකාර බලපැවැත්වෙනු ඇත.

මෙතෙක් උපදෙස් මාලාවන් මගින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කළ බොල් ණය මගින් ඇතිවිය හැකි යම් යම් පාඩු වෙනුවෙන් කළයුතු අවම වෙන්කිරීම් පිළිබඳව, පොදු හා විශේෂිත වෙන්කිරීම් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවය, 1995 අංක 33 දරන පනත මගින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ අංක 46"අ" වගන්ති යටතේ දැන් අනිවාර්ය බවට පත්ව ඇත.

අංක 46 (1) (ඇ) දරණ වගන්ති ප්‍රකාර, තනි පුද්ගලයෙකුගේ ණයගැනීමේ සීමාවන් පිළිබඳ විග්‍රහයට, තනි පුද්ගලයෙකුට, ඔහුගේ කිට්ටුවර ඥාතීන්ට හා සම්බන්ධිත ආයතනවලට නිකුත් කෙරෙන උපරිම මුළු ණය පහසුකම් වල සමුච්චිතය ඇතුළත් කිරීම; මීට ප්‍රථම තනි පුද්ගල ණයගැනීමේ සීමාව අදාළ වූයේ, තනි පුද්ගලයෙකුට හා ඔහුගේ කිට්ටුවර ඥාතීන්ට පමණි.

1995 අංක 33 දරණ සංශෝධිත බැංකු පනතෙහි IX "අ" වගන්ති ප්‍රකාර ජාතික සංවර්ධන බැංකුව, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව යන බලපත්‍රලාභී විශේෂිත බැංකු ආයතන ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලන විධිවිධාන යටතට පැවැරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම බැංකුද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි සෘජු අධීක්ෂණය යටතට පත්විය. සංශෝධිත බැංකු පනතේ මෙම කොටස යටතේ, එම බැංකු වෙත නිකුත් කිරීම පිණිස අවශ්‍ය රෙගුලාසි හා විධි විධානයන්, දෙපාර්තමේන්තුව විසින් දැනට සකස් කරනු ලබමින් පවතී.

බැංකු නොවන මූල්‍ය ආයතන

මූල්‍ය සමාගම් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව මූල්‍ය ආයතන අංශයේ මනා මූල්‍ය වාතාවරණයක් ඇති කිරීමේ සහ තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ අරමුණින් යුතුව තැන්පතු බාර ගන්නා මූල්‍ය සමාගම්වල කටයුතු විධිමත් හා අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියෙහි තවදුරටත් නිරත විය.

මූල්‍ය සමාගම් පනත යටතේ පනවා ඇති නියෝග සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට සහතිකවනු පිණිස, ලියාපදිංචි වී ඇති මූල්‍ය සමාගම් 24 ක සුපරීක්ෂණ හා අධීක්ෂණ කටයුතු එකී මූල්‍ය සමාගම් විසින් සපයනු ලබන දත්ත ඇසුරෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අතර, ඒ සඳහා සතිපතා ද්‍රවශීල වත්කම් ප්‍රකාශ, වත්කම්

හා වගකීම් පිළිබඳ මාසික වාර්තා, ආපසු ගෙවීම් පැහැර හැරි ණය මුදල් පිළිබඳ ත්‍රෛමාසික වාර්තා සහ විගණනය කරන ලද වාර්ෂික ශේෂපත්‍ර පිළිබඳ විශ්ලේෂණ පදනම් කර ගැනුණි. දෙපාර්තමේන්තුව විසින් වරින් වර මූල්‍ය සමාගම් ස්ථානීය පරීක්ෂණයටද ලක් කරන ලද අතර, සමාගමේ වත්කම්, ප්‍රාග්ධන ප්‍රමාණවත් බව, ද්‍රවශීලතාවය, ලාභදායීතාවය, කළමනාකරණය සහ අභ්‍යන්තර ක්‍රම හා පාලනයන්හි කාර්යක්ෂම බව පිළිබඳව විස්තරාත්මක අගැයීම් මීට ඇතුලත් විය.

මහ බැංකුවේ ලියාපදිංචි වූ මූල්‍ය සමාගම් 24 හි 95.03.31 දිනට හා 96.03.31 දිනට ඒකාබද්ධ ශේෂපත්‍ර II-5 සංඛ්‍යා සටහනෙහි දැක්වේ. මුළු වත්කම්වල සියයට 26.4 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, මෙම වර්ධනය අත්කර ගැනීමේදී වත්කම් සහ වගකීම්වල ව්‍යාප්තියෙහි ඇති වූයේ සුළු වෙනසකි. තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 7.2 සිට රුපියල් බිලියන 8.8 දක්වා වැඩි වූ අතර අත්තිකාරම් රුපියල් බිලියන 7.8 සිට 10.5 දක්වා වැඩිවිය. කොටස් ආයෝජනයන්හි වර්ධනය පහළ මට්ටමක වූ අතර, අත්තිකාරම්වල සියයට 33.4 ක වර්ධනයක් වාර්තා විය. ප්‍රාග්ධන අරමුදල් සියයට 11.2 කින්ද, අනෙකුත් වගකීම් සියයට 74.1 කින්ද වැඩි විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනයක් සැළකිල්ලට ගෙන, 1996 වර්ෂයේ සිට මූල්‍ය සමාගම් පනත යටතේ, මූල්‍ය සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවම වශයෙන් රුපියල් දශලක්ෂ 25 ක ගෙවා නිමි ප්‍රාග්ධනයක් එම මූල්‍ය සමාගම සතුව තිබිය යුතු යයි පරිපාලනමය වශයෙන් තීරණය කරන ලදී. අවම වශයෙන් තිබිය යුතු ගෙවා නිමි ප්‍රාග්ධනය රුපියල් දශ ලක්ෂ 5 සිට රුපියල් දශ ලක්ෂ 25 දක්වා වැඩි කෙරෙන මූල්‍ය සමාගම් පනත සඳහා වූ මෙම යෝජිත සංශෝධනය, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම විධිවිධාන අනුව මූල්‍ය සමාගම්වල ප්‍රාග්ධන අවශ්‍යතාවය වරින් වර වෙනස් කිරීමේ හැකියාවද මුදල් මණ්ඩලයට හිමිවනු ඇත.

1996 ඔක්තෝම්බර් මාසයේදී තවත් මූල්‍ය සමාගමක් ලියාපදිංචි කළ අතර, ඒ අනුව ලියාපදිංචි කළ මුළු මූල්‍ය සමාගම් සංඛ්‍යාව 25 දක්වා වැඩිවිය.

මූල්‍ය සමාගම් පනත යටතේ මුදල් මණ්ඩලය වෙත පවරාගනු ලැබූ මූල්‍ය සමාගම් 5 ක පරිපාලනය හා කළමනාකරණ කටයුතු තවදුරටත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම්වල තැන්පතුකරුවන් සඳහා සහන සැලසීමේ ක්‍රමය යටතේ එවැනි සමාගම් දෙකක තැන්පතුකරුවන් සඳහා 1996 වර්ෂය තුළදී කරන ලද සහන ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12.0 ක්වූ අතර, 1996 වර්ෂය අවසානය දක්වා තැන්පත්කරුවන් වෙනුවෙන් කරන ලද මුළු සහන ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 572.8 ක් විය. මුදල් මණ්ඩලය වෙත පවරාගනු ලැබූ තවත් මූල්‍ය සමාගමක තැන්පතුකරුවන් වෙනුවෙන් පොළී මුදල් ද සමග කල්පිරුණු තැන්පතු බේරුම් කිරීම සඳහා රුපියල් දශලක්ෂ 9.9 ක මුදලක් වර්ෂය තුළදී ගෙවනු ලැබීය. මුදල් මණ්ඩලය පවරා ගනු ලැබූ සහන ගෙවීම් කටයුතු අවසන් කළ වෙනත් මූල්‍ය සමාගම් හතරක් සඳහා, ඈවරකරුවෙකු වශයෙන් විගණන ආයතනයක් පත්කරන ලදී.

මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව, එක් මූල්‍ය සමාගමකට හිමි නිශ්චල දේපල විකුණා, ඉන් ලැබෙන මුදල් යම් සාධාරණ ක්‍රමයකට තැන්පතු වගකීම් බේරුම් කිරීමට යොදාගන්නා ලෙස ඉල්ලා නිකුත්කොට තිබූ උපදෙස් වලට එම සමාගම අනුකූලතාවය දක්වන බවට මෙම දෙපාර්තමේන්තුව වග බලාගත්තේ ය.

II - 5 සංඛ්‍යා සටහන
ක්‍රියාත්මක මූල්‍ය සමාගම්වල ඒකාබද්ධ ශේෂ පත්‍රය

රු: දහස් ගණනින්

	95. 03. 31 දිනට	%	96. 03. 31 දිනට	%	වෙනස ප්‍රතිශතයක් ලෙස
වගකීම්					
1. ප්‍රාග්ධන අරමුදල්					
නිකුත් කළ ප්‍රාග්ධන	382,586		385,776		
කොටස් අධි මිල	223,043		204,951		
ප්‍රාග්ධන සංචිත	488,948		491,302		
පොදු සංචිත	453,099		612,309		
සංචිත අරමුදල	245,588		308,103		
වෙනත් සංචිත	165,219		116,508		
ලාභාලාභ ගිණුමේ ශේෂ	65,351		109,841		
දළ ප්‍රාග්ධන අරමුදල	2,023,834		2,228,790		
අඩුකළා: විලම්භිත ගෙවුම්	28,445		8,885		
ශුද්ධ ප්‍රාග්ධන අරමුදල	1,995,389	16.1	2,219,905	14.2	11.2
2. බොල් ණය වෙන් කිරීම්	855,155	6.9	1,026,748	6.6	20.1
3. මහජන තැන්පතු	7,185,813	58.1	8,792,970	56.3	22.3
4. ණය ගැනීම්					
බැංකු අයිරාවත්	823,067		375,306		
වෙනත්	152,073		867,230		
මුළු ණය ගැනීම්	975,140	7.9	1,242,536	8.0	27.4
5. වෙනත් වගකීම්	1,347,041	10.9	2,345,566	15.0	74.1
මුළු එකතුව	12,358,538	100.0	15,627,725	100.0	26.4
වත්කම්					
1. ද්‍රවශීල වත්කම්					
අතැති මුදල් හා බැංකු ශේෂ	194,052		241,077		
ස්ථාවර තැන්පත්	367,748		408,723		
භාණ්ඩාගාරික බිල්පත්	790,727		950,781		
මුළු ද්‍රවශීල වත්කම්	1,352,527	10.9	1,600,581	10.2	18.3
2. ආයෝජන					
ආශ්‍රිත හා පාලිත සමාගම්වල කොටස්	124,114		236,442		
සම්බන්ධිත සමාගම්වල කොටස්	632,385		451,845		
දීර්ඝකාලීන ආයෝජන - කොටස්	156,863		145,903		
වෙළඳ ආයෝජන - කොටස්	112,660		210,454		
ණයකර	200		500		
මුළු ආයෝජන	1,026,222	8.3	1,045,144	6.7	1.8
3. අත්තිකාරම්					
ණය	606,773		1,004,995		
කුලී සින්නක්කර ණය	2,197,391		2,682,906		
කල් බදු ණය	4,022,397		5,878,933		
ඉඩකඩම් ණය	395,965		644,567		
වෙනත් අත්තිකාරම්	626,186		262,204		
මුළු අත්තිකාරම්	7,848,712	63.5	10,473,605	67.0	33.4
4. ස්ථාවර වත්කම්					
ඉඩම් හා ගොඩනැගිලි	818,695		860,711		
ලිඛඩු සවි කිරීම	84,870		48,916		
කාර්යාලීය උපකරණ	39,234		108,210		
මෝටර් රථ	102,286		117,177		
යන්ත්‍ර සූත්‍ර	44,130		19,230		
බදු වගකීම	7,138		9,768		
වෙනත්	8,800		25,610		
මුළු ස්ථාවර වත්කම්	1,105,153	8.9	1,189,622	7.6	7.6
5. වෙනත් වත්කම්	1,025,924	8.3	1,318,773	8.4	28.5
මුළු එකතුව	12,358,538	100.0	15,627,725	100.0	26.4
වාර්තා කළ සමාගම් ගණන	24		24		

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍ය සමාගම් පනතේ විධිවිධානවලට සහ මුදල් මණ්ඩලයේ නියෝගයන්ට පටහැනිව ක්‍රියා කරනු ලැබූ සහ ඇතැම්විට සමාගම්වල මුදල් අයථා ලෙස පරිහරණය කරනු ලැබූ මූල්‍ය සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට සහ අනෙකුත් නිලධාරීන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව සහ පොලිස් දෙපාර්තමේන්තුව සමග තවදුරටත් සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවනු ලැබීය. වර්ෂය තුළදී, අසාර්ථකත්වයට පත් එක් මූල්‍ය සමාගමක අධ්‍යක්ෂකවරුන් සහ නිලධාරීන්ට විරුද්ධව දෙපාර්තමේන්තුව නඩු පැවරූ අතර ඉන් ඔවුහු වරදකරුවෝ වූහ. වරදකරුවන් හට විශාල දඩ සහ සිර දඬුවම් නියම කෙරිණි. මෙය මේ දක්වා මූල්‍ය සමාගමක අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව උසාවියකින් පැන වූ බරපතලම දඬුවම වන අතර, එවැනි විෂමාචාරයන් සිදුවීම වැළැක්වීම සඳහා මෙම දඬුවම් වලින් බලපෑමක් ඇතිවේ යැයි බලාපොරොත්තු වේ.

කල්බදු ණය සම්බන්ධයෙන්, දෙපාර්තමේන්තුව විසින් කල්බදු මූල්‍ය සමාගම් ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීමේ වගකීම දැරීමට අපේක්ෂා කෙරේ. දැනට ශ්‍රී ලංකාවේ කල්බදු ණය කටයුතු සඳහා සුදුසු ආයතනික හා පාලන ව්‍යුහයක් ඇති කිරීම පිණිස නීති සකස් කිරීම කෙරෙහි සැළකිල්ල යොමු වී ඇත.

සංවර්ධන මුදල්

1996 වර්ෂයේ මුල් භාගය තුළදී සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වූයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක) ණය යෝජනා ක්‍රමය හා බස්රථ මිලදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය (බමිණ) සඳහා වන ණය ආවරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (එ.ජ.ජා.සං.ආ.) යටතේ වන අඩු ආදායම් නිවාස වැඩසටහනෙහි iv වැනි අදියර සඳහා වන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යනාදියට අදාල වැඩකටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීමය. එසේම වර්ෂයේ දෙවැනි භාගය තුළදී මෙම දෙපාර්තමේන්තුව විසින් දේශීය වැවිලි අංශය පුනරුත්ථාපනය කිරීම සඳහා නව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ආසියානු සංවර්ධන බැංකුවෙන් (ආ.සං.බැං.) අරමුදල් ලබා ගැනීම තුළින් වැවිලි අංශය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුපියල් දශ ලක්ෂ 428.6 ක වටිනාකමක් ඇති ණය අයදුම්පත් 15 ක් අනුමත කරන ලදී. එසේම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ආවරණ සහතික නිකුත් කරන ලද ව්‍යාපෘතීන්හි වර්තමාන ක්‍රියාකාරිත්වය සලකා බැලීම පිණිස ව්‍යාපෘති පරීක්ෂණ සහ පසු විපරම් කටයුතුද දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

ණය ආවරණ සහතික ක්‍රමයන්හි ක්‍රියාකාරිත්වය

1996 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරන ලද ණය ආවරණ ක්‍රම යටතේ සුළු පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය. (සුමක) I,II,III සහ IV සඳහා වූ ණය ආවරණ සහතික ක්‍රමයන්හි යටතේ වූ ණය ආවරණ කටයුතුවල සාරාංශයක් II - 6 දරණ සංඛ්‍යා සටහනෙන් දැක්වේ. සුමක II,III සහ IV යන ණය යෝජනා ක්‍රමයන් යටතේ මූල්‍ය පහසුකම් ලබාගත් ව්‍යාපෘතීන්හි කර්මාන්ත අනුව කරන ලද වර්ගීකරණයක් අංක II - 7 දරණ සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.බස්රථ මිලදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය යටතේ ණය ආවරණ කටයුතු පිළිබඳ සාරාංශයක් 11-8 සංඛ්‍යා සටහනේ දැක්වේ.

සුළු පරිමාණ කර්මාන්ත (සු.පරි.ක.) ණය යෝජනා ක්‍රමය

මෙම යෝජනා ක්‍රමය යටතේ 1978 සහ 1979 වර්ෂයන්හි සහතික කරන ලද මුළු ණය මුදල් සංඛ්‍යාව 767 කි. 1996 වර්ෂය අවසානයේදී මෙයින් ක්‍රියාත්මකව පැවැතියේ රුපියල් දශ ලක්ෂ 0.3 ක ණය ආවරණ වගකීමකින් සහ රුපියල් දශ ලක්ෂ 0.4 ක වටිනාකමකින් යුත් ණය මුදල් 8 ක් පමණි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමයයන්

සුමක I, II සහ III ණය යෝජනා ක්‍රම පිළිවෙලින් 1979 - 1981, 1982 - 1989 හා 1988 - 91 කාලච්ඡේදයන් තුළදී ක්‍රියාත්මක විය.

1992 වර්ෂයේ මාර්තු මාසයේදී ඇරඹුණු සුමක IV ණය යෝජනා ක්‍රමය දැනුදු ක්‍රියාත්මක වේ. 1996 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 973.9 ක වටිනාකමකින් යුත් ණය ආවරණ සහතික 1,029 ක් නිකුත් කරන ලද අතර, මෙම ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම රුපියල් දශ ලක්ෂ 676.4 කි. මෙම වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 18.0 ක වටිනකමකින් යුත් ණය ආවරණ සහතික 72 ක් සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලදී. 1996 වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පිරිදි පිළිනොපැදීම හේතුවෙන් ණය ආවරණ සහතික 238 ක් ඉවත් කරගෙන හෝ අවලංගු වී හෝ තිබුණි. 1996 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 5,433.6ක වටිනාකමකින් යුත් ණය ආවරණ සහතික 7,536 ක් මෙම යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මකව පැවතුණි. මෙම ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු ඇප වගකීම රුපියල් දශ ලක්ෂ 2,540.6 ක් විය. 1996 වර්ෂයේ දෙසැම්බර් මස අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 70.3 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 120 ක් ලැබුණු අතර, රුපියල් දශ ලක්ෂ 8.4 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 30 ක් සමථයකට පත්කරන ලදී.

1996 වර්ෂය අවසාන වනවිට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 104.9 ක් වූ අතර, පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් වශයෙන් ලද ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2.1කි.

බස්රථ මිලදී ගැනීමේ ණය ආවරණ ක්‍රමය

මගී ප්‍රවාහනය සඳහා පෞද්ගලික බස්රථ ධාවකයින්ට සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ප්‍රදානය කරනු ලබන ණය මුදල් ආවරණය කිරීම සඳහා මෙම ණය සහතික ක්‍රමය 1990 වර්ෂයේ නොවැම්බර් මාසයේදී හඳුන්වා දෙනු ලැබීය. මේ සඳහා අවශ්‍ය ප්‍රතිමූල්‍ය පහසුකම් ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.) විසින් සපයනු ලැබූ අතර, ණය ආවරණ සහතික පත්‍ර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලදී. මෙම ණය ආවරණ සහතික ක්‍රමය සඳහා ජාතික සංවර්ධන බැංකුව විසින් සපයනු ලැබූ ප්‍රතිමූල්‍ය සම්පත් සියල්ලම 1992 වර්ෂය අවසාන වනවිට ප්‍රයෝජනයට ගෙන තිබූ හෙයින් එතැන් සිට මෙම ණය ආවරණ සහතික ක්‍රමය ක්‍රියාත්මකවීම අවසන් විය. මෙම බස්රථ ණය ආවරණ සහතික ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 871.2 ක මහ බැංකු වගකීමක් සහිත මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,098.6 ක් වූ ණය මුදල් 1,932 ක් 1992 වර්ෂය අවසාන වනවිට ප්‍රදානය කොට තිබුණි.

බස්රථ ණය ආවරණ සහතික ක්‍රමය යටතේ නව බස්රථ 1,911 ක් මගී ප්‍රවාහනය සඳහා පොදු මගී ප්‍රවාහන සේවාවට එක් කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමයෙහි දක්නට ලැබුණු ප්‍රධානම ලක්ෂණය වන්නේ නව හිමිකරුවන් ලෙස බස්රථ මිලදී ගැනීම සඳහා විශල සංඛ්‍යාවක් ඉදිරිපත්වීමය.

II.6 සංඛ්‍යා සටහන
1996.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය

ශීර්ෂය / යෝජනා ක්‍රම සහ වර්ෂ		සුළු පරිමාණ කර්මාන්ත		සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සු. ම. ක.)					
				සුමක 1		සුමක 11			
		1996		1996		1995		1996	
		සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
1.1	ප්‍රදානය කරන ලද ණය (ආ)	767	31.2	1670	286.1	2531	1392.5	2531	1392.5
1.2	සහතික කරන ලද ණය (ආ)	767	23.4 (ඇ)	1670	157.5 (ඉ)	2531	713.6 (ඊ)	2531	713.6 (ඊ)
2.1	සම්පූර්ණයෙන් ගෙවා නිමි ණය (ආ)	598	23.1	1230	183.9	1564	702.2	1584	709.4
2.2	ඉවත්කර ගන්නා ලද ණය හෝ අවලංගු වූ ණය සහතික (ආ)	90	4.9	113	31.4	353	168.0	353	168.0
3.1	ලැබූ හිමිකම්පෑම් (ආ)	88	4.3 (එ)	338	75.9 (එ)	226	70.0	226	70.0
3.2	ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් (ආ)	-	2.4	-	33.9	-	58.6	-	58.6
3.3	හිමිකම්පෑම් සමථයකට පත්කිරීම								
	සම්පූර්ණයෙන් ගෙවීම් කළ හිමිකම් පෑම්	63	1.7	231	19.2	125	30.6	126	31.7
	අර්ධ ගෙවීම් කළ හිමිකම් පෑම්	1	0.0 (ඈ)	27	2.1	4	0.7	4	0.7
	ප්‍රතික්ෂේප කළ හිමිකම් පෑම්	7	0.2	32	6.9	45	11.7	45	11.7
	හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලද ණය (එ)	16	0.2	37	2.0	5	1.1	5	1.1
	සලකා බැලීම කල්තබන ලද හිමිකම් පෑම් (ඒ)	1	0.3	8	2.1	26	8.2	26	8.2
	තීරණ ගෙන නොමැති හිමිකම් පෑම් (ඒ)	-	-	3	0.5	14	4.4	13	3.5
	ඉවත්කර ගන්නා ලද හිමිකම් පෑම් (ඒ)	-	-	-	-	7	3.6	7	3.6
4.1	නොපියවන ලද ණය මුදල් (ක)	8	0.4	40	4.6	440	110.7	420	107.9
4.2	එයින් හිඟහිටි ණය (ආ)	8	0.4	40	4.6	326	86.7	162	43.2
4.3	ක්‍රියාත්මක ණය සහතික මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම	8	0.3 (ඈ)	40	2.9 (ඉ)	440	66.4 (ඊ)	420	64.7
5	රැස්කර ගන්නා ලද වාර මුදල් (අ)	-	1.0	--	12.2	-	29.4	-	29.6
6.	පශ්චාත් හිමිකම් අයකර ගැනීම් (ආ)	-	0.6	-	10.4	-	16.2 (ග)	-	16.3

(අ) තාවකාලික
(ආ) මේ දක්වා
(ඇ) ජාතික සංවර්ධන බැංකුව විසින් සුමක IV යෝජනා ක්‍රමයට මාරු කරන ලද ණය මුදල් හැර
(ඈ) නොපියවූ ණය ශේෂයන්ගෙන් සියයට 75 ක ප්‍රමාණය
(ඉ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 0.4 ක උපරිමයකට යටත්ව නොපියවූ ණය ශේෂයෙන් සියයට 60 ක ප්‍රමාණය
(ඊ) රුපියල් දශ ලක්ෂ 2.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 0.8 ක උපරිමයකට යටත් වූ හිඟ ණය මුදල්හි සියයට 60 ක ප්‍රමාණය සහ රුපියල් දශ ලක්ෂ 2.0 - 4.0 දක්වා වූ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 1.2 ක්
(උ) ව්‍යාපෘතීන් සඳහා රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 2.0, රුපියල් දශ ලක්ෂ 2.0 -3.0 සහ රුපියල් දශ ලක්ෂ 3.0 -4.0 ක් වූ ණය සඳහා පිළිවෙලින් සියයට 80, 60 සහ 40 ප්‍රමාණය.
(ඌ) ව්‍යාපෘතීන් සඳහා රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 0.5, රුපියල් දශ ලක්ෂ 0.5 - 1.0 රුපියල් දශ ලක්ෂ 1.0 - 2.0 සහ රුපියල් දශ ලක්ෂ 2.0 - 8.0 ක්වූ ණය සඳහා පිළිවෙලින් සියයට 90, සියයට 80, සියයට 70 සහ සියයට 60 ක්
(එ) ගෙවීම් පැහැර හැර ඇති ණය මුදල් එකතු වූ පොලියත් සමග
(ඒ) රුපියල් 4,504.75 ක හිමිකම්පෑම් ගෙවා ඇත.
(ඔ) 2.1 යටතේ අඩංගු වී ඇත.
(ඕ) 4.1 යටතේ අඩංගු වී ඇත.
(ක) අයකරගත් ණය වාරික හැ
(ග) සංශෝධිත.

1996 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 579.1 ක වටිනාකමකින් යුත් ණය මුදල් 1,040 ක් සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර තිබුණු අතර, රුපියල් දශ ලක්ෂ 69.2 ක වටිනාකමකින් යුත් ණය ආවරණ සහතික පත්‍ර 117 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් අනුගමනය නොකිරීම හේතුවෙන් ඉවත්කර ගන්නා ලදී. 1996 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසාන වනවිට ශ්‍රී ලංකා මහ බැංකුවේ බස්රථ මිලදී ගැනීමේ ණය ආවරණ සහතික ක්‍රමය යටතේ වූ සම්පූර්ණ වගකීම රුපියල් දශ ලක්ෂ 107.5 ක් විය.

1996 වර්ෂය තුළදී බස්රථ මිලදී ගැනීමේ ණය ආවරණ සහතික ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 6.9 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑමේ අයදුම්පත් 18 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබී තිබුණු අතර, ඉන් රුපියල් දශ ලක්ෂ 2.5 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑමේ අයදුම්පත් 11 ක් සියයට 50 ක අතුරු ගෙවීමකට සුදුසුකම් ලබා තිබුණි. 1996 වර්ෂය අවසාන වනවිට රුපියල් දශ ලක්ෂ 2.5 ක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 3 ක් සලකා බලමින් පැවැති අතර, රුපියල් දශ ලක්ෂ 1.0 යක වටිනාකමකින් යුත් හිමිකම්පෑම් 2 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීය. 1996 වර්ෂය අවසාන වනවිට මෙම ණය ආවරණ සහතික ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද මුළු වාරිකවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 21.8 ක් වූ අතර, පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් රුපියල් දශ ලක්ෂ 1.3 ක් ලැබී තිබුණි. අංක II - 8 දරණ සංඛ්‍යා සටහන මගින් මෙම ණය ආවරණ සහතික ක්‍රමයෙහි ක්‍රියාකාරීත්වය සැකෙවින් දක්වා ඇත.

සහතික ක්‍රමයන්හි සාරාංශය

(වටිනාකම රුපියල් දශ ලක්ෂ)

සුමක III				සුමක IV			
1995		1996		1995		1996 (අ)	
සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
3130	1955.6 (ඇ)	3130	1955.6	7382	6,056.8	8411	7,030.7
3130	1312.6 (ඉ)	3130	1312.6	7382	4,176.7 (ඉ)	8411	4,853.1 (උ)
1339	607.8	1356	611.3	542	264.3	614	282.3
280	212.6	280	212.6	238	145.0	238	145.0
146	50.7	157	62.3	87	53.0 (එ)	120	70.3
-	35.5	-	42.5	-	42.4	-	56.0
83	22.9	85	23.2	26	7.0	30	8.4
-	-	-	-	-	-	-	-
41	12.1	41	12.1	23	10.6	29	12.9
1	1.6	1	1.6	1	0.5	1	0.5
4	4.6	5	4.8	2	1.6	2	1.6
13	3.7	21	9.3	34	28.9	57	35.6
4	2.5	4	2.5	1	1.6	1	1.6 (උ)
1387	433.7	1370	430.2	6553	3,747.7	7536	5,433.6
621	143.2	374	119.7	1339	43.7	1339	43.7
1387	280.7 (ඉ)	1370	278.7	6553	2,588.3 (උ)	7536	2,540.6
-	42.5	-	43.4	-	84.9	-	104.9
-	10.1 (ග)	-	12.2	-	1.1 (ග)	-	2.1

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

II-7 සංඛ්‍යා සටහන
සුමක II, III සහ IV ණය සහතික ක්‍රම කර්මාන්ත අනුව වර්ගීකරණය 1996 දෙසැම්බර් අවසානයට

කර්මාන්ත	සුමක - II, III						සුමක - IV 1996					
	ප්‍රදානය කරන ලද ණය		ණය ප්‍රමාණය		සහතික කරන ලද ණය ප්‍රමාණය		ප්‍රදානය කරන ලද ණය		ණය ප්‍රමාණය		සහතික කරන ලද ණය ප්‍රමාණය	
	සංඛ්‍යාව	%	රු. දශ ලක්ෂ	%	රු. දශ ලක්ෂ	%	සංඛ්‍යාව	%	රු. දශ ලක්ෂ	%	රු. දශ ලක්ෂ	%
1. ආහාර වර්ග සැකසීම	2,927	20.8	1,985.5	19.1	1,275.9	18.6	191	18.6	160.5	16.3	111.7	16.5
2. වෙනත් කෘෂිකර්මාන්ත	277	2.0	129.0	1.2	87.8	1.3	11	1.1	4.1	0.4	3.3	0.5
3. රබර් නිෂ්පාදන	270	1.9	289.6	2.8	177.7	2.3	17	1.7	20.1	2.0	13.4	2.0
4. ලෝහ නිෂ්පාදන	1.217	8.6	650.4	6.3	441.5	6.4	144	13.9	66.9	6.8	50.2	7.4
5. ඉදිකිරීම් ද්‍රව්‍ය	842	6.0	518.3	5.0	361.2	5.3	54	5.3	46.6	4.8	33.5	4.9
6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු	233	1.7	411.1	3.9	260.5	3.8	45	4.4	111.5	11.4	68.9	10.2
7. දැව කර්මාන්ත	815	5.8	409.9	3.9	286.6	4.2	50	4.9	32.2	3.3	23.8	3.5
8. ඇඟළුම්	805	5.7	716.8	6.9	459.0	6.7	26	2.5	23.7	2.4	16.1	2.4
9. රෙදිපිළි	292	2.1	296.7	2.9	189.3	2.8	9	0.9	8.5	0.9	5.4	0.8
10. අළුත්වැඩියා කිරීමේ වැඩ පොළවල්	505	3.6	285.2	2.8	199.7	2.9	41	3.9	41.7	4.2	28.4	4.2
11. වෙනත් (අ)	5,889	41.9	4,695.3	45.2	3,140.1	45.7	441	42.8	467.1	47.5	321.7	47.6
එකතුව	14,072	100.0	10,387.8	100.0	6,879.3	100.0	1,029	100.0	982.9	100.0	676.4	100.0

(අ) මගී සහ වාණිජ ප්‍රවාහනය, සම් භාණ්ඩ, සත්ව පාලනය, රසායනික ද්‍රව්‍ය, ධීවර, අවන්හල්, ෆයිබර් ග්ලාස්, ඉලෙක්ට්‍රොනික, විදුරු, පිඟන් භාණ්ඩ සහ පොලිතින් කර්මාන්ත ඇතුළත් වේ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

II-8 සංඛ්‍යා සටහන
බස්රට් මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය - 1996.12.31 දිනට සාරාංශය

(වටිනාකම රුපියල් දශලක්ෂ)

	ශීර්ෂය	1995. 12. 31 දිනට		1996. 12. 31 දිනට (අ)	
		සංඛ්‍යාව	වටිනාකම	සංඛ්‍යාව	වටිනාකම
1.1	ප්‍රදානය කරන ලද ණය	1,932	1,098.6	1,932	1,098.6
1.2	සහතික කරන ලද ණය	·1,932	871.2 (ආ)	1,932	871.2 (ආ)
2.1	සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති ණය	596	325.1	1,040	579.1
2.2	ඉවත්කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික	117	69.2	117	69.2
3.1	ලැබූ සම්පූර්ණ හිමිකම්පෑම්	18	9.8 (ඇ)	18	9.8 (ඇ)
3.2	මහ බැංකුවේ වගකීම	-	6.9	-	6.9
3.3	සමථයකට පත්කරන ලද හිමිකම්පෑම්				
	අඩක් සමථයකට පත්කරන ලද හිමිකම්පෑම් (ඈ)	9	2.1	11	2.5
	ප්‍රතික්ෂේප කරන ලද හිමිකම්පෑම්	2	1.0	2	1.0
	කල්තබන ලද හිමිකම්පෑම් (ඉ)	-	-	-	-
	තීරණයක් නොගත් හිමිකම්පෑම් (ඉ)	5	2.8	3	2.5
	ඉවත්කරගත් හිමිකම්පෑම්	1	0.2	1	0.2
	හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලද ණය (ඊ)	1	0.4	1	0.4
4.1	ගෙවා නොමැති ණය	1,208	218.4 (උ)	745	164.4
4.2	ගෙවා නොමැති ණය මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම	1,208	171.8 (ආ)	745	107.5
5.0	රැස්කරන ලද වාර මුදල්	-	21.2	-	21.8
6.0	පශ්චාත් හිමිකම් අයකර ගැනීම්	-	0.7 (ඌ)	-	1.3

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) ව්‍යාපෘතියකට රුපියල් දශ ලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශ ලක්ෂ 2.0 රුපියල් දශ ලක්ෂ 2.0 - රුපියල් දශ ලක්ෂ 3.0 සහ රුපියල් දශ ලක්ෂ 3.0 - රුපියල් දශ ලක්ෂ 4.0 දක්වා වූ ණය සම්බන්ධයෙන් පිළිවෙලින් 80%, 60% සහ 40% ප්‍රමාණයන්.

(ඇ) එකතු වූ පොලිය ඇතුළත්ව, නොගෙවා පැහැර හරින ලද ණය ප්‍රමාණය.

(ඈ) සම්පූර්ණයෙන් සමථයකට පත්කරන ලද ලෙස දක්වා තිබූ රුපියල් දශ ලක්ෂ 0.4 ක වටිනාකමකින් යුත් ණය මුදල් 2 දැන් අර්ධව සමථයකට පත් කරන ලද ලෙස දක්වා ඇත.

(ඉ) අංක 4.1 යටතේ ඇතුලත් කරන ලදී.

(ඊ) අංක 2.1 යටතේ ඇතුලත් කරන ලදී.

(උ) සංශෝධිත

(ඌ) අයකරගත් ණය වාරික හැර

අඩු ආදයම් නිවාස වැඩසටහන - IV වැනි අදියර

1992 වර්ෂයේ ජුලි මාසයේදී ආරම්භ කරන ලද ඉහත වැඩපිළිවෙල යටතේ වූ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය 1996 වර්ෂය තුළදී ද නොකඩවා ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රධාන ණය දෙන ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියා කරයි. එක්සත් ජනපද රජයේ නිවාස ණය වැඩසටහනෙහි IV වැනි අදියර යටතේ ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කරනු ලැබූ ණය මුදල් මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය ප්‍රදානය කරනු ලබයි. අඩු ආදායම් නිවාස වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සමග ගිවිසුමකට එළඹ ඇති උප ප්‍රධාන ණය දෙන ආයතන වශයෙන් නම්කර ඇති සහභාගිත්ව ණය දෙන ආයතනවලට මෙම අරමුදල් ලබාදෙනු ලැබේ. ලංකා බැංකුව, මහජන බැංකුව,සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, සීමාසහිත සෙලාන් බැංකුව, සීමාසහිත ලංකා වාණිජ බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ කුරුණෑගල, මහනුවර, කෑගල්ල, පුත්තලම, ගාල්ල, බදුල්ල, ගම්පහ, මාතලේ සහ මාතර යන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මෙම යෝජනා ක්‍රමයෙහි උප ප්‍රධාන ණය දෙන්නන් ලෙස සහභාගී වේ. 1995 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී හම්බන්තොට, කළුතර, රත්නපුර සහ නුවරඑළිය යන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හතරද මෙම යෝජනා ක්‍රමයට සහභාගිවීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (ජා.නි.සං.අ.), ලංකා බැංකුව මගින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වේ.

මෙම යෝජනා ක්‍රමය යටතේ නිවාසයක් ඉදිකිරීම සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම, අළුතෙන් නිවාසයක් තැනීම, තිබෙන නිවාසයක් විශාල කිරීම, වැඩිදියුණු කිරීම සහ අළුත්වැඩියා කිරීම සඳහා ණය පහසුකම් ප්‍රදනය කෙරේ. රුපියල් 5,700/= ක් හෝ ඊට අඩු මාසික ආදායමක් ලබන කුටුම්භයන් මෙම යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලබයි.

1994 වර්ෂය දක්වා මෙම අඩු ආදයම් නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලද්දේ මහ භාණ්ඩාගාරයෙන් සපයන ලද රුපියල් දශ ලක්ෂ 150 ක අත්තිකාරම් මුදලක් පදනම් කරගෙනය. එක්සත් ජනපද ආර්ථික ආධාර වැඩසටහන් (USAID) සමග වූ ණය ගිවිසුමට අදල ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 25 ක ණය මුදලේ පළමුවැනි කොටස වශයෙන් ඇමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 10 (රුපියල් දශලක්ෂ 487) ක ණය මුදල් 1996 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී මුදහරින ලදී. 1995 වර්ෂයේ ජුනි මාසයේදී රුපියල් දශ ලක්ෂ 150 ක තවත් අත්තිකාරම් මුදලක් මහාභාණ්ඩාගාරය විසින් සපයන ලදී.

අඩු ආදයම් නිවාස වැඩසටහනෙහි IV වැනි අදියරෙහි ක්‍රියාකාරීත්වය අංක II- 9, II- 10, II- 11 සහ II- 12 යන සංඛ්‍යා සටහන්වලින් දක්වා ඇත.

1996 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රමය යටතේ වන ණය මුදල් සඳහා රුපියල් දශ ලක්ෂ 106 ක ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කරන ලදී. 1992 වර්ෂයේ සිට 1996 වර්ෂය දක්වා වන කාලපරිච්ඡේදයට අදාල සමුච්චිත

II-9 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් හා මුදාහැරීම්

රුපියල් දශලක්ෂ

උප ප්‍රධාන ණය දෙන ආයතන	අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය 1992 - 1996	මුදාහරින ලද ප්‍රතිමූල්‍ය 1992 - 1996
1. ලංකා බැංකුව	350.0	312.5
2. සීමාසහිත ලංකා වාණිජ බැංකුව	1.8	1.1
3. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව	5.3	4.7
4. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව	223.6	85.3
5. මහජන බැංකුව	262.3	179.3
6. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු	80.1	33.0
7. සීමාසහිත සෙලාන් බැංකුව	4.5	2.4
8. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	67.9	19.0
එකතුව	995.5	637.3

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සංඛ්‍යාවලට අනුව රුපියල් දශ ලක්ෂ 995 ක ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කර ඇති අතර, රුපියල් දශ ලක්ෂ 637 ක් මුදහැර ඇත.

මෙම යෝජනා ක්‍රමයෙහි ණයකරුවන්ගෙන් විශාල ප්‍රමාණයක් ග්‍රාමීය අංශයෙහි වූහ. එයින් 1995 වර්ෂයේ සියයට 88 ක සහ 1996 වර්ෂයේ සියයට 89 ක ණය ප්‍රමාණයක් අනුමත කර ඇත්තේ ග්‍රාමීය අංශයෙහි නිවාස කටයුතු උදෙසාය. ස්ත්‍රී පුරුෂ භාවය අනුව කරන ලද වර්ගීකරණයට අනුකූලව 1996 වර්ෂයේදී ග්‍රාමීය අංශයෙහි ණය කරුවන්ගෙන් සියයට 25 ක්ද, නාගරික අංශයෙහි සියයට 21 ක්ද කාන්තාවෝ වූහ. ණය ලබාගැනීමට සුදුසුකම් ලබන කාර්යයන්ට අනුව කරන ලද වර්ගීකරණයට අනුව 1996 වර්ෂයට තුළදී මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ලද ණය සංඛ්‍යාවෙන් සියයට 8 ක් පමන නව නිවාස ගොඩනැගීම සඳහා ද, සියයට 28 ක් නිවාස වැඩිදියුණු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා ද සියයට 63 ක් නිවාස තැනීම සඳහා ඉඩම් හිමිකර ගැනීම් සඳහා ද උපයෝගී කරගෙන ඇත. 1995 වර්ෂයේදී ඉඩම් හිමිකර ගැනීම් සඳහා ප්‍රදනය කරන ලද ණය මුදල් ප්‍රමාණය 1995 වර්ෂයේදී සියයට 40 වර්ධනයක් පෙන්නුම් කළ අතර 1996 දී එය සියයට 60 ක් විය.

II-10 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර - ප්‍රගති සාරාංශය - ණය අනුමත කිරීම් අරමුණ, කල්පිරීම සහ ප්‍රමාණය අනුව අනුමත කරන ලද ණය

(රුපියල් '000)

කාණ්ඩය	ණය අනුමත කිරීම් 1996			ණය අනුමත කිරීම් 1992 - 1996		
	නාගරික	ග්‍රාමීය	එකතුව	නාගරික	ග්‍රාමීය	එකතුව
අරමුණ						
නව නිවසක් ගොඩනැගීම	404	8,570	8,974	55,332	350,825	406,157
වැඩිදියුණු කිරීම්	2,665	26,614	29,279	50,432	237,424	287,856
ඉඩමක් හිමිකර ගැනීම	9,496	57,420	66,916	53,926	241,591	295,517
පසුතල පහසුකම් සංවර්ධනය	35	965	1,000	582	5,385	5,967
කල්පිරීම						
අවු. 5 සහ ඊට අඩු	3,277	34,576	37,853	49,395	350,898	400,293
අවු. 6 සිට අවු. 10 දක්වා	1,667	5,521	7,188	45,100	219,063	264,163
අවු. 11 සිට අවු. 15 දක්වා	7,656	53,472	61,128	65,478	264,105	329,583
අවු. 16 සිට අවු. 20 දක්වා	-	-	-	299	1,159	1,458
ප්‍රමාණය (රුපියල්)						
0 - 2,500	-	-	-	122	9,496	9,618
2,501 - 5,000	-	25	25	3,231	32,873	36,104
5,001 - 7,500	6	73	79	5,164	60,734	65,898
7,501 - 10,000	298	885	1,183	13,957	156,968	170,925
10,001 - 15,000	639	2,046	2,685	46,795	60,817	107,612
15,001 - 20,000	816	2,289	3,105	11,360	42,970	54,330
20,001 - 25,000	894	7,921	8,815	14,783	70,932	85,715
25,001 - 30,000	239	1,859	2,098	3,043	24,944	27,987
30,001 - 35,000	136	1,977	2,113	2,735	18,421	21,156
35,001 - 40,000	310	2,340	2,650	4,005	24,209	28,214
40,001 - 45,000	210	952	1,162	3,345	12,163	15,508
45,001 - 50,000	548	19,354	19,902	10,728	111,956	122,684
50,001 - 100,000	5,546	27,779	33,325	35,071	153,526	188,597
100,000 ට වැඩි	2,958	26,069	29,027	5,933	55,216	61,149
එකතුව	12,600	93,569	106,169	160,272	835,225	995,497

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

II-11 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර ණය අනුමත කිරීම් - පළාත් අනුව

(රුපියල් දශලක්ෂ)

පළාත	1996 ප්‍රමාණය	1996 ප්‍රතිශතය	1992-96 ප්‍රමාණය	1992-96 ප්‍රතිශතය
1. මධ්‍යම	18.5	17.5	152.8	15.3
2. නැගෙනහිර	0.7	0.7	21.3	2.1
3. උතුරු මැද	3.0	2.9	160.2	16.1
4. වයඹ	22.0	20.7	111.7	11.2
5. උතුර	-	-	4.4	0.4
6. සබරගමුව	13.5	12.7	91.8	9.2
7. දකුණ	16.7	15.7	132.0	13.3
8. ඌව	0.7	0.6	22.0	2.2
9. බස්නාහිර	31.0	29.2	299.2	30.2
එකතුව	106.2	100.0	995.5	100.0

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1995 වර්ෂය හා සසඳන කළ මෙම ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් අනුමත කර ඇති ණය ප්‍රමාණයන්හි සැළකිය යුතු වර්ධනයක් 1996 වර්ෂයේදී දක්නට ලැබිණ. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අදාල කාලපරිච්ඡේදය තුළදී ණය අනුමත නොමැත. මෙම යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය. මුදල් සංඛ්‍යාවන්හි ණය ආපසු ගෙවීමේ කාලසීමා රටාව අනුව සියයට 36 ක ණය මුදල් ප්‍රමාණයක් වසර 5 දක්වා වූ අතර, සියයට 7 ක් වසර 5-10 දක්වා කාලපරිච්ඡේදයක් සඳහා ද, තවත් සියයට 57 ක් වසර 10 - 15 දක්වා කාලපරිච්ඡේදයක් සඳහා ද විය.

සුමක සහ බම්ණ ණය සහතික අරමුදල් ආයෝජනය කිරීම

1988 වර්ෂයේ ජුලි මාසයේදී ආරම්භ කරන ලද සු.ම.ක. සහ බ.ම්.ණ. ණය සහතික ක්‍රම යටතේ වූ අරමුදල් ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙපොලෙහි ආයෝජනය කිරීම 1996 වර්ෂය තුළදීද නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. 1996 වර්ෂය අවසාන වනවිට අරමුදල්වල සහ ඇප ආවරණ වාරික රැස්කිරීම්වල මුළු ආයෝජන වටිනාකම රුපියල් දශ ලක්ෂ 1,042 ක් විය. මෙම ආයෝජනයන්ගෙන් එම කාලපරිච්ඡේදය තුළදී ලද පොළී ආදායම රුපියල් දශ ලක්ෂ 142.3 කි.

ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

සුළු කර්මාන්ත ක්ෂෙත්‍රයෙහි දැනට නියැලී සිටින කර්මාන්ත කරුවන්ගේ තාක්ෂණික, ශිල්පීය සහ කළමනාකරණ දක්ෂතාවයන් වැඩිදියුණු කිරීමේ අරමුණින් සකස් කරන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් මට්ටමින් 1996 වර්ෂය තුළදීද නොකඩවා පවත්වාගෙන යන ලදී.

1996 වර්ෂයේ නොවැම්බර් මස 28 වැනි දින සිට දෙසැම්බර් මස 01 වැනි දින දක්වා පොළොන්නරුවේ දී පැවැත්වූ වැඩමුළුව, රෙදිපිළි අංශයෙහි නියුක්ත කර්මාන්තකරුවන්ගේ කළමනාකරණ සහ ශිල්පීය දක්ෂතාවයන් වැඩිදියුණු කිරීම අරභයා පවත්වන ලද්දකි. මෙම වැඩමුළුවට සහභාගී වූ 35 දෙනා, සුළු පරිමාණ කරුවන් සහ ස්වයං රැකියාවල නියුක්තවූ අය වූහ.

සහභාගී වූවන් අතරෙන් ඇතැමුන් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලින් (ප්‍රා.ග්‍රා.සං.බැං.) ණය ලබාගෙන ඇති අතර, අනෙකුත් අය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලින් සහ අනෙකුත් වාණිජ බැංකුවලින් ණය ලබාගැනීමට අදහස් කරන අය වූහ. මෙම වැඩමුළුව පැවැත්වීම සඳහා අවශ්‍ය වූ මූල්‍ය පහසුකම් සුමක ණය යෝජනා ක්‍රමය මගින් ආවරණය වන්නාවූ ලෝක බැංකු තාක්ෂණික ආධාර වැඩපිළිවෙල යටතේ ලැබුණි.

II-12 වැනි සංඛ්‍යා සටහන
අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර - ණය අනුමත කිරීම් - අංශික සංයුතිය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව

රුපියල් '000

වර්ෂය	එකතුව		ග්‍රාමීය අංශය				නාගරික අංශය			
			පුරුෂ		ස්ත්‍රී		පුරුෂ		ස්ත්‍රී	
	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම	ණය මුදල් සංඛ්‍යාව	වටිනාකම
1992	4,273	27,381	2,977	19,205	1,244	7,445	39	523	13	208
1993	23,718	218,762	13,865	123,027	6,193	51,397	2,321	28,841	1,339	15,497
1994	22,733	338,291	13,317	195,544	5,669	73,466	2,600	50,223	1,147	19,057
1995	11,960	304,894	7,511	201,022	3,154	70,548	906	24,665	389	8,659
1996	2,136	106,169	1,397	72,121	455	21,448	224	10,068	60	2,532
එකතුව	64,820	995,497	39,067	610,919	16,715	224,304	6,090	114,320	2,948	45,953

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

රටේ වැවිලි කර්මාන්තය නගා සිටුවීමේ අදහසින්, වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට වි.ගැ.හි. දශ ලක්ෂ 40.8 ක් ලබාගැනීම සඳහා 1996 වර්ෂයේ ජනවාරි මස 12 වැනි දින ශ්‍රී ලංකා රජය ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැ.) සමග ණය ගිවිසුමකට අත්සන් තබන ලද අතර, එම ණය යෝජනා ක්‍රමය 1996 වර්ෂයේ මැයි මස 29 වැනි දින සිට ක්‍රියාවට නැංවිය.

මෙම ණය යෝජනා ක්‍රමයෙහි ප්‍රධානතම ණය දෙන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කළයුතු ක්‍රියාදාමයන්, මෙහෙයුම් උපදෙස් අංක සීබී/ ඩීඑෆ්/ පීඑස්ආර්පී/ 96 මගින් 1996.07.31 දින නිකුත් කරන ලදී. පුද්ගලිකරණය කරන ලද ප්‍රාදේශීය වැවිලි කර්මාන්ත සමාගම් (ප්‍රා.වැ.ස.) සහ ඒවායේ උප සමාගම් මෙම වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ සුදුසුකම් ලබන ණය ලබාගන්නා ආයතන වේ. මෙම වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ සුදුසුකම් ලබන ණය ලබාගන්නා ආයතන වේ. මෙම වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ සුදුසුකම් ලබන ණය ලබාගන්නා ආයතන වේ. මෙම වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ලැබෙන්නාවූ වි.ගැ.හි. දශ ලක්ෂ 40.8 න් වි.ගැ.හි. දශ ලක්ෂ 27.6 ක් ප්‍රාදේශීය වැවිලි කර්මාන්ත සමාගම් සඳහා ණය වශයෙන් ලබාදෙන අතර, නැවත වන වගා කිරීම ඉහළ නැංවීම, වතු සේවකයින්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම, වැවිලි කර්මාන්ත අංශයෙහි පුහුණුවීම් සහ ආයතනමය වශයෙන් එය ශක්තිමත් කිරීම සඳහා ඉතිරි මුදල් ප්‍රාදානයක් වශයෙනුත් ලබාදෙනු ඇත. මෙම ණය මුදල ආපසු අයකර ගැනීමේ කාලසීමාව වසර 40 ක් දක්වා වන අතර, එයට වසර 10 ක සහන කාලයක්ද අයත්වේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව, සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව මගින් ණය ලබාදීමේ අංශයෙහි විධානය කරන නියෝජිතයා වශයෙන් ක්‍රියාත්මක වෙන අතර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය එහි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය මගින් ණය ප්‍රදානයේ ව්‍යාපෘති අංශය සඳහා විධානය කරන නියෝජිතයා වශයෙන්ද කටයුතු කරනු ලැබේ.

II-13 වැනි සංඛ්‍යා සටහන
වැවිලි කර්මාන්ත ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය
අරමුණු අනුව ණය අනුමත කිරීම් - 1996

රුපියල් දශලක්ෂ

අරමුණු	ණය මුදල් ප්‍රමාණය	අනුමත ප්‍රමාණය (රුපියල්)
1. වෘක්ෂ භෝග සංවර්ධනය	5	164.5
2. සැකසුම් වැඩිදියුණු කිරීම සහ පරිසර දූෂණය වැලැක්වීම	5	152.0
3. සේවා වාහන සහ උපකරණ	5	112.0
මුළු අනුමතකිරීම් (අ)	15	428.5
ඉන් මුදාහැරීම් (අ)		57.8

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ඉහත වාර්තා කර ඇති පරිදි මුළු අනුමත කිරීම් හා මුදාහැරීම ජා. සං. බැංකුවට අදාල වේ.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතනයන් (ස.මූ.ආ.) වන්නේ සංවර්ධන මූල්‍ය සමායතනය, (සං.මූ.ස) ජාතික සංවර්ධන බැංකුව (ජා.සං.බැ.), ලංකා බැංකුව, සීමාසහිත ලංකා වාණිජ බැංකුව, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, සීමාසහිත සම්පත් බැංකුව, සහ සීමාසහිත සේලාන් බැංකුවය. මෙම වැවිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතනයන්ට දෙනු ලබන ණය වසර 5 ක උපරිම සහනදායී කාලයක් සහිතව වසර 15 ක් දක්වා වේ. මේ අනුව 1996 වර්ෂය තුළදී ණය අනුමත කිරීම් සහ ණය මුදාහැරීම්වල වටිනාකම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 428.6 ක් සහ රුපියල් දශ ලක්ෂ 57.8 ක් වේ. (II- 13 සංඛ්‍යා සටහන) මෙම වැවිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇප ආවරණ සහතිකද නිකුත් කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරනු ලබන ඇප ආවරණ සහතිකයෙන් සියයට 70 ක ආවරණයක් ප්‍රධාන වැවිලි බෝග සංවර්ධනය සඳහා වන ණය මුදල් වෙනුවෙන්ද, සියයට 50 ක ආවරණයක් සැකසුම් වැඩිදියුණු කිරීම් සහ පරිසර දූෂණය පාලනය වැඩිදියුණු කිරීම් සහ උපකරණ හා සේවා වාහන නඩත්තු කිරීම සඳහා වන ණය මුදල් වෙනුවෙන්ද ලබාදෙනු ඇත.

ව්‍යාපෘති පසුවිපරම් කිරීම් සහ පරීක්ෂා කිරීම්

සුමක ණය මුදල් ගෙවීම් පැහැර හැරීම් සහ ණය ආවරණය සඳහා වූ හිමිකම්පෑම් පිළිබඳව ව්‍යාපෘති පරීක්ෂා කිරීමේ කටයුතු 1996 වර්ෂය තුළදීද ක්‍රියාත්මක විය. සහභාගිත්ව ණය දෙන ආයතන (ස.ණ.ආ.) විසින් ණය ආවරණ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් සමථයකට පත්කිරීම සලකා බැලීම සඳහා ද, නිවැරදි කිරීමේ ක්‍රියා නිර්දේශ කිරීමේ අදහසින්ද, 1996 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් මෙවැනි ව්‍යාපෘති පරීක්ෂණ 65 ක් සිදු කරන ලදී.

1996 වර්ෂය තුළදී සිදුකරන ලද මෙම පරීක්ෂා කිරීම්වල විස්තරාත්මක ලේඛනයක්, අංක II- 14 සහ II- 15 සංඛ්‍යා සටහන් මගින් ඉදිරිපත් කෙරේ.

නිවැරදි කිරීමේ පිළිවෙතක් නිර්දේශ කිරීමේ අදහසින් පරීක්ෂා කරන ලද රුපියල් දශ ලක්ෂ 31. ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති 25 ක් සම්බන්ධ තොරතුරු II- 14 සංඛ්‍යා සටහන මගින් පෙන්නුම් කෙරේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ආවරණ සහතික ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් හරියාකාරව නොපිළිපැදීම හේතුවෙන් එක් ව්‍යාපෘතියකට නිකුත් කරන ලද ණය ආවරණය ඉවත්කර ගන්නා ලදී. එසේම සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ව්‍යාපෘති 12 ක් සඳහා සමීප අධීක්ෂණයක් කළයුතු බවටද, ව්‍යාපෘති 5 ක් සඳහා ණය ආපසු ගෙවීම ප්‍රතිලේඛනය කළයුතු බවටද නිර්දේශ කරන ලදී. හිග ණය මුදල් සම්පූර්ණයෙන්ම පියවා දැමීම සඳහා සහභාගිත්ව ණය දෙන ආයතන සහ ණයකරුවන් අතර එකගත්වයකට පැමිණීමට ව්‍යාපෘති තුනක් සම්බන්ධයෙන් මෙම පරීක්ෂා කිරීම් ඉවතල් විය.

1996 වර්ෂයේදී සහභාගිත්ව ණය දෙන ආයතන විසින් රුපියල් දශ ලක්ෂ 27.5 ක වටිනාකමකින් යුත් ණය මුදල් 40 ක් සඳහා ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් නිර්දේශ කිරීම සලකා බැලීමට ප්‍රථම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාල ව්‍යාපෘති පරීක්ෂාවට භාජනය කරන ලදී. ඒ අනුව සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ණය ආවරණ සහතික ක්‍රමයෙහි මෙහෙයුම්

II-14 වැනි සංඛ්‍යා සටහන
1996 වර්ෂයේ ව්‍යාපෘති පසුවිපරම් පරීක්ෂා කිරීම්
(හිඟහිටුවා ඇති ණය)

නිර්දේශ / ප්‍රතිඵල	ව්‍යාපෘති සංඛ්‍යාව	හිඟහිටුවා ඇති ණය මුදල්වල වටිනාකම (රුපියල් දශලක්ෂ)
1. ණය මුදල ප්‍රතිලේඛනගත කිරීමේ හැකියාවන් සොයා බැලීම	5	12.2
2. ණය මුදල යථාතත්ත්වයට පත්කිරීම	2	2.4
3. ණය ආවරණ සහතිකය ඉවත්කර ගැනීම	1	0.6
4. ණය මුදල සම්පූර්ණයෙන් ගෙවීමට ණයකරු කැමතිවීම	3	0.9
5. සහභාගිත්ව ණය දෙන ආයතනවලින් නිරීක්ෂණ ඉල්ලා සිටීම	2	4.5
6. සම්පස්ථ මූල්‍යමය පාලනයක් යෝජනා කිරීම	12	10.5
එකතුව	25	31.1

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

උපදෙස් නිසි පරිදි අනුගමනය නොකිරීම මෙන්ම ණය දීමේදී විචක්ෂණාව කටයුතු නොකිරීම නිසා හිමිකම්පෑම් 7 ක් ප්‍රතික්ෂේප කරන ලදී. ඒ අනුව සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ණය ආවරණ සහතික ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් නිසි පරිදි අනුගමනය නොකිරීම මෙන්ම ණය දීමේදී විචක්ෂණාව කටයුතු නොකිරීම නිසා හිමිකම්පෑම් 7 ක් ප්‍රතික්ෂේප කරන ලදී. තවද, හිමිකම්පෑම් 4 ක් ප්‍රතික්ෂේප කිරීම සඳහා සලකා බලා ඇති අතර, හිමිකම්පෑම් 4 ක් ඉදිරිපත් කිරීමෙන් පසු ණයකරුවන් විසින් පැහැර හරින ලද ණය යථා තත්ත්වයට පත්කිරීම නිසා එම හිමිකම්පෑම් ගෙවීම් අත්හිටුවන ලදී. සහභාගිත්ව ණය දෙන ආයතන විසින් ණය ආවරණ වෙනුවෙන් හිමිකම්පෑම් 3 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව, ණය කරුවන් විසින් ඒවා නැවත ගෙවීමට කටයුතු කරන ලදී. එසේම 1996 වර්ෂය තුළදී සහභාගිත්ව ණය දෙණ ආයතන විසින් ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් 9 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පූර්ණයෙන් ගෙවා නිමකරන ලද අතර, හිමිකම්පෑම් 5 ක් පියවීම සඳහාද, හිමිකම්පෑම් 8 ක් ප්‍රතික්ෂේප කිරීමට හෝ ගෙවා නිම කිරීමටද සලකා බලමින් පැවතින.

සුමක ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති බහුල වශයෙන් පිහිටා තිබූ දිස්ත්‍රික්ක වන්නේ කොළඹ, ගම්පහ, කුරුණෑගල, පුත්තලම, බදුල්ල, රත්නපුර, ගාල්ල සහ මාතර යන ඒවාය.

II-15 වැනි සංඛ්‍යා සටහන
1996 වර්ෂයේ හිමිකම්පෑම් පරීක්ෂා කිරීම්
(ණය සහතික සඳහා හිමිකම්පෑම් ලැබීමෙන් පසුව)

නිර්දේශ/ප්‍රතිඵලය	සංඛ්‍යාව	ණය මුදල (රුපියල් දශලක්ෂ)
1. ප්‍රතික්ෂේප කළ ණය සහතික හිමිකම්පෑම්	7	5.0
2. ණය සහතික හිමිකම්පෑම් ප්‍රතික්ෂේප කිරීම සලකා බලමින් පවතින	4	1.6
3. ණය සහතික හිමිකම්පෑම් තාවකාලිකව අත්හිටුවා ඇති	4	1.0
4. ණය සහතික හිමිකම්පෑම් සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ පසුව ණය මුදල ගෙවා නිම කළ	3	1.6
5. ණය සහතික හිමිකම්පෑම් සම්පූර්ණයෙන්ම ගෙවූ	9	2.5
6. ණය සහතික හිමිකම්පෑම් ගෙවීම් සලකා බලමින් පවතින	5	6.4
7. තීරණයක් නොගත් හිමිකම්පෑම්	8	9.4
එකතුව	40	27.5

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ග්‍රාමීය ණය

විමසුමට භාජනය වන වර්ෂය තුළදී සිය ණය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අමතරව විදේශ ආයතන මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් ක්‍රියා කළේය. මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතුවලට සහභාගීත්ව ණය දෙන ආයතන (ස.ණ.ආ.) ව්‍යාපෘතිවලට ඇතුළත් කරගැනීම, එම ආයතන වලට මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම, ව්‍යාපෘති යටතේ අනුමත වූ ණය සඳහා එම ආයතනවලට ප්‍රතිමූල්‍ය මුදහැරීම, ණය යෝජනා ක්‍රම මෙහෙයුම් හා සම්බන්ධීකරණය, ණය වාර්තා පවත්වාගෙනයාම හා අනෙකුත් දේශීය ආයතන හා සම්බන්ධ වී ණය යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම ඇතුළත් විය.

මහ බැංකුව විසින් 1996 දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පහත දැක්වේ.

(අ) ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ව්‍යාපෘති
- (i) කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය
- (ii) කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය
- (iii) බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය
- iv) දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය
- (v) වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

(ආ) කෘෂිකාර්මික සංවර්ධනය සඳහාවූ ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ් - IFAD) / කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය (සීඩා - CIDA) / ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සංවිධානය (සීඩා - SIDA) මගින් අරමුදල් සපයන ව්‍යාපෘති.
- (vi) සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය (ඉසුරු) ව්‍යාපෘතිය
- (vii) උතුරු මැද පළාත් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය.

(ඇ) ශ්‍රී ලංකා රජය මගින් අරමුදල් සපයන ව්‍යාපෘති
- (viii) කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය
- (ix) සුරතුර ණය යෝජනා ක්‍රමය - ස්වයං රැකියා සඳහා සුළු ණය.

(ඈ) විශේෂ ව්‍යාපෘති
- (x) ඉස්සන් වගා කරන්නන් සඳහා වන සහන ව්‍යාපෘතිය

(i) කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ලද මෙම යෝජනා ක්‍රමය සැලසුම් කරන ලද්දේ පවතින සිවිල් යුද්ධය හේතුකොට ගෙන උතුරු - නැගෙනහිර පළාත්වල විපතටපත් පුද්ගලයින් හා දේපල පුනරුත්ථාපනය කිරීම පිණිසය. ව්‍යාපෘතිය සඳහා විදේශ මූල්‍යකරණය 1996 ජූනි මස 30 දින අවසන් වුවත්, ණය ඇප ආවරණ ක්‍රමය පරිපාලනය කිරීම, ණය ආපසු අයවීමේ කටයුතු සුපරීක්ෂණය සහ ආපසු අයවීම්වලින් එකතු වූ මුදල් ව්‍යාපෘතිය යටතේ අනුමත කාර්යයන් සඳහා නව ණය මුදල් වශයෙන් ප්‍රතිචක්‍රීකරණය කිරීම ආදී කටයුතුවල ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් නිරත විය.

විමර්ශනයට භාජනය වන වසර තුළ කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘති ක්‍රමය යටතේ කිසිම ණය ඇප ආවරණ ඉල්ලීමක් සඳහා ගෙවීමක් කර නැත. විපතට පත් ප්‍රදේශවල සමහර ව්‍යාපෘති අසාර්ථකවීම හේතුවෙන් ණය ආපසු අයවීමේ ප්‍රතිශතය පහළ ගියද, සහභාගී වන ණය දෙන ආයතන විසින් 1996 වසර තුළදී ණය ආපසු අයකර ගැනීමේ ප්‍රතිශතය 65 - 72 අතර මට්ටමක පවත්වා ගැනීමට සමත් වී ඇත.

(ii) කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය

1989 වර්ෂයෙහි අරම්භ වූ කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතියටද, ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන අතර, එය 1997 වර්ෂයේදී අවසන්වීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය මගින් කුඩා ඉඩම් හිමියන්ගේ තේ නිෂ්පාදනය හා අපනයනය ඉහල නැංවීමත්, පෞද්ගලික තේ කම්හල්වල තේ වල ගුණාත්මක බව හා ඵලදායිතාව වැඩිදියුණු කිරීමත්, ග්‍රාමීය අංශයේ රැකියා අවස්ථා ඇති කිරීම සහ කුඩා ඉඩම් හිමියන්ට ලැබෙන රාජ්‍ය අනුග්‍රහ සේවාවන් ශක්තිමත් කිරීමත් අපේක්ෂා කෙරෙයි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කෙරෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙල සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කෙරෙන ණය වැඩ පිළිවෙල මගින් මෙම අරමුණු ලගාකර ගැනීමට බලාපොරොත්තු විය. ඇමරිකානු ඩොලර් දශලක්ෂ 12.6 ක් වන ණය සංරචකය මගින් ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු (තේ නැවත වගාව සහ අළුතින් වගා කිරීම), පැල තවාන් සංවර්ධනය සහ කර්මාන්ත ශාලා පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ආවරණය වේ. 1996 වර්ෂය අවසාන වන විට ණය සංරචකය යටතේ වෙන්කර තිබූ මුළු ප්‍රමාණය වෙනුවෙන්ම ඉහත කී කාර්යයන් සඳහා ණය අනුමත කර තිබුණි.

1995 වර්ෂයේදී සහභාගී වන ණයදෙන ආයතනයන්ගෙන් ණය අනුමත කිරීම් සහ මුදහැරීම් ඉතා ඉහළ මට්ටමකට පත්විය. එකී තත්ත්වය විමර්ශණයට භාජනය වන වර්ෂය තුළදී ද එලෙසම නොකඩවා පවත්වාගෙන යාමට හැකිවිය. ඇතැම්විට ණය සඳහා පැවැති ඉල්ලුම ඉහළයාමට හේතුවන්නට ඇත්තේ 1996 වර්ෂය තුළ තේ මිළ ගණන් ඉහලයාම විය හැකිය.

1996 වර්ෂය අවසන වන විට සහභාගී වන ණයදෙන ආයතන විසින් අනුමත කරන ලද සහ මුදාහරින ලද සමුච්චිත ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 751 ක් හා රුපියල් දශලක්ෂ 540 ක් විය. විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ අනුමත කරන ලද හා මුදාහරින ලද මුළු ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් මිලියට 280 ක් හා රුපියල් දශලක්ෂ 201 ක් විය. ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා (අළුතින් වගා කිරීම සහ නැවත වගාව) 1996 වර්ෂයේ දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 86

ක් වූ අතර, පැල තවාන් සංවර්ධනය සහ කර්මාන්ත ශාලා සංවර්ධනය සඳහා දෙන ලද ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 6 ක් සහ රුපියල් දශලක්ෂ109 ක් වේ. 1996 වර්ෂය අවසාන වන විට සහභාගී වන ණයදෙන ආයතන විසින් මුදාහරින ලද ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මුදාහරින ලද ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 379 ක් විය.

සමස්තයක් වශයෙන් ව්‍යාපෘතිය ලැබූ සතුටුදායක ප්‍රගතිය නිසා කුඩා තේ වතු අංශය වෙනුවෙන් නව ණය ක්‍රමයක් ලබාදීම සලකා බැලීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව කැමැත්ත ප්‍රකාශ කොට ඇත. 1996 වර්ෂයේදී මෙම දෙවන ව්‍යාපෘතිය සඳහා ප්‍රාථමික වාර්තාවක් සකස් කිරීම පිණිස ආසියානු සංවර්ධන බැංකුව විසින් තාක්ෂණික ඇගැයීම් කණ්ඩායමක් යොදවනු ලැබීය. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේද සහයෝගය ඇතිව ප්‍රතිලාභ අධීක්ෂණය කිරීමේ සමීක්ෂණයක් පැවැත්වූ අතර, කුඩා තේ ඉඩම් හිමියන් ස්ව ශක්තියෙන් නගා සිටුවීම සඳහා නව ඉතිරිකිරීම් ක්‍රමයක් ද හඳුන්වා දෙන ලදී.

(iii) බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතිය, 1996 වනවිට වසර 8 ක් සම්පූර්ණ කර ඇත. විශේෂයෙන් සුළු අපනයන බෝග හා පළතුරු භෝග ඇතුළු නිත්‍ය භෝගවල නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා එම භෝග වාණිජ භෝග බවට පත්කිරීම සඳහා සහනදායී පොලී අනුපාතයක් යටතේ ගොවීනට මැදිකාලීන ණය මුදල් සැපයීම සඳහා මෙම යෝජනා ක්‍රමය සැලසුම් කෙරිණ. රට තුළ, බහුවාර්ෂික භෝග ක්ෂේත්‍රයේ පසු අස්වනු මෙහෙයවීමේ සහ සැකසීමේ කාර්යයන් සඳහා නව තාක්ෂණය යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ව්‍යාපෘතිය විශේෂ අවධානය යොමුකරයි. මෙම ව්‍යාපෘතිය 1997 දෙසැම්බර් මසදී නිමාවීමට නියමිතය.

ව්‍යාපෘති බලප්‍රදේශ ව්‍යාප්ත කිරීම, නව සහභාගී ණය දෙන ආයතන ඇතුළත් කර ගැනීම ආදී මාර්ගයන්ගෙන් ව්‍යාපෘතිය තුළ 1995 සිදුකළ ප්‍රතිසංශෝධනයන් වල ප්‍රතිඵලයක් ලෙස මෙම යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් මුදහැරීම 1996 වර්ෂයේදී සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කර ඇත. 1996 වර්ෂය අවසානය වන විට අනුමත කරන ලද හා මුද හරින ලද සමුච්චිත ණය මුදල් ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 701.4 ක් හා රුපියල් දශලක්ෂ 527 ක් විය. ණය දෙන ආතනවලින් මුදාහරින ලද ණය මුදල්වලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදී ඇති සමුච්චිත ප්‍රතිමූල්‍ය ප්‍රමාණය 1996 වර්ෂය අවසන් වන විට රුපියල් දශලක්ෂ 427 ක් වේ. ණය ලබාගැනීම සඳහා ගොවීයන් විසින් කරන ලද විශාල ඉල්ලුම අතිරේක අරමුදල් ලබාදීමේ අවශ්‍යතාවය පෙන්නුම් කළේය. මේ පිළිබඳව හිතකර ප්‍රතිචාරයක් දැක්වූ ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතියේ භාවිතා නොකළ වෙනත් වැය ශීර්ෂයකින් වි.ගැ.හි. දශලක්ෂ 0.7 ක් ණය සංරචකය සඳහා ලබාදෙන ලදී.

ව්‍යාපෘති මගින් පෙන්නුම් කරන ලද සාර්ථකත්වයේ ප්‍රතිඵලයක් ලෙස, බහුවාර්ෂික භෝග යටතේ බීජ අංශය සඳහා වූ දෙවැනි ව්‍යාපෘති යෝජනාවක් සම්බන්ධව ආසියානු සංවර්ධන බැංකුවේ සැලකිල්ල යොමුවී ඇත. මෙම දෙවැනි ව්‍යාපෘතියට අදාල ක්ෂේත්‍ර අධ්‍යයන වාර්තා සැකසෙමින් 1996 දෙසැම්බර් මාසය වන විට පැවතුණි.

(iv) දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සපයන දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියෙහි කටයුතු 1992 වර්ෂයේදී ආරම්භ විය. ණය පහසුකම් ඇති කිරීම මගින් ව්‍යාපෘති බලප්‍රදේශයේ ආදායම් හා රැකියා අවස්ථාවන් ජනනය කිරීමෙන් දකුණු පළාතේ ජනතාවගේ ආදායම් හා ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. වි.ගැ.හි. දශලක්ෂ 6.4 (ආසන්න වශයෙන් රුපියල් දශලක්ෂ 450) ක මුළු ණය මුදලක් වෙන්කර ඇති මෙම ව්‍යාපෘතියේ ණය පහසුකම් සැපයීමේ මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි. ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ ගාල්ල, මාතර හා හම්බන්තොට ප්‍රදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහභාගී වන ණයදෙන ආයතන ලෙස ඇතුළත් කරගෙන ඇති අතර, දකුණු පළාත් සභාවේ පිහිටුවන ලද ව්‍යාපෘති කාර්යාලය එම කටයුතුවලට අවශ්‍ය සහාය ලබාදෙයි. මෙම ව්‍යාපෘතිය යටතේ වැලිගම වාර්ලි මවුන්ට් කාර්මික ජනපදයේ පිහිටි සුළු / මධ්‍යම පරිමාණ කර්මාන්ත සහ දකුණු පළාතේ අනෙකුත් සුළු / මධ්‍යම පරිමාණ ග්‍රාමීය ව්‍යාපාර වෙනුනේ සැපයෙන ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 1996 වර්ෂය තුළදී ණය දෙන ආයතන විසින් උප ණයකරුවන්ගෙන් අයකරන පොලී අනුපාතිකය සහ ප්‍රති මූල්‍ය පහසුකම් සඳහා අයකරන පොලී අනුපාතිකය පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 6 බැගින් නොවෙනස්ව පැවතුනි.

1996 වසර අවසන් වන විට මුදාහරින ලද ණය වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 144.3 ක් ලෙස වාර්තා කරමින් විමර්ශනයට භාජනය වන වර්ෂය තුළ සහභාගී වන ණයදෙන ආයතන ණය 958 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 65.9 ක ණය පහසුකම් සලසා ඇත. 1996 වර්ෂය තුළදී දෙන ලද ණය 958 ක් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් දශලක්ෂ 57.4 ක ප්‍රතිමූල්‍ය පහසුකම් ප්‍රදානය කර ඇත. ඒ අනුව 1996 වසර අවසාන වනවිට දෙන ලද ණය 4382 ක් වෙනුවෙන් මහ බැංකුව විසින් ලබාදී ඇති සමුච්චිත ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 127.2 වේ.

(v) වයඹ පළාතේ ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සපයනු ලබන මෙම ණය ව්‍යාපෘතියේ සිය තුන්වන වසර 1996 දී සම්පූර්ණ කළේය. කෘෂිකාර්මික වගා ලිං ඉදිකිරීම, උස්සාන වාරිමාර්ග උප ව්‍යාපෘති ඇරඹීම සහ වයඹ පළාතේ ග්‍රාමීය කාන්තාවන් සඳහා ආදායම් උත්පාදනය ස්වයං රැකියා ව්‍යාපෘති ඇති කිරීම වශයෙන් කොටස් තුනකින් සමන්විත මෙම ව්‍යාපෘතියේ ණය සංරචකය ක්‍රියාත්මක කිරීම පිණිස වි.ගැ.හි. දශලක්ෂ 1.6 (රුපියල් දශලක්ෂ 90) ප්‍රතිපාදන වෙන්කර තිබේ. ව්‍යාපෘතිය ආරම්භයේ සිට පුත්තලම සහ කුරුණෑගල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු දෙක සහ සී. / ස. හැටන් නැෂනල් බැංකුව සහභාගී වන ණය දෙන ආයතන වශයෙන් ඇතුළත් කරගෙන තිබූ අතර,

පසුව ලංකා බැංකුව හා මහජන බැංකුවද ඇතුළත් කර ගැනීම මගින් සහභාගිවන ණයදෙන ආයතන සංඛ්‍යාව තවත් වැඩි කරගන්නා ලදී.

1996 වර්ෂය අවසාන වනවිට කෘෂිකාර්මික ලිං 461 ක් සඳහා සඳහා රුපියල් දශලක්ෂ 15.1 ක්ද, වයඹ පළාතේ කාන්තාවන් සඳහා ස්වයං රැකියා උප ව්‍යාපෘති 819 ක් සඳහා රුපියල් දශලක්ෂ 10.4 ක්ද වශයෙන් සහභාගී ණයදෙන ආයතන විසින් ණය මුදල් මුදාහැර ඇත. උස්සාන වාරිමාර්ග උප ව්‍යාපෘති ආරම්භ වූයේ 1996 වර්ෂයේදී වන අතර, වර්ෂය අවසාන වනවිට ව්‍යාපෘති 24 ක් සඳහා රුපියල් දශලක්ෂ 0.7 ක් මුදාහැර තිබුණි. තවද 1996 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගී වන ණයදෙන ආයතනවලට ප්‍රතිමූල්‍ය වශයෙන් රුපියල් දශලක්ෂ19 ක් මුදාහැර ඇත.

(vi) සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය (ඉසුරු) ව්‍යාපෘතිය

1990 වර්ෂයේදී දියත් කරන ලද ඉසුරු ණය ව්‍යාපෘතිය සඳහා කෘෂිකාර්මික සංවර්ධන සඳහා වන ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ්), (ඇමරිකානු ඩොලර් දශලක්ෂ 6.7 කින්ද) කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (ක්‍රීඩා) (ඇමරිකානු ඩොලර් දශලක්ෂ 6.6 කින්) ද, ශ්‍රී ලංකා රජය (ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 4.1 කින්) ද ඒකාබද්ධ මූල්‍ය පහසුකම් සපයා ඇත. ගාල්ල. මාතර, මහනුවර හා පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි වෙසෙන දිළින්දන්ගෙන් දිළිඳුතම අයගේ දිළිඳු බව තුරන් කිරීම සඳහා අඩු වියදම්කාරී කාර්යක්ෂම ණය ක්‍රමයක් ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. එම අරමුණ ළඟාකර ගැනීම සඳහා කණ්ඩායම් ණය ක්‍රමයක් මගින් ශක්තිමත් කරනු ලබන බැංකු සම්බන්ධීකරණ වැඩ පිළිවෙලක් පදනම් කොට ගෙන මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, ව්‍යාපෘතියේ මෙහෙයුම් ආයතනය ලෙස කටයුතු කරයි.'

1996 වසරේදී ව්‍යාපෘතිය මගින් සහාය සැපයීම සඳහා අළුතින් පවුල් 5453 ක් අදාළ දිස්ත්‍රික්ක හතරෙන් ඇතුළත් කරගන්නා ලද අතර, එම වසර අවසානය වනවිට ව්‍යාපෘතිය යටතේ සේවා පහසුකම් ලබාගත් මුළු පවුල් සංඛ්‍යාව 45,843 දක්වා වැඩිවීමක් දක්නට ලැබුණි. එම මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් කණ්ඩායමක් සාමාජිකයින් 5-6 ක් පමණ සංඛ්‍යාවකගෙන් සමන්විත කණ්ඩායම් 7519 කට සංවිධානය වී ඇත. 1996 වසරේදී ප්‍රතිලාභීන් හට නිකුත් කරන ලද ණය සංඛ්‍යාව 5115 ක් වූ අතර, ඒ යටතේ වූ මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 52 ක් විය. එම වසර අවසානය වනවිට ව්‍යාපෘතිය විසින් නිකුත් කරන ලද මුළු ණය සංඛ්‍යාව ඒ අනුව 35,480 ක් දක්වාද, මුළු ණය ප්‍රමාණයෙහි වටිනාකම රුපියල් දශලක්ෂ 304 ක් දක්වාද, වැඩිවිය. ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ප්‍රතිලාභීන් අතර ඉතිරි කිරීමේ පුරුද්දක් සහ නැඹියාවක් ඇති කිරීමේ අරමුණ ඇතිව ඉතිරි කිරීමේ වැඩපිළිවෙලකට ඔවුන් සම්බන්ධ කර ගැණීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගන්නා ලදී. එම වැඩපිළිවෙලට අනුව 1996 වසර අවසානය වනවිට ප්‍රතිලාභීන් විසින් රැස්කරන ලද ඉතිරි කිරීම්වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 43 ක් විය. ව්‍යාපෘතිය විසින් ණය ආපසු අයකර ගැනීමේ සාමාන්‍ය අනුපාතිකය සියයට 91 ක මට්ටමෙහි අඛණ්ඩව පවත්වාගෙන ඇත.

ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ සාමාන්‍ය වැඩපිළිවෙල යටතේ ව්‍යවසායකත්ව පුහුණුව, භාණ්ඩ අලෙවිය, මූලික ගිණුම් පොත් පවත්වා ගැනීම පිළිබඳව පුහුණුව, සත්ත්ව පාලනය, කෘෂිකර්මය, තාක්ෂණික පුහුණු කිරීම් වැනි ශිල්පය කුශලතාවයන්හි ඉහළ නැංවීමේ පාඨමාලා ඇතුළත් පුහුණුවීම් ලබාදී ඇත. ඒ අනුව මෙම වර්ෂය තුළදී ප්‍රතිලාභීන් 6,102 ක් සඳහා එවැනි පුහුණු පාඨමාලා 225 ක් පවත්වා ඇත. ඒ අනුව 1996 වර්ෂය අවසානය දක්වා පුහුණුවීම් ලබා ඇති මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 36000 ක් විය.

ඉසුරු ව්‍යාපෘතිය තුළ 1996 වර්ෂයේ කැපී පෙනෙන සංවර්ධනයක් වූයේ එහි පොලී අනුපාතිකයන් පවත්නා වෙළෙඳපොළ අනුපාතිකයන්ට සමානුපාතිකව ඉහළ නැංවීමේ සංශෝධනයයි. ඒ අනුව 1996 අප්‍රේල් මාසයේදී කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් නිකුත් කරනු ලබන ණය සඳහා වාර්ෂික පොලී අනුපාතිකය සියයට 12 සිට 16 දක්වාද, කෘෂිකාර්මික නොවන කටයුතු වෙනුවෙන් නිකුත් කරනු ලබන ණය සඳහා පොලී අනුපාතිකය සියයට 16 සිට 20 දක්වා ද ඉහළ නංවන ලදී. තවද, ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීන්ගේ අභිවෘද්ධියට ඇතිවූ බලපෑම තක්සේරු කිරීම සඳහා මෙම වර්ෂය තුළදී ව්‍යාපෘති ප්‍රගතිය පිළිබඳ සමීක්ෂණයක් පවත්වන ලදී. එම සමීක්ෂණයේ ප්‍රතිඵල අනුව ව්‍යාපෘති සේවාවන් යටතේ ප්‍රතිලාභීන්ගෙන් සියයට 70 ක් පමණ විවිධ ආදායම් ඉපයීමේ කටයුතු ආශ්‍රිතව දරිද්‍රතා මට්ටම් ඉක්මවා ඇති බව පෙන්නුම් කෙරේ. කෙසේ වුවද, තවදුරටත් එම සමීක්ෂණය පෙන්නුම් කළේ එවැනි විශාල පිරිසක් සාර්ථක ප්‍රතිඵල ලබාගත්තද, ඔවුන්ගෙන් අඩක් පමණ තවමත් ස්වශක්තියෙන් නැගී සිටීමට ප්‍රමාණවත් කල්පවත්නා සංවර්ධනයක් ලබා නොමැති බවත්, එවැනි තත්ත්වයක් ඇති කර ගැනීම සඳහා ඔවුනට ව්‍යාපෘති සහාය තව ඉදිරියටත් අවශ්‍ය වන බවත්ය.

(Vii) උතුරු මැද පළාතේ සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල හා ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන අධිකාරිය සමග ශ්‍රී ලංකා රජය ඇතිකරගත් ණය ගිවිසුමට අනුකූලව මෙම ව්‍යාපෘතිය 1996 වර්ෂයේ ආරම්භ කරන ලදී. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක දිළිඳු ගොවි ජනතාව අතරින් වඩාත්ම දිළිඳු ජනතාවගේ දිළිඳු භාවය තුරන් කිරීම පිණිස ණය සංරචකයක්ද සහිතව ආරම්භකරන ලද ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස මෙය ක්‍රියාත්මක වේ. ජාතික සංවර්ධන භාර අරමුදල සතුව පවතින සම්පත් මාර්ගයෙන් මූල්‍යකරණය කරනු ලබන ණය සංරචකය අධීක්ෂණය කිරීමේ මෙහෙයුම් ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ඉලක්ක කරගත් පවුල් කාණ්ඩ සඳහා ආදායම් උත්පාදන වැඩ කටයුතු මාර්ගයෙන් එම ජනතාව දරිද්‍රතා මායිමෙන් ඉහළට ගෙනඒමත්, ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණ මට්ටම් වැඩිදියුණු කිරීම, ඔවුන්ගේ නිෂ්පාදන හැකියාව පහත හෙලන ආකාරයේ රෝග කාරක හා දුර්වල සෞඛ්‍ය තත්ත්වයන් මගහැරවීමත්ය. මේ අරමුණු මුදුන්පත් කර ගැනීමට හැකිවන සේ තෝරාගත්

රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් සහභාගි වන ආයතන වශයෙන් යොදාගෙන ඉලක්ක කරගත් පුද්ගලයන් සඳහා වූ සුළු ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මේ මගින් සිදුකරයි.

(Viii) කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය

කෘෂිකර්ම සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර අරමුදලෙහි මූල්‍ය සහයෝගිතාවය සහිතව පවත්වා ගෙන ආ කෑගල්ල දිස්ත්‍රික් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, 1995 දෙසැම්බර් මාසයේ නිමාවට පත්වූ අතර, සහභාගි වූ ණයදෙන ආයතන වෙතට ප්‍රතිමූල්‍ය නිදහස් කිරීමේ කටයුතු 1996 ජුනි මාසයේදී අවසන් කෙරිණි. මෙම ව්‍යාපෘතිය යටතේ 1995 අවසන් වන විට කෘෂිකාර්මික කටයුතු හා සුළු පරිමාණ කර්මාන්ත සඳහා මුදාහරින ලද ණය ප්‍රමාණය රුපියල් මිලියන 147 කි. 1996 ජුනි වනවිට මෙම අරමුදල් වලින් රුපියල් දශලක්ෂ 78.3 ක මුදලක් සහභාගි වන ණයදෙන ආයතන වෙතින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආපසු අයකරගෙන ඇත. ණය ගිවිසුම අනුව මෙම ව්‍යාපෘති ණය මුදලින් ආපසු අය වන මුදල් උපයෝගී කරගෙන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 'චක්‍රීය අරමුදලක්' පිහිටුවීමට හා පවත්වාගෙන යාමටත්, එමගින් ව්‍යාපෘතියෙහි ඉදිරි ණය කටයුතු නොකඩවා ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. 1997 මුල් භාගයේ සිට ණය මුදල් නිදහස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමේ අරමුණින් ඉහත සඳහන් කළ 'චක්‍රීය ණය අරමුදලක්' පිහිටුවීමේ මූලික පියවරයන් 1996 වසර නිමවන විට සම්පූර්ණ කරනු ලැබිය.

(ix) කුඩා ව්‍යවසාය ණය මගින් ස්වයං රැකියා දිරිගැන්වීම් වැඩසටහන - සුරතුර - දිරිය වැඩසටහන

ශ්‍රී ලංකා රජය විසින් උගත් තරුණ කොටස්වල විරැකියාව තුරන් කිරීමේ අරමුණ ඇතිව ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් 1996 සැප්තැම්බර් මාසයේදී දිවයින පුරා ආරම්භ කරන ලදී. 'සුරතුර දිරිය' වැඩසටහන නමින් හඳුන්වනු ලබන මෙම ව්‍යාපෘතිය රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ඇත. මහජන බැංකුව, ලංකා බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව සහභාගී වන ණය දෙන ආයතන වශයෙන් කටයුතු කරනු ඇත. සුදුසු ණයලාභීන් සඳහා සහභාගි වන ණයදෙන ආයතන මගින් සපයුන ලබන සහන ණය වෙනුවෙන් ලබාදීම සඳහා රුපියල් දශලක්ෂ 350 ක් ශ්‍රී ලංකා රජය විසින් 1997 වර්ෂය සඳහා වූ අයවැයි ලේඛණය මගින් ප්‍රතිපාදනය කර ඇත.

සුරතුර දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ එක් පුද්ගලයෙකුට උපරිම වශයෙන් රුපියල් 50,000/= දක්වා ණය මුදලක් හෝ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා රුපියල් 250,000/= දක්වා ණය මුදල් ඔවුන්ගේ කැමැත්ත පරිදි තෝරාගනු ලබන ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ලබාගත හැකිය. ණය මුදල් ආපසු ගෙවීමද අවුරුදු එකක කාලයක්ද සහිතව අවුරුදු 3 කදී සිදුකළ යුතුය. ක්‍රමවත්ව ණය ආපසු ගෙවීමේදී වාර්ෂික පොලිය සියයට ක් වන අතර, අක්‍රමවත්ව ආපසු ගෙවීම් සඳහා සියයට 12 ක පොලී ප්‍රතිශතයක් ගෙවිය යුතුය. ණය ආපසු ගෙවීමට පෙළඹවීම සඳහා පවුලේ අයෙකු ඇපකරු වශයෙන් සහතික විය යුතුය. මෙම ව්‍යාපෘතිය යටතේ 1996 වර්ෂය අවසාන වනවිට ණය මුදල් 2400 ක් සඳහා රුපියල් දශලක්ෂ 78 ක මුදලක් ණයලාභීන් වෙත මුදාහැර තිබෙන අතර, ණය මුදලේ සාමාන්‍යය රුපියල් 32,500/= කි.

(x) ඉස්සන් වගාවේ නියුතු වූ අය සඳහා වූ සහන ක්‍රමය

විමර්ශණයට භාජනය වන වර්ෂය තුළදී, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදී, සුදුපුල්ලි වෛරස් වසංගත රෝගයෙන් පීඩාවට පත් ඉස්සන් වගා කළ ගොවීන්ට විශේෂිත සහන ක්‍රියාමාර්ගයක් ලබාදීම පිණිස ණයදෙන බැංකු සමග සාකච්ඡා කිරීමට ලංකා මහ බැංකුව මැදිහත් විය. 1996 වර්ෂය මුල් භාගයේදී පමණ මෙම රෝග තත්ත්වයන් ඇති වූ අතර, වයඹ පළාතේ වෙරළබඩ තීරයේ අක්කර 3000 ක පමණ ඉස්සන් වගා කරන ප්‍රදේශ මෙම ව්‍යසනයෙන් දැඩි ලෙස උවදුරට ලක්වී විනාශ වී ඇත. හදිසියෙන් ඇතිවූ මෙම තත්ත්වයන් නිසා ශ්‍රී ලංකාවේ වාර්ෂිකව රුපියල් බිලියන 2ක පමණ විදේශ විනිමය උපයන සම්ප්‍රදායික නොවන අපනයන කර්මාන්තයක් වන ඉස්සන් වගා කිරීමේ කර්මාන්තයට දැඩි පහරක් එල්ල විය. පීඩනයට පත්වූ ඉස්සන් පොකුණු සඳහා ලබාදී තිබුණු ණය සම්බන්ධයෙන් අදාල ගොවීන්ගේ ප්‍රශ්න වෙන වෙම සලකා බැලීමේ පදනම මත හඳුන්වා දුන් සහන වැඩපිළිවෙල යටතේ ණය සඳහා සුවිශේෂිත සහන කාලයක් සහ එයින් පසුව සහනශීලී පොලියක් මත ණය ප්‍රතිලේඛනගත කිරීමක් ලබාදී ඇත. තවද, එම පොකුණු පුනරුත්ථාපනය කරගැනීමට නව ණය පහසුකම් ලබාදීමට ඒ යටතේ යෝජනා කර ඇත.

1996 ජුනි මාසයේ සිට ක්‍රියාත්මක වන මෙම යෝජිත සහන වැඩපිළිවෙල මගින් එදින දක්වා ලබාදී තිබුණු රුපියල් මිලියන 750 ක පමණ ණය ප්‍රමාණයකට ආවරණය සලසා ඇත.

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු

ග්‍රාමීය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සහාය වෙමින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල (ප්‍රා.ග්‍රා.සං.බැං.) වැඩ කටයුතු 1996 වර්ෂය තුළදී තවදුරටත් පුළුල් විය. කෘෂිකර්මාන්ත, ධීවර, ගෘහ හා සුළු පරිමාණ කර්මාන්ත, වාණිජ කටයුතු සහ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පහසුකම් ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් සපයනු ලැබේ. කෙසේ වෙතත් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සේවකයන් විසින් 1996 වර්ෂයේ පළමු මාස කීපය තුළදී ගෙනයන ලද වෘත්තිය සමිති ක්‍රියාමාර්ග බැංකුවල එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කළේය.

ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ශාඛා ව්‍යාප්තිය

1996 වර්ෂය අවසානය වනවිට ක්‍රියාකාරීව පැවැති මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 17 ක් ලෙස නොවෙනස්ව පැවතිනි. වර්ෂය තුළදී මහනුවර (හැදෙනිය), කළුතර (මතුගම), ගම්පහ (මීගමුව) සහ මාතර (නගර ශාඛාව) යන ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් නව ශාඛා 4 ක් ප්‍රා.ග්‍රා.සං. බැංකු පද්ධතියට එක්කරනු ලැබිණි. 1995 දී 171 ක් වූ ප්‍රා.ග්‍රා.සං. බැංකුවල මුළු ශාඛා ප්‍රමාණය 1996 දී 175 දක්වා ඉහළ යන ලදී. (සංඛ්‍යා සටහන 11)

තැන්පතු සංචලනය

ඉතිරි කිරීම් සංචලනය කිරීම පිණිස ප්‍රා. ග්‍රා. සං. බැංකු විසින් පසුගිය වර්ෂවලදී සිත්ගන්නා සුළු ඉතිරි කිරීමේ යෝජනා ක්‍රම කීපයක් සහ ග්‍රාමීය ප්‍රදේශවල ජංගම බැංකු සේවාවන් හඳුන්වා දී තිබුණි. සේවකයින් විසින් ගෙන ගිය වෘත්තිය .සමිති ක්‍රියාමාර්ග නිසා, 1995 අවසානයේදී

II-16 සංඛ්‍යා සටහන

ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු ශාඛා ව්‍යාප්තිය

නම	ආරම්භ කළ දිනය	ප්‍රධාන කාර්යාල පිහිටි ස්ථානය	විවෘත කළ ශාඛා සංඛ්‍යාව								1996 අවසානයට එකතුව
			1985-1989	1990	1991	1992	1993	1994	1995	1996	
කළුතර	85.07.13	බුලත්සිංහල	12	-	1	2	-	-	-	1	16
මාතර	85.07.13	මාතර	8	-	-	4	-	-	-	1	13
කුරුණෑගල	85.08.10	කුලියාපිටිය	14	1	-	2	-	-	-	-	17
අනුරාධපුරය	85.08.12	අනුරාධපුරය	7	-	3	1	-	-	-	-	11
හම්බන්තොට	86.12.13	අම්බලන්තොට	6	1	-	1	-	-	-	-	8
කෑගල්ල	87.02.08	කෑගල්ල	11	1	(1)	1	1	1	-	-	14
පුත්තලම	87.07.11	හලාවත	6	2	1	1	-	-	-	-	10
ගාල්ල	87.08.17	ඇල්පිටිය	9	-	-	3	-	-	-	-	12
මහනුවර	87.10.13	නුවර	9	2	-	2	-	-	1	1	15
නුවරඑළිය	88.10.10	නුවරඑළිය	4	2	-	2	-	-	-	-	8
මොණරාගල	88.10.13	බුත්තල	3	1	2	-	-	-	-	-	6
බදුල්ල	90.10.13	බදුල්ල	-	4	2	3	-	4	-	-	13
පොලොන්නරුව	91.05.17	පොලොන්නරුව	-	-	4	2	1	-	-	-	7
මාතලේ	91.06.21	මාතලේ	-	-	5	2	-	-	-	-	6
රත්නපුර	91.09.30	රත්නපුර	-	-	4	1	1	-	-	-	7
අම්පාර	92.02.24	අම්පාර	-	-	-	5	2	-	-	-	7
ගම්පහ	93.06.7	ගම්පහ	-	-	-	-	2	1	1	1	5
එකතුව			89	14	21	32	7	6	2	4	175

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පැවැති මුළු තැන්පතු ප්‍රමාණය හා සැසඳීමේදී 1996 පළමු භාගය අවසානයේදී මුළු තැන්පතු රුපියල් දශලක්ෂ 1,851 දක්වා සියයට 5 ක අඩුවීමක් වාර්තා විය. වර්ෂයේ පළමු භාගය තුළදී මෙවැනි පසුබෑමක් තිබියදීත් තැන්පතු සංචලනයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරමින් වර්ෂය අවසාන වන විට සමස්ත තැන්පතුවල සියයට 4.6 ක වැඩිවීමක් වාර්තා විය. 1996 වර්ෂය අවසානයේදී සමස්ත තැන්පතු ප්‍රමාණය ගිණුම් 993,627 කට අදාළව රුපියල් දශලක්ෂ 2,035 ලෙස පැවතුණි. මුළු තැන්පතු වලින් විශාල ප්‍රමාණයක් ඉතිරිකිරීම් තැන්පතු වූ අතර, එය ගිණුම් 979,626 යටතේ රුපියල් දශලක්ෂ 1,595 ක් විය. ඉතිරි කිරීම් ගිණුමක සාමාන්‍ය තැන්පතු ශේෂය 1995 දී රුපියල් 1,728 සිට 1996 දී රුපියල් 1,628 දක්වා පහත වැටීමක් පෙන්නුම් කළ අතර ස්ථාවර තැන්පතු ගිණුමක සාමාන්‍ය වටිනාකම 1995 දී රුපියල් 37,490 සිට 1996 රුපියල් 43,160 දක්වා වැඩිවීමක් පෙන්නුම් කරයි.

ණය දීම

ඉකුත් වර්ෂයේදී මුදාහරින ලද ණය හා අත්තිකාරම්වල වටිනාකම වූ (341,732 ක් ණය මුදල් සම්බන්ධයෙන්) රුපියල් දශලක්ෂ 2055 හා සැසඳීමේදී සැළකිල්ලට භාජනය වූ වර්ෂය තුළ මුදාහරින ලද ණය හා අත්තිකාරම්වල (345,028 ක් සම්බන්ධයෙන්) වටිනාකම රුපියල් දශලක්ෂ 2294 ක් විය. 1995 වර්ෂයේ රුපියල් 6,012 ක් වූ ණය මුදලක සාමාන්‍යයවටිනාකම 1996 වර්ෂයේදී රුපියල් 6,649 දක්වා ක්‍රමික වැඩිවීමක් පෙන්විය. සමස්ත තැන්පතු සියයට 5 වැඩිවීමක් පමණක් පෙන්නුම් කළ මෙම වර්ෂය තුළදී මුදාහරින ලද ණය හා අත්තිකාරම් සියයට 12 පමණ වැඩිවීමක් පෙන්නුම් කරයි. ප්‍රා.ග්‍රා.ස. බැංකු සේවක සංගමය සමග ඇති කරගත් එකගතාවයෙන් පසුව බැංකුව කෙරෙහි ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය නැවත දිනා ගැනීමටත්, ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව වැඩිකර ගැනීමටත් ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් දෙන ලද ණය හා අත්තිකාරම් ප්‍රමාණය තවදුරටත් ව්‍යාප්ත කළා විය හැකිය. කෙසේ වෙතත්, වර්ෂය අවසාන වන විට වඩාත් ප්‍රවේශම්කාරී ණය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ප්‍රා.ග්‍රා.සං. බැංකු යොමු වී තිබිණ. ගුරුවරුන් සඳහා වූ විශේෂ ණය යෝජනාක්‍රමය, සමෘද්ධිලාභීන්ට ස්වයං රැකියා සඳහා ණය යෝජනා ක්‍රමය සහ දකුණු කොරියාවේ රැකියා සඳහා තෝරාගත් පුද්ගලයන් සඳහා වූ ණය පහසුකම් වැනි විවිධ ණය යෝජනා ක්‍රම යටතේ තවදුරටත් මූල්‍ය පහසුකම් වර්ෂය තුළදී ප්‍රදානය කරන ලදී.

අනෙකුත් කටයුතු

තමන් වෙත පැවරී ඇති ග්‍රාමීය ආර්ථිකයේ සංවර්ධනය සඳහා වන සිය කාර්යභාරය ඉටු කිරීම පිණිස ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් සිය ගනුදෙනුකරුවන් වෙත උපකාරක සේවාවන් සැපයීමට තවදුරටත් පියවර ගන්නා ලදී. කළමනාකරණ ශිල්ප ක්‍රම හා නව තාක්ෂණය පිළිබඳව දැනුමක් ලබාදෙන ක්‍රියාත්මක අධ්‍යාපන වැඩපිළිවෙලක් මගින් ගනුදෙනුකරුවන් උනන්දු කළ හැකි නිසා සමෘද්ධිලාභීන් ඇතුළු සිය ගනුදෙනුකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමේ කටයුතු සම්බන්ධීකරණය කරමින් ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් උපදේශාත්මක සහායන් ද ලබාදුනි. මූල්‍ය පහසුකම් ද සමග ඒකාබද්ධ වූ මෙවැනි වැඩපිළිවෙලවල් ග්‍රාමීය අංශයේ ඵලදායිතාවය වැඩි කිරීමට උපකාරී විය.

ප්‍රා.ග්‍රා.සං. බැංකුවලින් ලබාගත හැකි බැංකු සේවා පහසුකම් පිළිබඳව දැනුමක් ලබාදීමට මෙන්ම ණය පහසුකම් ලබාදීම සඳහා ගම්මානවල ජනහමු පැවැත්වීමේ කටයුතු මෙම බැංකු විසින් තවදුරටත් පවත්වාගෙන යන ලදී. තවද, ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් කෘෂි නිෂ්පාදන සැකසීම හා අලෙවිකරණ කටයුතු වැඩිදියුණු කිරීමට තවදුරටත් පියවර ගන්නා ලදී.

කුඩා තේ වතු සංවර්ධන ණය යෝජනා ක්‍රමය, බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමෙරිකා එක්සත් ජනපද නියෝජ්‍යායතනයෙහි අඩු ආදායම් නිවාස වැඩසටහන, දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, වයඹ පළාත් ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය සහ ඉසුරු ව්‍යාපෘතිය යන ණය යෝජනා ක්‍රමවල සහභාගිත්ව ණය දෙන ආයතනයන් ලෙස ප්‍රා.ග්‍රා.සං. බැංකු ක්‍රියා කළහ.

ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

1996 වසරේ ජනවාරි මාසයේ ශ්‍රී ලංකා මහ බැංකුව මුහුණ දුන් ඛේදවාචකය සිද්ධියත් සමග එහි සියලුම දෙපාර්තමේන්තු ස්ථානගත කොට පහසුකම් සැපයීමට මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් කටයුතු යොදන ලදී. මෙවැනි බාධාවන් මධ්‍යයේ වුව ද ආසියානු ශාන්තිකර කලාපීය කෘෂිකාර්මික ණය සංවිධානයේ කළමනාකරණ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් ඇතුළුව වැඩසටහන් 15 ක් නිම කිරීමට විද්‍යාලයට හැකි විණි. මෙම වැඩසටහන් 15 පුහුණු පාඨමාලා 8 කින්ද, සම්මන්ත්‍රණ 4 කින් හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන් 3 කින් ද සමන්විත විය. මීට අමතරව, සුළු ගොවීන් හා ඉඩම් නොමැති අයවලුන්ගෙන් ණය යෝජනා ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන් 35 ක් මාතර, ගාල්ල, පුත්තලම හා මහනුවර යන දිස්ත්‍රික්කවල පවත්වන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව හා පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය අනුග්‍රහයෙන් "සඵල රාජ්‍ය ණය කළමනාකාරිත්වය" නමින් පැවැත්වූ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන සඳහා විද්‍යාලයෙන් සුවිශේෂ සහයෝගයක් ලබාදුනි.

මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ පිහිටුවා ඇති පර්යේෂණ හා සංවර්ධන අංශය විසින් පහත දැක්වෙන කාර්යයන් 1996 වසරතුළ නිම කරන ලදී.

(අ) 1994 සිට 1996 දක්වා විද්‍යාලය විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන්වලට අදාලව ඒවාට සහභාගි වූවන් (ඔවුන්ගේ නිරීක්ෂණ) සහ ඔවුන්ගේ ඇගැයීම් සම්පත් දායකයින්, සහ පාඨමාලා සංවිධායකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් දත්ත පදනමක් ගොඩ නැගීම;

(ආ) පුහුණු අවශ්‍යතා ඇගැයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, වාණිජ බැංකු, සංවර්ධන බංකු, ආයෝජන සහ වණික් බැංකු සහ අනෙකුත් බැංකු නොවන මුල්‍ය ආයතන ආවරණය වන පරිදි පුහුණු අවශ්‍යතා විශ්ලේෂණ සමීක්ෂණයක් පවත්වන ලද අතර එම සමීක්ෂණයේ සොයාගැනීම් පදනම් කොට ගෙන නව වැඩසටහන් කිහිපයක් යෝජනා කෙරිණි.

වසර තුළ විද්‍යාලයීය පුස්තකාලය විසින් ග්‍රන්ථ 175 ක් මිලදී ගත් අතර, දේශීය හා විදේශීය සඟරා 55 ට දායකත්වය ලබාගන්නා ලදී. කෙසේ වුවද, 1996 වසර තුළ වෙනත් දෙපාර්තමේන්තු පුස්තකාල පරිශ්‍රයෙහි ස්ථාන ගත කළ බැවින්, එය නිසි ලෙස පවත්වා ගැනීම අසීරු විය.

මහ බැංකුවේ සියලු දෙපාර්තමේන්තු මුළු විද්‍යාලයීය ගොඩනැගිල්ලේම ස්ථානගත කළ බැවින්, ඉංග්‍රීසි භාෂා පිළිබඳ ස්වයං සේවා මධ්‍යස්ථානය බලාපොරොත්තු වූ පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

සේවක අර්ථසාධක අරමුදල (සේ. අ. අ.)

බෝම්බ ප්‍රහාරයට අනතුරුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව නැවත පිහිටුවීම

1996 ජනවාරි මස 31 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව අබියස සිදුවූ බෝම්බ පිපිරීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ පරිගණක දත්ත සහ ලිපි ලේඛන බොහොමයක් විනාශ විය. එහෙත් සාමාජිකයන්ගේ දායක දීමනා දැක්වෙන මුල් ලිපිගොනු බේරා ගැනීමට හැකි වූ අතර, එම ලිපි ලේඛන බත්තරමුල්ලේ, කෙළින් විදියේ, අංක 64 දරණ ස්ථානයේ පිහිටි නව කාර්යාලය වෙත ගෙන යන ලදී. ප්‍රථමයෙන් මිනිස් ශ්‍රමය උපයෝගී කොට අරමුදලේ වැඩ කටයුතු ආරම්භ කරන ලද අතර, ඉන්පසු තාවකාලික පරිඝණක යන්ත්‍ර මාර්ගයෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කිරීම නැවත අරඹන ලදී. ඇමරිකා එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනය විසින් පරිත්‍යාග කරන ලද අයි.බී. එම්. ඒ. ඇස්. (IBM AS) 400 පරිගණක යන්ත්‍රය සඳහා මෘදුකාංග වැඩිදියුණු කිරීම දෙපාර්තමේන්තුව විසින් දැනට කරගෙන යනු ලැබේ.

සේවක අර්ථසාථක අරමුදල් පනතේ විධිවිධානයන්ට අනුව එම අරමුදලට කෙරෙන දායක මුදල් සහ අධිභාර මුදල් ලබා ගැනීම, අරමුදල සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම් ලබා ගැනීම, අරමුදලේ ලියාපදිංචි සේව්‍යයන්ගේ හා ඒ ඒ සාමාජිකයන්ගේ ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වාගෙන යාම, ප්‍රතිලාභ මුදල් සාමාජිකයන් වෙත ආපසු ගෙවීම් යන වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, විසින් අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු භාරව සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමග සමීප සහයෝගීතාවයකින් යුතුව මෙම කටයුතු කරන ලදී.

දායක මුදල්

තාවකාලික දත්තයන්ට අනුව, 1995 වර්ෂයේදී ලැබූ රුපියල් බිලියන 8.2 හා සසඳා බලන කළ 1996 වර්ෂය තුළදී අරමුදලට ලැබුණු දායක මුදල් ප්‍රමාණය, රුපියල් බිලියන 9.9 ක් විය. එය පෙර වර්ෂයේ ලැබූ දායක මුදල් මට්ටමට වඩා සියයට 20.7 ක වැඩිවීමකි.

සාමාජිකයින්ගේ ශේෂ

විමසුමට ලක්වන වර්ෂය සඳහා පොළී එකතු කිරීමට පෙර, 1996 දෙසැම්බර් 31 වැනි දිනට සාමාජිකයින්ගේ ශේෂයන්හි මුළු වටිනාකම රුපියල් බිලියන 102 ක්ව පැවැති අතර, එය 1995 වර්ෂයට වඩා රුපියල් බිලියන 17 ක හෙවත් සියයට 20 ක වැඩිවීමකි.

ආයෝජන

විමසුමට ලක් කරන වර්ෂය තුළදී අරමුදල මගින් රජයේ සුරැකුම්පත්, භාණ්ඩාගාර බිල්පත්, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි සහ රජයේ වගකීම් සහිත ණයකරවල ආයෝජනය කරන ලද මුදල රුපියල් බිලියන 53 ක් වේ. මෙය 1995 දී පැවැති ආයෝජන මට්ටමට වඩා රුපියල් බිලියන 8 ක වැඩිවීමකි. 1996 දෙසැම්බර් 31 වැනි දිනට අරමුදල සතු මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 116 ක ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1995 දී පැවැති මුළු ආයෝජන මට්ටමට වඩා රුපියල් බිලියන 20 ක වැඩිවීමකි.

ආයෝජන වලින් ලැබූ ආදායම

1989 දේශීය ආදායම් පනතේ සංශෝධනයට අනුව සේවක අර්ථසාධක අරමුදලට ප්‍රදානය කර තිබූ ආදායම් බදු නිදහස ඉවත් කරන ලදී. මේ අනුව, 1989 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයෝජන මගින් උපයන ආදායම් සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත් වේ. 1996 වර්ෂය සඳහා ආයෝජන ආදායමෙන් අඩු කරන ලද රඳවා ගැනීමේ බද්ද සහ වර්ෂය තුළ ගෙවන ලද හිඟ මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 1.5 ක් විය.

1995 වර්ෂයේ ආයෝජන මගින් ලැබූ රුපියල් බිලියන 14 ක ආදායම සසඳා බැලීමේදී, 1996 වර්ෂයේදී ආයෝජන මගින් ලද ආදායම රුපියල් බිලියන 16 ක් විය.

ප්‍රතිලාභ ආපසු ගෙවීම

1995 වර්ෂය තුළදී සාමාජිකයන්ට සේ.අ.අ. ප්‍රතිලාභ ආපසු ගෙවීම් වශයෙන් ගෙවන ලද මුළු මුදල රුපියල් බිලියන 2.7 ක් වූ අතර, එය 1996 වර්ෂයේදී රුපියල් බිලියන 3.0.ක් විය. මෙය සියයට 11 ක වැඩි වීමක් වාර්තා කරයි. 1995 වර්ෂයේදී ගෙවා නිම කරන ලද 52,258 ක් වූ ප්‍රතිලාභ සංඛ්‍යාව හා සසඳන කළ 1996 වර්ෂය තුළදී 66236 ක ප්‍රතිලාභ හිමිකම් පෑම් සඳහා ගෙවීම් කරන ලදී.

ප්‍රතිලාභ ගෙවීම් කඩිනම් කිරීමේ හා වියදම් පිරිමැසීමේ අරමුණ ඇතිව මහජන බැංකුව මාර්ගයෙන් ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයට මෙම දෙපාර්තමේන්තුවද, 1996 ජුනි මස මැද භාගයේ සිට සම්බන්ධ වී ඇත.

සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය යෝජනා ක්‍රමය

සාමාජිකයන්ගේ ගිණුම්වල බැරට ඇති ශේෂයන්ගෙන් සියයට 75 ක් දක්වා නිවාස තැනීමේ කටයුතු වෙනුවෙන් තෝරාගත් ණය දෙන ආයතනවලින් ණය ලබාගත හැකි වන පරිදි 1988 අංක 42 දරණ පනතින් සේ. අ. අරමුදල් පනත සංශෝධනය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය සඳහා සහභාගී වන ණය දෙන ආයතන වනුයේ, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ සමුපකාර ග්‍රාමීය බැංකුව ය.

1996 දෙසැම්බර් 31 වන දිනට සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත ශේෂයන් තහවුරු කිරීම සඳහා ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන්, අයදුම්පත් 67,088 කටයුතු අවසාන කොට අදාළ කම්කරු කාර්යාලයන් වෙත යවන ලදී.

විනිමය පාලන

1996 වර්ෂය තුල දී විනිමය පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරලීමේදී ප්‍රධාන වෙනස්කම් කිසිවක් සිදු නොවීය. ප්‍රාග්ධන ගණුදෙනු, ජංගම ගිණුම් කටයුතු අධීක්ෂණය, භාණ්ඩ නැව්ගත කරන්නන් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම, විදේශ මුදල් මාරු කරන්නන් ගේ බලපත්‍ර අළුත් කිරීම, හෝටල් කරුවන්, ස්වර්ණාභරණ සාප්පු හිමියන් වැනි විදේශිකයන්ට සපයනු ලබන සේවාවන් වෙනුවෙන් විදේශ මුදල් භාර ගැනීමට අවසර ලද්දවුන් වෙනුවෙන් නිකුත් කර ඇති බලපත්‍ර අළුත් කිරීම යන කටයුතු කෙරෙහි විනිමය පාලන දෙපාර්තමේන්තුව සිය අවධානය තවදුරටත් යොමු කරන ලදී. ශ්‍රී ලංකාවට භාණ්ඩ හා සේවා ආනයනය කිරීමේ ආනයනය කිරීමේ ක්‍රියාමාර්ගය හුවා දැක්වෙන 1996.03.21 දිනැති අංක 915/15 දරන රජයේ ගැසට් නිවේදනය ප්‍රකාර ශ්‍රී ලංකා රේගුව මගින් යොමු කරනු ලබන ආනයන අයදුම්පත් අනුමත කිරීමේ කටයුතුවලද දෙපාර්තමේන්තුව නියැළිණි. විමසුමට ලක් කෙරෙන වසර තුළදී විනිමය පාලන පනතෙහි වගන්ති උල්ලංඝනය කිරීම සම්බන්ධව වැදගත් පරීක්ෂණ කිහිපයක් ද දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලදී.

ප්‍රාග්ධන ගණුදෙනු

විදේශ ආයෝජන

විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් ගරු මුදල් ඇමතිතුමා ගේ අනුමැතිය ඇතිව ශ්‍රී ලාංකික සමාගම්වලින් විදේශීය ආයෝජන සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් කිපයක් වෙන් වෙන්ව සලකා බලා අනුමත කෙරිණි.

අපනයනකරුවන් සඳහා විදේශ මුදල් ණය

අපනයන ඇණවුම් සැකසීම සඳහා අවශ්‍ය කෙරෙන විදේශ යෙදවුම් ආනයනය කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව, අපනයනකරුවන්ට බැංකුවල දේශීය මුදල් ඒකකයෙහි ඇති සම්පත් වලින් විදේශ මුදලින් ණය ගැනීම තවදුරටත් ක්‍රියාත්මක විය. යන්ත්‍රෝපකරණ හා වෙනත් උපකරණ ආනයනය සහ දේශීය යෙදවුම් මිලදී ගැනීම වැනි අනෙකුත් අවශ්‍යතා සඳහා විදේශ මුදල් ණය ලබා ගැනීමේදී විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය අවශ්‍ය වූ අතර මෙම අයදුම්පත් වෙන් වෙන් වශයෙන් සලකා බලා අනුමත කෙරිණ. විමසුමට ලක් කෙරුණ වසර තුළදී ශ්‍රී ලාංකික සමාගම් 46 ක් ඔවුන්ගේ අපනයන නිෂ්පාදනයට අවශ්‍ය දේශීය යෙදවුම් මිලදී ගැනීම සඳහා ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 74. ක විදේශ විනිමය ණය ලබාගෙන ඇත.

විදේශ ණය

1996 වසරේදී ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් හා වාණිජ බැංකුවල විදේශ මුදල් බැංකු ඒකකවලින් ණය ලබා ගැනීම සඳහා වූ අයදුම්පත් වෙන් වෙන්ව සළකා බැලීමෙන් පසුව අනුමත කිරීම දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදු කරන ලදී.

අනෙකුත් ප්‍රාග්ධන ගණුදෙනු

පහත සඳහන් ගණුදෙනු/ව්‍යාපාර සඳහා ලැබී ඇති අයදුම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදී.

(අ) ලංසු බැඳුම්කර සඳහා බැංකු ඇපකර, ජාත්‍යන්තර කොන්ත්‍රාත්තු සඳහා අත්තිකාරම් බැඳුම්කර සහ ක්‍රියාකාරී බැඳුම්කර.

(ආ) විනිමය පාලන රෙගුලාසි වලින් සම්පූර්ණයෙන්ම නිදහස් කොට ඇති ආයෝජන මණ්ඩලය මගින් අනුමත කර ඇති සමාගම් වලට විදේශ මුදලින් ප්‍රකාශිත බැඳුම්කර නිකුත් කිරීම.

(ඇ) විශේෂ ගිණුම්, නේවාසික ආගන්තුක විදේශ මුදල් ගිණුම් සහ විශේෂ විදේශීය මුදල් ගිණුම් විවෘත කිරීම.

(ඈ) වාණිජ බැංකු සහ අනෙකුත් ණය දෙන ආයතන වලින් ශ්‍රී ලංකාවේ විදේශීය පාලිත සමාගම් සඳහා ණය ලබා ගැනීම.

(ඉ) මෙරට විදේශ විනිමය උපයෝගී කර නොගත් පදනම මත ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යන්ත්‍රසූත්‍රවල වටිනාකම වෙනුවෙන් අනේවාසිකයිනට කොටස් නිකුත් කිරීම.

(ඊ) 1992 ජූනි 29 වෙනි දින අංක 721/4 රජයේ ගැසට් නිවේදනයට අනුකූලව නො එවන ලද අරමුදල් වෙනුවෙන් අනේවාසිකයිනට කොටස් නිකුත් කිරීම

(උ) නේවාසික සමාගම් මගින් විදේශිකයිනට බැඳුම්කර නිකුත් කිරීම

විගමන මත ප්‍රාග්ධන සංක්‍රාම

වෙනත් රටවල විගමන වීසා බලපත්/ස්ථිර පදිංචි තත්ත්වය ලබාගත් පවුල් 48 ක ප්‍රාග්ධන සංක්‍රාම සඳහා වූ අයදුම්පත් 1996 වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලදී. විනිමය පාලන අවසරය ඇතිව මෙම අයදුම්කරුවන් විසින් අනේවාසික අවහිර ගිණුම්වලට රුපියල් දශ ලක්ෂ 63 ක මුදලක් බැර කැරුණු අතර ඉන් රුපියල් දශ ලක්ෂ 13. ක ප්‍රමාණයක් ප්‍රේෂණය කිරීමට අවසර දී ඇත. වාණිජ බැංකු වලින් සපයන ලද දත්තයන්ට අනුව 1996 දෙසැ. 31 දිනට අවහිර ගිණුම්වල (Blocked accounts) මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 196.0 ක් විය.

ජාත්‍යන්තර ජංගම ගණුදෙනු අධීක්ෂණය

වාණිජ බැංකු විසින් සපයන ලද තොරතුරු අනුව ජාත්‍යන්තර ජංගම ගණුදෙනු කටයුතු සම්බන්ධ විදේශ විනිමය ගලා ඒම් සහ ගලා යෑම් පිළිබඳ අධීක්ෂණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කෙරිණ. විදේශීය හිමිකරුවන් 200 ක් වෙනුවෙන් නාවික හා ගුවන් සේවා නියෝජිතයන් මෙන්ම බඩු නැව්ගත කරන්නන් විසින් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වලට කෙරෙන බැර කිරීම් හා හර කිරීම් ද රේගු භාණ්ඩ ප්‍රකාශණ, හර සටහන්, අභ්‍යන්තර ප්‍රේෂණ ආදිය පරීක්ෂා කිරීමෙන් අධීක්ෂනය කෙරුණි. ඉදිරියේදී විද්‍යුත් යන්ත්‍ර භාවිතයෙන් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට බලාපොරොත්තු වේ.

විමර්ශණ කටයුතු

ඇතැම් දේශීය හා විදේශීය සමාගම් හා පුද්ගලයින් විසින් විනිමය පාලන පනතෙහි කොන්දේසි කඩ කල අවස්ථා පිළිබඳ පරීක්ෂණ කිහිපයක් විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවා ඇත. මෙම පරීක්ෂණ ප්‍රධාන වශයෙන් විනිමය පාලන අනුමැතිය නොමැතිව කරන ලද කොටස් සංක්‍රාම/විකුණුම්/කොටස් මිලදී ගැනීම, විදේශීය ආයෝජන සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අවසර නොමැතිව විදේශ විනිමය ගනුදෙනු සිදුකිරීම පිළිබඳව විය.

රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වන වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකාණ්ඩුවේ රාජ්‍ය ණය කළමනාකරණ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මාර්ගයෙන් කරගෙන යනු ලැබිණ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සිය වගකීම් ඉටු කිරීමේදී, ශ්‍රී ලංකාණ්ඩුවේ දේශීය ණයවලට අදාළව නිකුත් කිරීම සහ ණය සේවාකරණයද, විදේශ ණයවලට අදාළව ණය සේවාකරණයද කරන ලදී. මෙම දෙපාර්තමේන්තුව විසින් දේශීය ණය කළමනාකරණයේදී ප්‍රධාන ණය උපකරණ වශයෙන් රජයේ සුරැකුම්පත් (රුපියල් ණය), භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර තැන්පතු සහතික යොදා ගන්නා ලදී.

ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත, සහ මුදල් නීති පනත සඳහා 1995 අවසාන භාගයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සංශෝධනවලින් ශ්‍රී ලංකා ණය සුරැකුම්පත් වෙළෙඳපොළේ දියුණුවට අවශ්‍ය නීතිමය රාමුව සකස් කරන ලදී.

ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය වර්ෂය පුරා ක්‍රියාත්මක විය. ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, සුරැකුම්පත් සම්බන්ධ වෙළෙඳ කටයුතු පහසු කිරීම සඳහා බැංකු කටයුතු දෙපාර්තමේන්තුව සමග 'ජංගම ගිණුම් විවෘත කිරීමට ප්‍රාථමික අලෙවිකරුවන්ට අවස්ථාව සලසන ලදී.

වාර්තා ප්‍රතිසංස්කරණය කිරීම

1996 වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් වලින් බොහොමයක් 1996 ජනවාරි 31 වැනි දින බෝම්බ පිපිරීම හා ඉන් පසුව ඇතිවූ ගින්න නිසා විනාශ වූ වාර්තා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යොමු විය. ප්‍රාථමික අලෙවිකරුවන්, ආයතනික ආයෝජකයන් හා වෙනත් ආයෝජකයන්ගෙන් ලැබුණු සහයෝගයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉතාම කෙටි කාලයක් තුළ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු නැවතත් සාමාන්‍ය තත්ත්වයට පත් කිරීමට හැකි විය.

ප්‍රාථමික අලෙවිකරුවන් හා ආයතනික ආයෝජකයන් වෙත පැවැති තොරතුරු පදනම් කර ගනිමින් භාණ්ඩාගාර බිල්පත් පිළිබඳ වාර්තා ප්‍රතිසංස්කරණය කරනු ලැබූ අතර, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් නිවේදනවලට ප්‍රතිචාර වශයෙන් ලැබුණු තොරතුරු සහ මහා භාණ්ඩාගාරය වෙත පැවැති දත්ත උපයෝගී කර ගනිමින් රජයේ සුරැකුම්පත් පිළිබඳ වාර්තා ප්‍රතිසංස්කරණය කෙරිණ. භාණ්ඩාගාර බිල්පත් හා රජයේ සුරැකුම්පත් සඳහා ගෙවීම් කිරීම සහතික පත්‍ර ඉදිරිපත් කළ විට පමණක් සිදු කළ අතර, ගෙවීම් කළ පසු අදාළ සහතික පත්‍ර අවලංගු කර දෙපාර්තමේන්තුවේ රඳවා ගැනිණ. මුදල් අමාත්‍යාංශයේ, විදේශ ණය මෙහෙයුම් ඒකකයේ සහයෝගය ඇතිව විදේශ ණය සඳහා වූ දත්ත පදනම නැවත ගොඩ නගන ලදී.

සංවර්ධන කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටු කරන ලද සංවර්ධන කටයුතු අතර ලන්ඩන්හි පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ සහයෝගිත්වයෙන් 1996 දෙසැම්බර් 9 සිට 13 දක්වා කොළඹදී පවත්වන ලද සඵල දේශීය ණය කළමනාකරණය පිළිබඳ කලාපීය වැඩමුළුවද විය. මෙම වැඩමුළුවට දකුණු සහ අග්නිදිග ආසියාතික කලාපයේ රටවල් 11 ක නියෝජිතයෝ සහභාගි වූහ. මෙම සමුළුවට පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එංගලන්තයේ මහ බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතනවල ණය කළමනාකරණය පිළිබඳ විශේෂඥයෝ සම්පත් දායකයින් වශයෙන් සහභාගි වූහ. 1996 නොවැම්බර් 2 වැනි දින ප්‍රාථමික අලෙවිකරුවන් වෙනුවෙන් 'භාණ්ඩාගාර බැඳුම්කර මිළකරණය' යනුවෙන් ද 1996 නොවැම්බර් 22 වැනිදින ආයතනික ආයෝජකයන් වෙනුවෙන් භාණ්ඩාගාර බැඳුම්කර වැඩමුළුව' යනුවෙන්ද වැඩමුළු දෙකක් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් සහ ආයතනික ආයෝජකයන් යෝජිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳව දැනුවත් කිරීම මෙම වැඩමුළුවල පරමාර්ථය විය. රජයේ ණය සුරැකුම්පත් පිළිබඳව ආයෝජකයන්ගේ අවබෝධය වැඩිදියුණු කිරීමේ බලාපොරොත්තුවෙන් ප්‍රාථමික අලෙවිකරුවන් විසින් කොළඹ හා පිට පළාත්වල සංවිධානය කරන ලද වැඩමුළු කීපයකටම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය ද සහභාගි විය.

භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව ඇරඹීම සඳහා අවශ්‍ය මූලික වැඩකටයුතු රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලැබිය. බැඳුම්කර නිකුතුව හා සම්බන්ධ පරිගණක මෘදුකාංග පද්ධතීන් නිර්මාණය කිරීම, වෙළෙඳ නියෝජිතයන් සහ ආයෝජකයන් සඳහා විධික්‍රම, නීතිරීති සහ උපදෙස් සැකසීම මේ අතර විය.

මහ බැංකු නිලධාරීන් සහ ප්‍රාථමික අලෙවිකරුවන් අතර සංවාදයක් පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන් සමග සතිපතා රැස්වීම් සංවිධානය කරන ලදී. වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සහ විවිධ කරුණු සහ ගැටලු පිළිබඳව සාකච්ඡා මණ්ඩපයක් මෙමගින් සැපයිනි. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ක්‍රියාකාරිත්වය විමර්ශනය කිරීම සඳහා ද මෙම රැස්වීම්වලදී අවස්ථාවක් සැලසින. දෙපාර්තමේන්තුවේ ඇති ප්‍රාථමික වෙන්දේසි පිළිබඳ තොරතුරු සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් නිතිපතා ලබා ගන්නා ලද ඔවුන්ගේ ද්විතියික වෙළෙඳපොළ ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත ප්‍රාථමික වෙළෙඳුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විමර්ශනය කිරීම සඳහා අවශ්‍ය දත්තමය පදනම සැකසීය.

මෙහෙයුම් කටයුතු

නොපියවූ මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණය 1996 වසර අවසන් වන විට රුපියල් දශ ලක්ෂ 690,665 ක් වූ අතර 1995 වසර හා සසඳන කල රුපියල් දශ. ලක්ෂ 72,320 ක් හෙවත් සියයට 11.7 ක වර්ධනයක් පෙන්නුම් කළේය. නොපියවූ විදේශ ණය ප්‍රමාණය 1996 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 359,475 ක් විය. මෙය 1995 වසරට වඩා දශ ලක්ෂ 13,036 ක වර්ධනයක් පෙන්වයි. මුළු දළ රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 52 ක් විදේශ ණය වූ අතර ශේෂය වූ සියයට 48 දේශීය ණය විය. II-17 වැනි සංඛ්‍යා සටහන දළ රාජ්‍ය ණය සංයුතිය පෙන්වයි.

භාණ්ඩාගාර බිල්පත්
ප්‍රාථමික වෙළෙඳපොල

1996 වර්ෂය අවසාන වන විට රුපියල් දශ ලක්ෂ 124,996 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල නොපිය වූ මුළු වගකීම් ප්‍රමාණය පෙර වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 113,771 හා සසඳන විට රුපියල් දශ ලක්ෂ 11,225 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. වර්ෂය තුළදී කරන ලද නව නිකුතුවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 13,225 ක් වූ අතර රුපියල් දශ ලක්ෂ 2,000 ක් වූ භාණ්ඩාගාර බිල්පත් ගෙවා නිදහස් කරනු ලැබිය. භාණ්ඩාගාර බිල්පත් සඳහා බලය ලත් සීමාව රුපියල් දශ ලක්ෂ 125,000 ක් ලෙස වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුණි.

II - 17 වැනි සංඛ්‍යා සටහන

දළ රාජ්‍ය ණය සංයුතිය

	1995 අවසානයට (රු.දශ.ල.)	%	1996 (අ) අවසානට (රු.දශ.ල.)	%
දේශීය ණය	271,906	44.0	331.190	48.0
භාණ්ඩාගාර බිල්පත්	113,771		124,996	
රුපියල් සුරැකුම්පත්	157,928		205,975	
භාණ්ඩාගාර තැන්පතු සහතික	200		212	
බදු සංචිත සහතිකපත්	7		7	
විදේශ ණය	346,439	56.0	359,475	52.0
එකතුව	618,345	100.00	690,665	100.00

තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව තාවකාලික

බෝම්බ පිපිරීමෙන් ඇති වූ බාධාවන් හේතුකොට ගෙන 1996 ජනවාරි 31 සහ පෙබරවාරි 07 යන සති දෙකේදී සතිපතා පැවැත්වීමට නියමිත භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රාථමික වෙන්දේසි දෙකක් තාවකාලිකව අත්හිටුවන ලදී. මෙම සති දෙකේදී පරිණත වූ භාණ්ඩාගාර බිල්පත් 1996 පෙබරවාරි 16 වැනි දිනෙන් අවසන් වූ ඊළඟ සතියේදී නැවත නිකුත් කරන ලදී. මෙම සති දෙකේදී පරිණත වූ භාණ්ඩාගාර බිල්පත්වලට ආපසු ගෙවීම සඳහා සහ ගින්නෙන් නැතිවූ සහතිකපත් වෙනුවට අනුපිටපත් නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂ වැඩ පිළිවෙලක් අනුගමනය කරන ලදී. මෙලෙස වෙන්දේසි පැවැත්වීම අත්හිටවූ සතිවලට ආසන්නතම පූර්ව සතියේ පැවැති වාර්ෂිකව සියයට 18.39 ක් වූ බර තබන ලද සාමාන්‍ය අනුපාතික පදනම් කර ගනිමින් 1996 පෙබරවාරි 02 හා 09 වැනි දිනවල පරිණත වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා ඒවායේ මුහුණත අගය මත පිළිවෙළින් සතියකට හා සති දෙකකට අදාළ අතිරේක පොළියක් ගෙවන ලදී. භාණ්ඩාගාර බිල්පත් අනුපිටපත් නිකුත් කිරීමේදී මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද සවිස්තරාත්මක නියමයන් අනුගමනය කෙරිණි. මෙම නියමයන් සකස් කිරීමේදී ආයෝජකයන්ට සිදුවිය හැකි පාඩු පිළිබඳවත්, නිකුත් කරන්නා වූ රජයේ හිමිකම් සුරක්ෂිත කිරීම කෙරෙහිත් අවධානය යොමුකරන ලදී. බැංකුවකින් නිකුත් කරන ලද ඇපකරයක් මත හෝ හානිපූරක බැඳුම්කරයක් ඉදිරිපත් කිරීම මත ආයෝජකයන් වෙත බිල්පත් සඳහා අනුපිටපත් නිකුත් කරන ලදී.

රාජ්‍ය ණය, බැංකු කටයුතු හා ආර්ථික පර්යේෂණ යන දෙපාර්තමේන්තු මගින් සේවාකරණය වන මූල්‍ය මෙහෙයුම් ඒකකය විසින් මූල්‍ය කළමනාකරණ ක්‍රමෝපායෙහි කොටසක් වශයෙන් ප්‍රාථමික වෙළෙඳපොළට ඉදිරිපත් කරන භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය, මහ

II - 18 වැනි සංඛ්‍යා සටහන

භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවලදී පිළිගත් ලංසු - මූලාශ්‍රය අනුව - 1996

රුපියල් දශ ලක්ෂ

	මූලාශ්‍රය	පරිණත කාලය (මාස) 3	6	12	වෙනත්	එකතුව	%
1.	දේශීය බැංකු	63,170	3,782	31,707	0	98,659	47
	1.1 රාජ්‍ය බැංකු	44,781	2,867.	23,911	0	71,559	34
	1.2 පෞද්ගලික බැංකු	18,389	915	7,796	0	27,100	13
2.	විදේශීය බැංකු	14,433	644	8,213	0	23,290	11
3.	බැංකු නොවන	19,255	1,524	10,091	0	30,870	14
4.	සෘජු ලංසු*	8,356	407	9,596	0	18,359	8
5.	ග්‍රහණිත ආයෝජකයන්**	7,887	2,307	2,309	0	12,508	6
6.	මහබැංකු මිළදී ගැනීම්***	0	0	0	24,401	24,401	11
7.	වෙනත්	0	0.	511	0	511	0
	එකතුව	113,101	8,664	62,427	24,401	208,593	100.0
	සියයට	54.2	4.2	29.9	11.7	100	

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

* ජා.ඉ.බැ. සේ.භා.අ.සහ ජා.ස.ම.

** මහ බැංකුවෙන් පාලනය වන අරමුදල්

*** මහ බැංකුවට සෘජුව වෙන් කරන ලද ප්‍රමාණයන්ද ඇතුළත්ව

II - 19 වැනි සංඛ්‍යා සටහන

වාර්ෂිකරණය කරන ලද බර තැබූ සාමාන්‍යයය එය ඵලදා අනුපාත

(වාර්ෂිකව සියයට)

වර්ෂය	පරිණත කාලය (මාස)			සමස්ත සාමාන්‍යය
	3	6	12	
1992	17.84	18.02	18.83	18.34
1993	19.18	19.09	20.53	20.15
1994	14.32	14.75	15.90	14.89
1995	16.31	17.43	17.63	16.84
1996	16.04	16.46	17.17	16.46

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

බැංකුවේ මිළදී ගැනීම් හා වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල පරිණත රටාව සහ මහ බැංකුව විසින් මිළදී ගත් බිල්පත්වල පරිණත සංයුතිය තීරණය කිරීම නොකඩවා කරගෙන යන ලදී.

සතිපතා පැවැත්වෙන භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවලට සහභාගිවීම ප්‍රාථමික අලෙවිකරුවන් 22 කට හා මහ බැංකුව විසින් බලය පවරන ලද ආයතනික ආයෝජකයන්ට පමණක් සීමා විය. 1996 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී පිළිගන්නා ලද ලංසුවල ව්‍යාප්තිය මූලාශ්‍රය අනුව 2 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ. සිය වත්කම් සඳහා සහ සිය ගනුදෙනුකරුවන් වෙනුවෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත් වාණිජ බැංකුමය ප්‍රාථමික අලෙවිකරුවන්, ප්‍රාථමික වෙළෙඳපොළේ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත් ප්‍රධාන ගැනුම්කරුවන් විය. බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මිලදී ගැනීම් සියයට 47. 3 ක් වූ අතර, ඉන් සියයට 34.3 ක් රාජ්‍ය බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන්ද සියයට 13.0 ක් පුද්ගලික බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ද සමන්විත විය. වෙනත් ප්‍රධාන මිලදී ගැනුම්කරුවන් වූයේ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ය. ඔවුන් සියයට 14.8 ක මිළදී ගැනීම්වලට දායක විය. 1996 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රාථමික වෙන්දේසිවල පිළිගත් ලංසු වලින් සියයට 8.8 කට භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා සහභාගිවීමට බලය ලත් රාජ්‍ය ආයතන වන ජාතික ඉතිරි කිරීමේ බැංකුව (ජා.ඉ.බැ.), සේවක භාරකාර අරමුදල (සේ.භා.අ.) සහ ජාතික සමුපකාර මණ්ඩලය (ජා.ස.ම.) දායක විය. (ජනවාරි මාසයට අදාළ දත්ත ලබාගත නොහැක.)

වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල මුළු මුහුණත වටිනාකම රුපියල් දශ ලක්ෂ 24,401 ක් විය. මින් රුපියල් දශ ලක්ෂ 8,125 ක් විශේෂ නිකුතු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සෘජුව කරන ලද වෙන් කිරීම් විය. ශ්‍රී ලංකා මහ බැංකුව හැර වෙනත් ආයෝජකයන් වෙත 1996 සිට නිකුත් කළ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 184,193 ක් විය.

1996 අවසානයේ පැවැති නොපියවූ භාණ්ඩාගාර බිල්පත් වලින් රුපියල් දශ ලක්ෂ 71,003 ක (සියයට 56.8) පරිණත කාලසීමාව මාස 12 ක් විය. ඉතිරි සියයට 43.2) රුපියල් දශ ලක්ෂ 53,992 ක් මාස 3 (සියයට 23) මාස 6 (සියයට 4.2) ක බිල්පත්වලින් සහ වෙනත් පරිණත කාලසීමා සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරන ලද (සියයට 16) බිල්පත්වලින් යුක්ත විය.

1996 වර්ෂය තුළදී මාස 3, මාස 6 මාස 12 භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතික පිළිවෙලින් සියයට 11.98 -19.27, 13.06 - 19.05 සහ 14.40 - 19.05 යන පරාසයන්හි උච්චාවචනය විය. පරිණත කාලය අනුව වාර්ෂිකරණය කළ බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකයන් සහ සමස්ත සාමාන්‍යයන් II - 19 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත. 1996 භාණ්ඩාගාර බිල්පත් නිකුතුන් වෙනුවෙන් වූ මුළු පොලී බැදීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 18,516 ක් විය.

1996 දී මාස 3 බිල්පත් සඳහා ලද ලංසුවල අවම හා උපරිම බාර තැබූ සාමාන්‍ය වාර්ෂික පලද අනුපාතිකය පිළිවෙලින් සියයට 11.02 ක් හා සියයට 18.35 විය. මාස 6 බිල්පත් සඳහා එය සියයට 12.22 ක් හා සියයට 18,51 අතර ප්‍රමාණයක් විය. මාස 12 බිල්පත් සඳහා එම අනුපාතය සියයට 12,74 - 18.13 පරාසයක පැවතුනි.

රුපියල් ණය

1996 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 72,373 ක් වටිනාකම ඇති රුපියල් ණය 20 ක් නිකුත් කරන ලදී. මෙම ණය සඳහා වර්ෂය තුළදී ලැබුණු මුළු දායකත්වය රුපියල් දශ ලක්ෂ 70,589 ක් විය. මින් රුපියල් දශ ලක්ෂ 23,873 ක් ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත පැවැති රජයේ බැදීම් පියවීම සඳහා නිකුත් කළ විශේෂ ණය වලින් සමන්විත විය. ඉතිරි රුපියල් ණය වෙනුවෙන් ප්‍රධාන දායකයන් වූයේ සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි. මෙම ආයතනික ආයෝජකයන් දෙදෙනාගෙන් ලැබුණු දායකත්වය රුපියල් දශ ලක්ෂ 43,479 ක් හෙවත් මුළු දායකත්වයෙන් සියයට 93.1 ක් විය. රුපියල් ණය 2 ක් හැර වර්ෂය තුළ නිකුත් කළ සියලුම ණය වෙනුවෙන් සම්පූර්ණයෙන්ම දායකවීම් ලැබිණ.

වර්ෂයේදී නිකුත් කළ විශේෂ රුපියල් ණය තුන සඳහා වූ වාර්ෂික පොලී අනුපාතිකය සියයට 14 ක් විය. මින් ණය දෙකක් අභිමතය පරිදි ගෙවා නිම කළ හැකි වන අයුරින් වර්ෂ 1- 10 දක්වා වූ මානප කාලසීමාවක් සහිතව නිකුත් කළ ණය වූ අතර, ඉතිරිය වර්ෂ 10 ක ස්ථිර පරිණත කාලසීමාවකින් යුක්ත විය. නිකුත් කරන ලද සහ දායකවීම් වලින් ලැබුණු රුපියල් ණය පිළිබඳ තොරතුරු සංක්ෂිප්තව පහත දැක්වෙන II - 20 වන සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

II - 20 වැනි සංඛ්‍යා සටහන

රුපියල් ණය නිකුත් කිරීම - 1996

පොලී අනුපාත (%)	පරිණත කාලය (වර්ෂ)	ණය සංඛ්‍යාව	නිකුත් කළ ප්‍රමාණය	දායකවීම් ප්‍රමාණය
14.0	5 - 7	2	19,000	19,000
14.0	4 - 6	6	11,000	10,316
13.0	7 - 8	2	6,500	5,400
15.0	2	7	12,000	12,000
14.0	1-10	2	19,393	19,393
14.0	10	1	4,480	4,480
එකතුව		20	72,373	70,589

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 22,543 ක් වටිනා රුපියල් ණය 11 ආපසු ගෙවන ලදී. ඒ අනුව රුපියල් ණය සඳහා වූ ශුද්ධ දායකවීම්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 48,046. ක් වූ අතර මේ තුළ රාජ්‍ය බැංකු දෙකට හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවට නිකුත් කරන ලද රුපියල් දශ ලක්ෂ 23,873 වටිනා විශේෂ ණය ද ඇතුළත් වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1996 අවසානය වන විට රුපියල් ණය නොපියවූ වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 205,975 දක්වා වැඩිවිය. නොපියවූ රුපියල් ණය වගකීම්වල පරිණත කාල රටාව II - 21 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

1996 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 23,201 ක් වූ සමස්ත රුපියල් ණය පොලී ගෙවීම් ප්‍රමාණය ඊට පෙර වර්ෂය සමග සංසන්දනය කරන විට රුපියල් දශ ලක්ෂ 2,213 ක (සියයට 10.5) වැඩිවීමක් පෙන්නුම් කරයි.

II - 21 වැනි. සංඛ්‍යා සටහන

1996.12.31 දිනට රුපියල් ණයවල පරිණත කාල රටාව

පරිණත කාලසීමාව	වටිනාකම (රු.දශ ලක්ෂ.)	ප්‍රතිශතය
2	12,000	5.8
3	5,000	2.4
4	17,000	8.3
4-5	16,000	7.8
5	12,204	5.9
5-6	14,878	7.2
4-6	10,317	5.0
6	5,500	2.7
5-7	52,215	25.4
6-7	5,000	2.4
7-8	5,400	2.6
8-10	1,000	0.5
1-10	19,393	9.4
10	5,980	2.9
30	24,088	11.7
එකතුව	205,975	100.0

භාණ්ඩාගාර තැන්පතු සහතිකපත්

පිළිවෙලින් සියයට 17.15 ක් සහ සියයට 18.06 ක් වූ වාර්ෂික ඵලදා අනුපාතිකයන් සහිතව මාස 6 සහ මාස 12 ක පරිණත කාලසීමාවන්සඳහා භාණ්ඩාගාර තැන්පතු සහතිකපත් නිකුත් කරන ලදී. ගත වූ වර්ෂය තුළදී මුළු සහතිකපත් අලෙවියේ මුහුණත වටිනාකම රුපියල් දශ ලක්ෂ 179.7 ක් විය. එයින් රුපියල් දශ ලක්ෂ 13 ක සහතිකපත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අලෙවි කරන ලද අතර රුපියල් දශලක්ෂ 166.7 ක සහතිකපත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් අලෙවි කරනු ලැබීය. 1996 වර්ෂයේදී භාණ්ඩාගාර තැන්පතු සහතිකපත්වල ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 167.6 ක් වූ අතර එයට රුපියල් දශ ලක්ෂ 141.5 ක් මුල් මුදල් ආපසු ගෙවීම් ද, රුපියල් දශ ලක්ෂ 26.1 පොලී ගෙවීම් ද ඇතුළත් විය. භාණ්ඩාගාර තැන්පතු සහතිකපත්වල නොපිය වූ ප්‍රමාණය 1995 අවසානයේදී පැවැති රුපියල් දශ ලක්ෂ 200.3 සිට 1996 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 212.4 ක ප්‍රමාණයක් දක්වා වර්ධනය විය.

අනෙකුත් දේශීය ණය උපකරණ

වර්ෂය තුළදී රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ නාගරික සංවර්ධන අධිකාරියේ බැඳුම්කර නිකුතු හෝ ආපසු ගෙවීම් සිදු නොවුණි. 1996 වර්ෂය අවසානයේදී මෙම බැඳුම්කරවල නොපිය වූ ශේෂයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 500, රුපියල් දශ ලක්ෂ 141 සහ රුපියල් දශ ලක්ෂ 83 බැගින් විය. බදු සංචිත සහතික පත්වල නොපිය වූ ශේෂය 1996 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 7 ක් විය. 1996 වර්ෂය තුළදී කිසිදු ශ්‍රී මහ බැංකු සුරැකුම්පත් නිකුතුවක් හෝ ආපසු ගෙවීමක් සිදු නොවිය.

විදේශ ණය

1996 අවසානයේදී නොපිය වු මුළු විදේශ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 359,475 ක් වු අතර 1995 අවසානය හා සසඳන කල එය රුපියල් දශ ලක්ෂ 13,036 ක (සියයට 3.8) වර්ධනයක් පෙන්විය. වසර අවසානයේදී නොපිය වූ මුළු ණයෙන් ද්විපාර්ශ්විය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 188,622 (සියයට 52.5) ක් වූ අතර බහු පාර්ශ්විය ණය සහ වාණිජමය ණය ප්‍රමාණයන් පිලිවෙලින් රුපියල් දශ ලක්ෂ 160,399 (සියයට 44.6) ක් සහ රුපියල් දශ ලක්ෂ 10,454 (සියයට 2.9) ක් විය. ප්‍රධාන ද්විපාශ්විය ණය හිමියන් වුයේ ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය හා ජර්මනියයි. මුළු ද්විපාර්ශවිය ණය ප්‍රමාණයෙහි මෙකී මූලයන්ගේ දායකත්වය සියයට 88.2 ක් විය. බහු පාර්ශවිය අංශයේ විශාලතම ණය හිමියා වූ ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුළු බහු පාර්ශවිය ණය ප්‍රමාණයෙන් සියයට 53.6 ක් හෙවත් රුපියල් දශ ලක්ස 85,961 කට හිමිකම් පෑවේය.

ණය මුදල් උපයෝජනය පිළිබඳව වර්ග කිරීමේදී ව්‍යාපෘති ණය, වැඩ සටහන් ණය සහ භාණ්ඩ ණය මුළු විදේශ ණය ප්‍රමාණයෙන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 263,853 (සියයට 73.4) ක්, රුපියල් දශ ලක්ෂ 38,618 (සියයට 10.7) ක් සහ රුපියල් දශ ලක්ෂ 30,834 (සියයට 8.6) ක් බැගින් විය. ණය දෙන්නන් අනුව සහ ණය මුදල් උපයෝජනය කරන ලද ආකාරය අනුව රජයේ විදේශ ණය සංයුතිය II - 22 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

1996 වසර තුළදී විදේශ රාජ්‍ය ණය මුල් මුදල් ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් සහ අනිකුත් ගාස්තු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 8,964 ක් හා රුපියල් දශ ලක්ෂ 6,829 ක් විය. වසරේ මුළු උපලබ්ධ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 23,924 ක් විය.

II - 22 වැනි සංඛ්‍යා සටහන

1996.12.31 වන දිනට නොපිය වූ දළ විදේශ රාජ්‍ය ණය

	රු.දශ ලක්ෂ	%
(1) ණය දෙන්නන් අනුව	359,473	100.0
ද්වි පාර්ශවිය	188.621	52.5
බහු පාර්ශවිය	160,399	44.6
වාණිජමය	10,454	2.9
(2) ණය මුදල් උපයෝජනය අනුව	359,475	100.0
මුදල්	1,481	0.4
භාණ්ඩ	30,834	8.6
ආහාර	24,528	6.9
වැඩසටහන්	38,618	10.7
ව්‍යාපෘති	263,852	73.4
තාක්ෂණික ආධාර	156	-
වෙනත්	6	-

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාදේශීය කාර්යාල

1996 වර්ෂයේදී කොලඹ මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයට බෝම්බ ප්‍රහාරයෙනි අලාභහානි වුවද, මාතර, අනුරාධපුර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු කිසිදු බාධාවකින් තොරව සිදුකරනු ලැබිණි. ප්‍රාදේශීය කාර්යාල මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් අතර සංවර්ධනාත්මක කටයුතු මෙන්ම සම්ප්‍රදායික මහ බැංකු කාර්යයන්ද විය. ව්‍යාවහාර මුදල් නිකුතුව, චෙක්පත් නිෂ්කාශණ කටයුතු, දත්ත රැස්කිරීම, පාරිභෝගික මූල්‍ය සමීක්ෂණ ව්‍යාපෘතිවලට සහභාගිවීම, ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ වැඩ සටහන් මෙහෙයවීම, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු අධීක්ෂණය, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන කටයුතුවලට උපකාරිවීම සහ ඒ ඒ ප්‍රදේශල සංවර්ධන කටයුතුවල නියුතු රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන හා සංවිධාන සමග සම්බන්ධීකරණය වැනි කටයුතු එම කාර්යයන් අතර විය.

මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය, දේශීය බිල්පත් යෝජනා ක්‍රමය, දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය හා සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අදාළ කටයුතු මෙහෙයවීමට තවදුරටත් දායක විය. කුඩා තේ වතු සංවර්ධන ණය යොජනා ක්‍රමය සඳහා වෙන්කර ඇති මූල්‍ය ආධාර උපරිම අයුරින් යොදා ගැනීමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය කාර්යාලය මගින් ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල ණය කඳවුරු වැඩසටහන් කීපයක්ද පවත්වන ලදී. මේ කටයුතු සංවිධානය කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව උපකාර කරන ලද අතර, එම ණය කඳවුරුවලට කුඩා තේ වතු හිමියන් හා සහභාගිත්ව ණය දෙන ආයතනවල නිළධාරීන්ද සහභාගි විය. ප්‍රදේශය තුළ රාජ්‍ය දෙපාර්තමේන්තු, වාණිජ බැංකු වෙනත් ආයතන විසින් ක්‍රියාවට නංවනු ලැබූ වෙනත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද ප්‍රාදේශීය කාර්යාලය සහාය විය. තවද ප්‍රාදේශීය කාර්යාලය විසින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා කීපයක අධීක්ෂණ කටයුතු සිදුකරන ලදී. ප්‍රාදේශීය කාර්යාලයේ ව්‍යවහාර මුදල් අංශය වාණිජ බැංකු සඳහා මුදල් තැන්පත් කිරීමේ හා නිකුත් කිරීමේ පහසුකම් තවදුරටත් ලබාදෙන ලදී. මෙම වර්ෂය තුළදී මාතර ප්‍රාදේශීය නිෂ්කාශන මධ්‍යස්ථානය විසින් රුපියල් දශලක්ෂ 2,723 ක් වටිනා චෙක්පත් 191,380 ක් නිෂ්කාශනය කර තිබුණි.

අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය මගින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවල නියුතු අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු හා ආයතනවල සහාය ඇතිව, ආර්ථික වශයෙන් ඵලදායි වූ ව්‍යාපෘතින් සඳහා ප්‍රදේශයේ වෙසෙන දිළිඳු ජනතාව සංවිධානය කිරීමේ හා උනන්දු කරවීමේ අරමුණින් පුහුනු වැඩසටහන් 23 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් කෘෂිකර්මාන්තය, සත්ව පාලනය, පසු අස්වනු තාක්ෂණ ක්‍රම, ව්‍යවසායකත්ව සංවර්ධනය යනාදී ක්ෂේත්‍රයන්ට අදාළ වූ අතර, ඒ සඳහා ප්‍රතිලාභීන් 1000 ක් පමණ සහභාගි විය. ප්‍රාදේශීය කාර්යාලය "සමෘද්ධි" හා "අමා" කෘෂිකාර්මික වැඩ සටහන් සඳහා විශේෂ අවධානයක් යොමු කළ අතර, සමෘද්ධි කළමනාකරුවන් හා නියාමකයින් සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම, ග්‍රාමීය ණය හා බැංකු කටයුතු සම්බන්ධයෙන් පුහුණුවක් ද ලබාදෙන ලදී. තව ද කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය හා කෘෂි සේවා දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘතීන් පිළිබඳව පුහුනුවක් ලබාදෙන ලදී. "අමා" වැඩසටහන යටතේ තෝරාගන්නා ලද තරුණ තරුණියන් ව්‍යාපෘති හඳුනා ගැනීම, ගණන් තැබීම, බඩු ගබඩා කිරීම හා ඇසිරීම සම්බන්ධයෙන් ද පුහුණු කෙරිණි. ප්‍රාදේශීය කාර්යාලය විසින් පවත්වනු ලැබූ ඉතිරි වැඩසටහන් අතර උසස් පෙළ සිසුන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ සහ කාන්තා ව්‍යාපෘතිලාභීන්ට හා බැංකු නිලධාරීන්ට අදාළ වන නීතිමය පසුබිම පිළිබඳ සම්මන්ත්‍රණවලින් සමන්විත වූ අතර, මේ සඳහා 700 ක් පමණදෙනා සහභාගි විය. 1996 වර්ෂය තුළදී අනුරාධපුර දිස්ත්‍රික් සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය මෙහෙයවීමේ කටයුතුද ප්‍රාදේශීය කාර්යාලය විසින් ඉටු කරන ලදී. තව ද ප්‍රාදේශීය කාර්යාලය මගින් පුත්තලම, කුරුණෑගල, අනුරාධපුර හා පොළොන්නරුව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවලට අයත් ශාඛා කීපයක කටයුතුද අධීක්ෂණය කරන ලදී. ප්‍රාදේශීය කාර්යාලය ප්‍රදේශයේ වාණිජ බැංකුවලට මුදල් නිකුත් කළ අතර, ඒවායින් තැන්පතුද භාරගන්නා ලදී. අනුරාධපුර චෙක්පත් නිෂ්කාශන මධ්‍යස්ථානය මගින් රුපියල් දශලක්ෂ, 1907 ක් වටිනා චෙක්පත් 190,563 ක් නිෂ්කාශනය කර තිබුණි.

මාතලේ ප්‍රාදේශීය කාර්යාලය තම සංවර්ධන කටයුතු ප්‍රසාරණය කරන ලද අතර, ප්‍රදේශයේ රැකියා අවස්ථා උත්පාදනයට සහාය වීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. උදාහරණයක් ලෙස 1996 වසර තුළදී දැරණියගල ප්‍රදේශයේ සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණින් ඒ ප්‍රදේශයේ සම්පත් මෙන්ම රැකියා වියුක්තිය හඳුනා ගැනීමද, රැකියා වියුක්තිකයන් විසින් තෝරා ගන්නා ලද විවිධ ක්ෂේත්‍රයන්හි (කිරි පට්ටි පාලනය, රබර් ආශ්‍රිත කර්මාන්ත, රියැදුරු, වඩු හා මේසන් වැඩ) පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමද කරන ලදී. මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් හඳුනා ගන්නා ලද තවත් ප්‍රධාන අංශයක් වූයේ මැණික් කර්මාන්තයයි. මැණික් කැපීම, ඔප දැමීම හා ස්වර්ණාභරණ කර්මාන්ත යන ක්ෂේත්‍රයන්හි පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර, මෙමගින් මාතලේ දිස්ත්‍රික්කය තුළ කණින ලද මැණික් විකිණීමෙන් ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් ලබා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද 1996 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාලය, ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සහයෝගය ඇතිව මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී. සමුපකාර ග්‍රාමීය බැංකු සේවකයින් සඳහා පුහුණ වැඩසටහන්ද කිරි පට්ටි පාලනය, සුළු පරිමාණ සහල් සැකසීම යන ක්ෂේත්‍රයන්හි ප්‍රතිලාභී පුහුනු වැඩසටහන් කීපයක්ද පැවැත්වීමට 1996 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාලය සමත්විය. කුඩා තේ වතු සංවර්ධන ණය යෝජනා ක්‍රමය හා බහුවාර්ෂික භෝග සංවර්ධන ණය යෝජනා ක්‍රමයට අදාළ කටයුතුවලද නිරත විය. මහනුවර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ ශාඛා අධීක්ෂණයද ප්‍රදේශයේ අනෙකුත් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කටයුතු පරීක්ෂාවට ලක් කිරීම ද 1996 වර්ෂය තුළදී එම කාර්යාලය විසින් ඉටු කරන ලදී. මාතලේ හා මහනුවර ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශන මධ්‍යස්ථාන් දෙක මගින් පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 1,574 ක් වටිනා චෙක්පත් 124,831 ක්ද, රුපියල් දශලක්ෂ 19,709 ක් වටිනා ,චෙක්පත් 632,624 ක්ද නිෂ්කාශනය කරන ලදී.

ලේකම් දෙපාර්තමේන්තුව

1996 වසර දෙපාර්තමේන්තුවට අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් විය. 1996 ජනවාරි 31 දින සිදුවූ බෝම්බ ප්‍රහාරයෙන් මහ බැංකු ගොඩනැගිල්ලට බරපතල හානි සිදු වූ අතර, එහි තිබූ ලී බඩු, උපකරණ සහ ලියකියවිලි බොහොමයක් විනාශ විය. මෙම ගොඩනැගිල්ල ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය ආසන්න වශයෙන් රුපියල් දශ ලක්ෂ 2000 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කර ඇත. බැංකුවේ සාමාන්‍ය මෙය පරිපාලන කටයුතු පිළිබ වගකීම දරණ දෙපාර්තමේන්තුව වශයෙන් එහි කටයුතු සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒමේ ක්‍රියාවලියෙන් විශාල කොටසක් මෙම දෙපාර්තමේන්තුවට පැවරුණි.

බෝම්බ ප්‍රහාරයේදී මහ බැංකු සේවකයින් හතලිස් එක් දෙනෙකුගේ ජීවිත හානි වූ අතර, ස්ථිර ආබාධිත තත්ත්වයට පත්වීමෙන් සේවකයින් විසි දෙනෙකුට නියමිත කාලයට පෙර විශ්‍රාම ගැනිමට සිදු විය. මිය ගිය අයගේ සහ ආබාධිත වූ අයගේ යැපෙන්නන් සඳහා රජය විසින් රජයේ සේවකයින් වෙනුවෙන් ලබාදී ඇති ක්‍රමයට බොහෝදුරට සමාන වන සේ මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී.

කොළඹ කොටුවේ මහ බැංකු ප්‍රධාන ගොඩනැගිල්ලේ තිබූ දෙපාර්තමේන්තු වලින් බොහොමයක් රාජගිරියේ ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ තාවකාලික පදනමක් මත ස්ථානගත කිරීමට සිදුවිය. සීමිත ඉඩකඩ හේතුවෙන් සමහර සේවකයින් සඳහා කෘත්‍ය ලේඛන ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම පැමිණීම සහ නිවාඩු ගැනීම වැනි දෑ සම්බන්ධ සමහර පරිපාලන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සීමිත කාලයක් සඳහා ලිහිල් කරන ලදී. 1996 නොවැම්බර් මාසයේදී බැංකුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ කොටුවේ ඇවිලන් චතුරශ්‍රයෙහි පිහිටි ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි නැවත ස්ථානගත කරන ලදී.

බැංකුවට අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ උපකරණ කඩිනම් පදනමක් යටතේ මිලදී ගැනිමට මෙම දෙපාර්තමේන්තුවට සිදුවිය. මෙම කාර්යය සඳහා බැංකුව සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල තාවකාලිකව අත්හිටුවීමට සිදුවිය. සීමිත මිල ගණන් කැඳවීම් මත මිලදී ගැනීම් අනුමත කිරීමට විධායක අධ්‍යක්ෂවරුනට බලය පවරන ලදී. මෙම ක්‍රමය යටතේ පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර විදුලි යතුරු ලියන, වර්ඩ් ප්‍රොසෙසර් වැනි ප්‍රාග්ධන වියදම් ගණයට ඇතුළත් වන අත්‍යවශ්‍ය අයිතමයන් කඩිනමින් මිලදී ගනු ලැබීය. ලී බඩු හිඟය මග හැරවීම සඳහා කුලී පදනමක් මත එම භාණ්ඩ ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවිය.

දේපල, ලී බඩු සහ උපකරණවලට සිදු වූ මහත් අලාභ හානි හේතුවෙන් 1996 දී සහ ඊට පසු වසරේදී සැලකිය යුතු ප්‍රාග්ධන වියදමක් දැරීමට සිදුවිය. අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේදී මහ බැංකුව විසින් සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කරන ලද පරිපාලන සහ ප්‍රාග්ධන වියදම් අයවැය ලේඛනයකට යටත්ව දැඩි අරපිරිමැස්මෙන් යුතුව කටයුතු කරන ලදී.

ප්‍රවෘත්ති හා ප්‍රකාශන

1996.01.31 දින සිදුවූ බෝම්බ ප්‍රහාරයෙන් වඩාත්ම දැඩි හානියක් සිදුවූයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවටය. ඉන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු මිය ගිය අතර, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයෙහිලා අගනා තොරතුරු සැපයූ මධ්‍යස්ථානය ලෙස සැලකෙන ශ්‍රී ලංකා මහ බැංකු පුස්තකාලය ද, ප්‍රකාශන අලෙවි අංශය සහ මාධ්‍ය ඒකකය ද මුළුමනින්ම විනාශයට පත්විය.

එහෙත් දෙපාර්තමේන්තුව විසින් තොරතුරු එක්රැස් කිරීමේ සහ බෙදහැරීමේ කටයුතු අඛණ්ඩව සහ නොපිරිහෙලා ඉදිරියට ගෙනයාමට සෑම ප්‍රයත්නයක්ම දරන ලදී. සමාලෝචිත වර්ෂය තුළදී ජාත්‍යන්තර සංවිධාන සහ ආයතන කිහියක් විසින්ම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පොත් සහ ප්‍රකාශන ප්‍රදානය කරන ලදී. එමෙන්ම දෙපාර්තමේන්තුව කාලීන සඟරා සහ මූලික විමර්ශන වාර්තා ආදිය සපයා ගත් අතර, වසරේ අවසන් භාගයේදී මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල සේවා කටයුතු ඇරඹීමට ද හැකිවිය.

පහත සඳහන් මහ බැංකු ප්‍රකාශන වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.

1. වාර්ෂික වාර්තාව - 1995 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
2. ආර්ථික සමීක්ෂණය - 1996 ප්‍රථම භාගය (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
3. මාසික විවරණිකාව (සිංහල ,දෙමළ සහ ඉංග්‍රීසි)
4. සමාජ ආර්ථික දත්ත බැඳුම 1996 (සිංහල, දෙමල සහ ඉංග්‍රීසි)
5. ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ දත්ත 1996 (ඉංග්‍රීසි)
6. දර්ශන II වෙළුම (සිංහල)

මීට අමතරව දෙපාර්තමේන්තුව විසින් ස්වකීය ප්‍රකාශනයන් වූ සටහන, නිව්ස් සර්වේ සහ මහ බැංකු ප්‍රවෘත්ති පත්‍රිකාව නව මුහුණුවරකින් යුතුව මාසිකව නිකුත් කරන ලදී.

දෛනික විනිමය අනුපාත, ආහාර හා එළවළු මිල ගණන්, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය පිළිබඳ තොරතුරු හා අනෙකුත් ප්‍රචාරක දැන්වීම් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වෙත නිකුත් කරමින් මාධ්‍ය ඒකකය සිය කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, 1996.01.31 දින සිද්ධීන් අළලා වාර්තා වැඩ සටහනක් ද දෙවන ලෝක යුද සමයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව "පැතිකඩ" නමින් වාර්තා වැඩසටහනක්ද නිපදවනු ලැබීය.

රූප සටහන් හා චිත්‍ර කලා ඒකකය මගින් විෂය පත්‍රිකා දැන්වීම්, මහ බැංකු ප්‍රකාශන සහ ප්‍රකාශන පිට කවර සැලසුම් කිරීම නොකඩවා කරගෙන යන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලය මගින් අදාළ වර්ෂය තුළ බැංකු මුද්‍රණ කටයුතු සියල්ලක්ම පාහේ සිදුකරන ලද අතර, මහ බැංකු වාර්ෂික වාර්තාව (සිංහල සහ ඉංග්‍රීසි), ආර්ථික සමීක්ෂණය 1996 ප්‍රථම භාගය (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි), මාසික විවරණිකාව (ඉංග්‍රීසි) සහ වෙනත් සංඛ්‍යාත්මක ලේඛන ඇතුළු මුද්‍රණ කටයුතු 440 ක් පමණ නිම කරන ලදී. එමෙන්ම, ප්‍රථම වතාවට, 1997 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සාක්කු දිනපොත මුද්‍රණය කිරීමේ කාර්යයද මහ බැංකු මුද්‍රණාලය විසින් භාරගන්නා ලදී.

පර්යේෂණ කටයුතු

1996 ජනවාරි 31 වැනි දින ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් පසු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂණික වගකීම වූයේ 1995 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු ව්‍යවස්ථාපිතව වාර්තාව නිකුත් කළයුතු අවසාන දිනය වන 1996 අප්‍රේල් 30 වැනි දිනට පෙර සම්පූර්ණ කිරීමයි. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, මූලස්ථාන ගොඩනැගිල්ලේ අඩුවෙන්ම හානියට පත් කුළුණෙන් රැස්කරගත හැකි වූ ලියකියවිලි හා වාර්තා ලබාගත් අතර බාහිර මූලයන්ගෙන් තොරතුරු එක්රැස් කිරීමටත් කඩිනමින් ක්‍රියා කළේය. මූලාශ්‍ර ලියකියවිලි සහ පරිගණක වැනි සම්පත්වල සීමිත බව සහ අප්‍රමාණවත් සන්නිවේදන පහසුකම් නිසා මෙම කාර්යය වඩාත් අභියෝගාත්මක විය. කෙසේ වෙතත් කණ්ඩායම් හැඟීමෙන් සහ කැප වීමෙන් කටයුතු කළ කාර්ය මණ්ඩලය වාර්ෂික වාර්තාව කලට වේලාවට පිළියෙල කිරීමෙන් පමණක් නොව වාර්තාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු වන පරිදි නව අංග එකතු කිරීමෙන් ද වැඩිපුර තොරතුරු ඇතුලත් කිරීමෙන් හා වඩා උසස් තත්වයෙන් ඉදිරිපත් කිරීමෙන්ද අභියෝගයන් මැඩගෙන නැගී සිටීමේ හැකියාව පෙන්නුම් කළේය.

ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා අධිපතිතුමාගේ සහ මුදල් මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා දෙපාර්තමේන්තුව විසින් ආර්ථික හා මූල්‍ය සංඛ්‍යා එක්රැස් කිරීම මෙන්ම විශ්ලේෂණය කිරීමේ සහ ආර්ථික පර්යේෂණ කටයුතුවලද අඛණ්ඩව නියැලුන අතර, මහජනයා වෙත ආර්ථිකමය තොරතුරු සැපයීමෙහිද නිරත විය. වාර්ෂික වාර්තාවට අමතරව, මාසික විවරණිකාව සහ 1996 ප්‍රථම භාගය සඳහා වූ ආර්ථික සමීක්ෂණය ප්‍රකාශයට පත් කිරීමද, මුද්‍රණ මාධ්‍ය මගින් මහජනයාට සතිපතා මූල්‍ය දත්ත සැපයීමේ වගකීමද දෙපාර්තමේන්තුව විසින් දරණ ලදී. ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ ප්‍රයෝජනය සඳහා තෝරාගත් ආර්ථික දර්ශක මාසිකව ඉදිරිපත් කරන ලදී. අයවැය පිළියෙල කිරීමේදී භාවිතා කෙරෙන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවක්ද වන "සැප්තැම්බර් 15 වාර්තාව," දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

එසේම, දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල ගණන් හා විදේශ වෙළෙඳාම් සම්බන්ධ මාසික දත්ත සකස් කළ අතර ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි තේ හා රබර් වෙන්දේසි පිළිබඳ වාර්තා සතිපතා හා මාස්පතා සකස් කලේය. එමෙන්ම විවිධ අමාත්‍යාංශ, ආයතන හා සංවිධානවල ඉල්ලීම මත මෙන්ම මුදල් මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා විවිධ ආර්ථික ගැටළු පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාද පිළියෙල කරන ලදී. කාර්මික නිෂ්පාදන පිළිබඳ අර්ධ වාර්ෂික හා වාර්ෂික සමීක්ෂණ වර්ෂය තුළදී පවත්වන ලදී. එමෙන්ම 1996 ජූනි සහ අගෝස්තු අතර කාලයේදී, දෙපාර්තමේන්තුව විසින් කාර්මික නිෂ්පාදන අංශයේ කාර්මික සබඳතා සහ ශ්‍රම ඵලදායිතාවය පිළිබඳ විශේෂ නියැදි සමීක්ෂණයක්, 1991 සිට 1996 ජූනි දක්වා කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි පවත්වන ලදී. මෙම සමීක්ෂණයෙන් බලාපොරොත්තු වූයේ සේවක සබඳතා හා සිය කර්මාන්ත ආයතනයන්හි ශ්‍රම ඵලදායිතාවය පිළිබඳ මෑතකාලීන ප්‍රවණතා පිළිබඳව හාම්පුතුන්ගේ අදහස් ලබා ගැනීමය. වැඩ වර්ජන පිළිබඳ තොරතුරු කම්කරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලදී. 1996 සැප්තැම්බර් මාසයේදී "කාර්මික නිෂ්පාදන අංශයේ සේවක සබඳතා "සහ" කාර්මික නිමැවුම් අංශයේ ඵලදායිතාවය" යනුවෙන් වාර්තා දෙකක් රජය වෙත ඉදිරිපත් කරන ලදී.

දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) වෙත දත්ත සැපයීම අඛන්ඩව කරගෙන ගිය අතර, 1996 මැයි මස රජය සහ ජා.මු.අ. අතර වූ සාකච්ඡා සම්බන්ධීකරණය කරන ලදී. වෙනත් ජාත්‍යන්තර සංවිධානවලට දත්ත සැපයීම මෙන්ම එබඳු ආයතන සමග වූ වැඩ කටයුතු සම්බන්ධීකරණයද, සුපුරුදු ලෙස අඛණ්ඩව සිදු කෙරුණි.

දෙපාර්තමේන්තුව විසින් 1996 ජූලි මාසයේ, ආර්ථික හා මූල්‍ය තොරතුරු වාර්තා කිරීමේ හා විශ්ලේෂණය කිරීමෙහි නියැලී සිටින මාධ්‍යවේදීන් සඳහා, "මෑතකාලීන ආර්ථික වර්ධණයන් හා වර්තමාන ආර්ථික ගැටළු "යන මාතෘකාව යටතේ, ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයන්ගෙන් වැඩමුළු දෙකක් කොළඹදී පවත්වන ලදී. එමෙන්ම, ඉන්දියානු සංචිත බැංකුවේ (Reserve Bank of India) විධායක අධ්‍යක්ෂ ආචාර්ය ඒ. වාසුදේවන් මහතා විසින් "මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ අවධානයක් සහිතව ඉන්දියාවේ මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධිත ඇතැම් ගැටළු" යන මාතෘකාව යටතේ 1996 දෙසැම්බර් මස කොළඹදී පැවැත් වූ සම්මන්ත්‍රණයද දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී.

දෙපාර්තමේන්තුවේ නිලධාරීහු මුදල් මෙහෙයුම් ඒකකය, භාණ්ඩාගාර බිල්පත් ටෙන්ඩර් කමිටුව, විනිමය අනුපාතික කමිටුව, මූල්‍ය අංශයේ මෙහෙයුම් කමිටුව වැනි ප්‍රතිපත්ති කරුණු සම්බන්ධිත අභ්‍යන්තර කමිටුවල සේවය කළහ. එමෙන්ම, නිළධාරීහු මෙරට හා පිටරට පැවති සම්මන්ත්‍රණයන්හිදී ආර්ථික කරුණු පිළිබඳ පත්‍රිකා ඉදිරිපත් කළහ. ශ්‍රී ලංකාව සඳහා සාර්ව ආර්ථික ආකෘතියක් සකස් කිරීම සඳහා සාර්ව ආර්ථික ආකෘති ඒකකයක් 1996 දෙසැම්බර් මස දෙපාර්තමේන්තුවේ පිහිටුවන ලදී. මෙම ආකෘතිය සකස් කළ පසු, පුරෝකතනය කිරීම සඳහා සහ ප්‍රතිපත්ති විදම්බනය සඳහාද යොදාගත හැකිවේ යයි අපේක්ෂා කෙරේ.

සමීක්ෂණ හා දත්ත එක්රැස් කිරීම

ජාතික ගිණුම්, මිල හා වැටුප් සහ සේවා නියුක්තිය ඇතුළු සමාජ ආර්ථික දත්තයන් එක්රැස් කිරීම, විශ්ලේෂණය හා පළ කිරීම හා සම්බන්ධ කටයුතු සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කරගෙන යනු ලැබිය. රටේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයන්හි ආහාර ද්‍රව්‍යවල තොග හා සිල්ලර මිළ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින් දිනපතා ප්‍රකාශයට පත්කිරීම සඳහා වර්ෂය තුළදී කටයුතු යොදනු ලැබිය. රටේ සමාජ ආර්ථික තත්ත්වයන් පිළිබඳ තොරතුරු සැපයෙන ප්‍රධාන මූලාශ්‍රයක් සේ සැලකෙන 1996/1997 පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය පැවැත්වීම 1996 වසර තුළදී ඉටුකරනු ලැබූ ප්‍රධානතම කාර්යයක් විය.

පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය

1996 / 97 පාරිභෝගික මූල්‍ය හාසමාජ ආර්ථික සමීක්ෂණයේ අදාළ දත්ත එක්රැස් කිරීමේ කටයුතු 1996 ඔක්තෝබර් මාසයේදී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. මෙම සමීක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1953 සිට කලින් කලට නොකඩවා පවත්වාගෙන ආ පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණ මාලාවක හත්වැන්න වේ. මෙම සමීක්ෂණ මාලාවේ අවසාන සමීක්ෂණය පවත්වනු ලැබුවේ 1986 / 87 වර්ෂයේදීය. මෙම සමීක්ෂණයෙහි මූලික පරමාර්ථය වන්නේ කුටුම්භයන්ට අදාළව ජනගහන සංයුතිය, ආදායම, වියදම, පාරිභෝජනය, ඉතිරි කිරීම් හා ආයෝජන වැනි සමාජ ආර්ථික තත්ත්වයන් පිළිබඳව විස්තරාත්මක දත්ත එක්රැස් කිරීමය. පළාත් පදනමක් මත සමීක්ෂණය තුළින් එක්රැස් කරන දත්ත, පළාත් මට්ටමේ සමාජ ආර්ථික දත්ත පදනම ශක්තිමත් කිරීමට යොදාගත හැකිය.

වට 4 කින් යුත් සමීක්ෂණය මගින් නාගරික, ග්‍රාමීය හා වතු අංශවල කුටුම්භයන් 8,800 ක නියැදියක් ආවරණය කෙරේ. උතුරු සහ නැගෙනහිර පළාත් දෙක හැර අනිකුත් පළාත්වල මෙම සමීක්ෂණය පැවැත්වේ. පළමු වටය යටතේ, සමීක්ෂණ නියැදියෙන් සියයට 25 පමණ ආවරණයවන, ආසන්න වශයෙන් කුටුම්භ 2000 කින් පමණ දත්ත එක්රැස් කිරීම නිම කර ඇති අතර දෙවැනි වටයෙහි දත්ත එක්රැස් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. සමීක්ෂණයෙහි ක්ෂේත්‍ර කටයුතු 1997 ඔක්තෝබර් මාසයේදී නිම කිරීමට නියමිතව ඇත.

දීප ව්‍යාප්ත දත්ත එක්රැස් කිරීමේ වැඩපිළිවෙල

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1978 දී ආරම්භ කරන ලද දීප ව්‍යාප්ත දත්ත එක්රැස් කිරීමේ වැඩපිළිවෙළ එහි දහඅට වැනි වසරේ කටයුතු සපුරන ලදී. මෙම වැඩපිළිලෙ යටතේ දත්ත සමීක්ෂකයන් ලෙස කටයුතු කරන පාසැල් ගුරුවරුන්ගෙන් සමන්විත දීප ව්‍යාප්ත පුළුල් ජාලයක් මගින් අසංවිධිත අංශයට අදාලව පාරිභෝගික ද්‍රව්‍යවල සිල්ලර මිල වැටුප් ආනුපාතික හා නිෂ්පාදන තත්ත්වය පිළිබව අදාල දත්ත සහ තොරතුරු එක්රැස් කරනු ලැබේ. වී, තේ, රබර් හා පොල් වගාව සහ කුඩා පරිමාණ ගොඩනැගිලි තැනීම් අංශය යන ආර්ථික උප අංශ මෙම පිළිවෙළ යටතේ ආවරණය වේ. මේ යටතේ එක්රැස් කෙරෙන දත්ත පුවත්පත් හා ගුවන් විදුලිය මගින් නිතිපතා ප්‍රකාශයට පත් කෙරේ. 1996 ජනවාරි හා ජුලි මාස වලදී පිළිවෙලින් මහනුවර හා අනුරාධපුරයේදී ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශිය කාර්යාලයන්හි අනුග්‍රහය ඇතිව සම්මන්ත්‍රණ කිහිපයක්ම මෙම වැඩපිළිවෙල යටතේ පවත්වනු ලැබිය.

ගොවියන්ට, වෙළෙඳුන්ට හා පාරිභෝගිකයන්ට තොරතුරු ලබාදීමේ සහ තොග හා සිල්ලර මිල විචලනයන් අධීක්ෂණය කිරීමේ අරමුණින් පිටකොටුවේ වෙළෙඳපළින් හා වෙනත් ප්‍රධාන නිෂ්පාදන මධ්‍යස්ථාන වලින් ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල තොග මිල ගණන් එකතු කිරීමේ නව වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කරනු ලැබිය. මෙම දත්තයන් මහ බැංකු ප්‍රකාශනයන්හි පළ කරනු ලැබේ. තව ද ජාතික ගිණුම් හා මිල හා වැටුප් දර්ශකයන් සකස් කිරීම සඳහා ද මෙම දත්ත භාවිතා කෙරේ.

ජාතික ගිණුම්

නිෂ්පාදන හා වියදම් අනුව ජාතික ගිණුම් සකස් කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව කරගෙන යන ලදී. ජාතික ගිණුම් ඇස්තමේන්තු ගණනය කිරීම සඳහා යොදා ගැනෙන දත්ත පදනම තවදුරටත් ශක්තිමත් කරනු ලැබිය. මේ සඳහා ගැණුනු පියවරක් වූයේ රට තුල නැගී එන ආර්ථික කටයුතු ආවරණය වන පරිදි ක්ෂේත්‍ර මට්ටමින් තොරතුරු එක්රැස් කිරීමේ වැඩපිළිවෙලක් ඇරඹීමය.

මීට අමතරව, එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාන කාර්යාලය මගින් 1993 ප්‍රකාශයට පත් කරන ලද ජාතික ගිණුම් ක්‍රමයට අදාල උපදෙස් මාලාව පදනම් කොටගත ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය දත්ත එක්රැස් කිරීමේ කාර්යයෙහිද දෙපාර්තමේන්තුව නිරත විය.

සේවා නියුක්ති දත්ත

රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන හා සංස්ථා අංශයෙහි සේවා නියුක්ති ප්‍රවණතාවන් නිශ්චය කිරීමේ පරමාර්ථයෙන් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව වාර්ෂික සමීක්ෂණය 1996 දී පවත්වනු ලැබිය.

ප්‍රකාශන

දෙපාර්තමේන්තුව මගින් "ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත" සහ "ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාණ" යන වාර්ෂික ප්‍රකාශයන් දෙක පළ කරනු ලැබිය. මෙම ප්‍රකාශන මගින් ජනගහනය, ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය, ජාතික ආදායම හා වියදම, කෘෂිකර්මය, කර්මාන්ත, විදේශ වෙළෙඳාම, මිල හා වැටුප්, මුදල්, බැංකු, රාජ්‍ය මූල්‍ය, සමාජ හා ආර්ථික සේවා සහ ප්‍රාග්ධන වෙළඳපල යන සමාජ ආර්ථික විචල්‍යයන්ට අදාළ විස්තරාත්මක කාල ශ්‍රේණි හරක්කඩ දත්තයන් ඉදිරිපත් කෙරේ. ප්‍රාදේශිය ආර්ථික ප්‍රජාවන් පිළිබඳ සාපේක්ෂ සංඛ්‍යාන තොරතුරු ද මෙම ප්‍රකාශනවල දත්ත සංයුතින්හි ඇතුළත් වේ.

දත්ත සැකසුම

1996.01.31 දින දෙපාර්තමේන්තුව සතුව තිබුණු මහ බැංකුවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල අයි.බී.එම්. 4361 වර්ගයේ ප්‍රධාන පරිගණක පද්ධතියද කුඩා ප්‍රමාණයේ පරිගණකද දත්ත පිවිසුම් ක්‍රමයද අනිකුත් සියලු උපකරණද සම්පූර්ණයෙන්ම විනාශ විය. ටේප්වලට පිටපත් කරන ලද පරිගණක වැඩ සටහන් හා සකස් කරන ලද දත්ත මහ බැංකු ගොඩනැගිල්ලෙන් පිටත තබා තිබුණි. දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව ප්‍රථම කාර්යය වූයේ වහාම කළයුතු පරිගණක කටයුතු සඳහා මහ බැංකුවේ තිබූ පරිගණක පද්ධතියට සමාන පරිගණක පද්ධතියක් සහිත ස්ථානයක් සොයා ගැනීමයි. එවැන්නක් තිබුණ ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව අපගේ පරිගණක වැඩසටහන් එම පරිගණකයට ඇතුලත් කොට වහා කළයුතු වූ පරිගණක කටයුතු ඉතා කෙටි කාලයකදී කර ගැනීමට දෙන ලද සහාය මහ බැංකුව ස්තුති පූර්වකව සඳහන් කරයි.

කුලී පදනමක් යටතේ අයි.බී.එම්. ආයතනයෙන් ලැබුණ පරිගණක උපකරණ යොදා ගනිමින් කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පද්ධතියක් පිහිටුවා එහි විශාල දත්ත ප්‍රමාණයක් අඩංගු වන දත්ත පද්ධතීන් සැකසීමට මහ බැංකුව විසින් තවදුරටත් කටයුතු කරන ලදී. පරිගණක තාක්ෂණ ආයතනයෙන් ලැබුණ සහායද, මහ බැංකුව ස්තුති පූර්වකව සිහිපත් කරයි.

පරිගණක උපකරණ හා ඒ සම්බන්ධ නිෂ්පාදන මිළදීගැනීමට ඇමෙරිකන් රජය USAID වැඩසටහන යටතේ අමෙරිකන් ඩොලර් 350,000 ක් පරිත්‍යාග කරන ලදී. එම පරිත්‍යාගයෙන් AS 400 වර්ගයේ නවීන පරිගණක පද්ධති තුනක් මිළදී ගෙන, විමධ්‍යගත කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය අනුව යමින් ඒවා ස්ථාන කිහිපයක සවි කරණ ලදී. එම පරිත්‍යාගයෙන්ම FAMAS 400 IHRM නමැති ඒකාබද්ධ මානුෂික සම්පත් කළමනාකරණය සඳහා වූ මෘදුකාංග පද්ධතියක්ද මිළදී ගන්නා ලදී. දැන් එම මෘදුකාංග පද්ධතිය බැංකුවේ අවශ්‍යතාවයන්ට සරිලන අයුරින් සාර්ථක ලෙස ස්ථාපනය කෙරෙමින් පවතී.

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව 1997 වර්ෂයේදී සමීප පරාස පරිගණක ජාලයක්, පුළුල් පරාස පරිගණක ජාලයක්, ජාත්‍යන්තර පරිගණක ජාල සම්බන්ධයක්, විද්‍යුත් තැපැල හා පණිවුඩ හුවමාරු පහසුකම්ද සහිත වූ නවීන කාර්යාල පසුබිමක් මහ බැංකුව තුළ ස්ථාපනය කිරීමට අවශ්‍ය සැළසුම් සම්පාදනයේ යෙදී සිටියේය.

ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිශ්කාෂණාගාරය

විමර්ශනයට ලක්වන වසර තුළදී නිශ්කාෂණය කරන ලද චෙක්පත් ප්‍රමාණය 1,734,557 න් වැඩි වී 27,527,822 ක් විය. උපකරණ උසස් තත්ත්වයකට පත් කිරීමේ හා 1995 අවසාන භාගයේදී දිරිදීම් සහ දඩ ඇතුළත් කළ නව ගාස්තු ක්‍රමයක් හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් චෙක්පත් නිෂ්කාශණය කිරීමේ කාලය තවදුරටත් පැයකින් අඩු කිරීමට හැකිවිය. ඈත ප්‍රදේශවලට ප්‍රවාහනය කිරීම සඳහා ආමුඛ චෙක්පත් සහ වාර්තා එදිනම රාත්‍රියෙහි පණිවුඩකරුවන් (couriers) මාර්ගයෙන් රැස්කර ගන්නා අතර මෙම පැයක අඩුවීම නිසා වාණිජ බැංකුවලට සිය අගරු චෙක්පත් සාමාන්‍යයෙන් ගතවන කාලයට වඩා කලින් ආපසු යැවීමට හැකිවිය.

පවත්නා තත්ත්වයට අනුව ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය (ස්ලිප්ස්) 1996 දී පුළුල් නොකරන ලද නමුදු එම ගෙවීම් ක්‍රමයෙන් ක්‍රියාකාරීත්වයන්ට අදාළව උපදෙස් මාලාවක් සකස් කිරීමට ශ්‍රී ලංකා ස්වයංක්‍රීය නිශ්කාෂණාගාරයට හැකිවිය. දැනට ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය වැටුප් සහ අනෙකුත් අන්තර් බැංකු ගෙවීම් සඳහා පුළුල් වශයෙන් යොදා ගැනේ. වසරේ අග භාගයේ දී සේවක අර්ථ සාධක අරමුදලද සිය සාමාජිකයන්ට ප්‍රතිලාභ ගෙවීම සඳහා ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය සමග ඒකාබද්ධ විය.

පුහුණු වැඩකටයුතු

මහ බැංකුව සිය නිලධාරීන් අධ්‍යයන සහ අනධ්‍යයන ක්ෂේත්‍රවල පුහුණු කිරීමේ ප්‍රතිපත්තිය සලකා බැලෙන වර්ෂය තුළදී ද, තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යයන පුහුණු කිරීම්, පිළිගත් විදේශිය විශ්ව විද්‍යාලවල ආර්ථික විද්‍යාව සහ ඒ හා සම්බන්ධ වෙනත් ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අදාළ විය. වර්ෂය තුළදී, නිලධාරීන් 7 දෙනෙක් බැංකු කටයුතු, වාණිජ්‍ය, මූල්‍ය, ගණකාධිකරණය, වැනි ක්ෂේත්‍රවල ශාස්ත්‍රපති උපාධි පාඨමාලා හැදෑරීම සඳහා විදේශ ගත විය. එක් නිලධාරියෙක් ඉන්දියාවේ ජාත්‍යන්තර සංඛ්‍යාන අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි සංඛ්‍යාන විද්‍යා පාඨමාලාවක් හැදෑරිය.

දේශීය සහ විදේශීය කෙටිකාලීන පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ අධ්‍යයන චාරිකා වලින් සමන්විත වූ තාක්ෂණික නොවන පුහුණු කිරීම් බැංකුවේ වැඩකටයුතු වලට අදාළ විශේෂිත ක්ෂේත්‍ර හා සම්බන්ධ ඒවා විය. 1995 වර්ෂය තුළදී, නිලධාරීන් 46 දෙනෙක් කෙටිකාලීන පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා එතෙර ගියහ. එම වර්ෂය තුළදී, නිලධාරීන් 258 දෙනෙක් පරිගණක පුහුණු පාඨමාලා වලටද, නිලධාරීන් 98 දෙනෙක් දේශීය ආයතන විසින් පවත්වන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලටද සහභාගි වූ අතර, නිලධාරීන් 85 දෙනෙක් මහ බැංකුවේ ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන ලද පාඨමාලාවලට සහභාගි වූහ.

පුහුණු වැඩ කටයුතු දෙපාර්තමේන්තුව විසින්, පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතවීමට අපේක්ෂිත නිලධාරීන් සඳහා ආර්ථික විද්‍යාව සහ ගණිතය විෂයයන් පිළිබඳ පුහුණු පංති පවත්වන ලදී. මෙම දෙපාර්තමේන්තුව විසින් සාමාන්‍යයෙන් පවත්වනු ලබන උසස් කිරීම් සඳහා පරීක්ෂණද, පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණද තවදුරටත් පවත්වන ලදී.

කළමනාකාරිත්ව විගණන

බෝම්බ පිපිරීම හේතුවෙන් පැන නැගුන දුෂ්කරතා මධ්‍යයේ වුවද කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව කලින් සැකසූ විගණන වැඩපිළිවෙලට අනුව සිය වැඩකටයුතු තවදුරටත් කරගෙන යන ලදී. මෙම විගණන ක්‍රියාවලියේ දී බැංකුවේ පිළිවෙත්වල තිබූ ඌණතා හා විෂමතා මෙම දෙපාර්තමේන්තුව විසින් පෙන්වා දෙනු ලැබූ අතර අවශ්‍ය අවස්ථාවන්හි දී ඒ පිළිබඳ නිර්දේශයන් ද ඉදිරිපත් කෙරිණ. මෙම වර්ෂය තුළ සිය කටයුතු මෙහෙයවීමේදී බෝම්බ පිපිරීම නිසා මතු වූ කරුණු සම්බන්ධයෙන් හා ඉන් අනතුරුව ඒවා විසඳා ගැනීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන ලදී. අනතුරට ලක් වූවන්ට වන්දි හා වෛද්‍ය පහසුකම් ගෙවීමට අදාළ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා ලේකම් දෙපාර්තමේන්තුව හා සුභසාධන දෙපාර්තමේන්තුව සමග ඉතා සමීපව කටයුතු කිරීමට ද දෙපාර්තමේන්තුවට සිදු විය.

ඉහත කරුණුවලට අමතරව පහත සඳහන් අධ්‍යයනයන් හා සමීක්ෂණයන් ද කරගෙන යන ලදී. මෙයින් සමහරක් දෙපාර්තමේන්තුවෙන් ආරම්භ කෙරුණු ඒවා වූ අතර තවත් සමහරක් පාලක පක්ෂය විසින් පවරන ලද කාර්යයන් විය.

1. පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය
2. බෝම්බ පිපිරීම හේතුවෙන් සමහරක් වත්කම් වලට සිදු වූ අලාභයන් පිළිබඳ තක්සේරු කිරීම
3. දෙපාර්තමේන්තුවල තිබූ වානේ හා ලී බඩු අයිතමයන් වශයෙන් ගෙන ගණන් බැලීම
4. නිවාඩු වාර්තා නැවත සකස් කිරීම පිළිබඳ අධ්‍යයනයක්

පරිශ්‍ර

කොළඹ කොටුවේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය හේතුවෙන් විවිධ දෙපාර්තමේන්තු

තාවකාලිකව වෙනත් ගොඩනැගිලිවල ස්ථානගත කිරීම 1996 වසරේදී පරිශ්‍ර දෙපාර්තමේන්තුව නිරත වූ ප්‍රධාන කාර්යය විය. ඊට අමතරව රාජගිරිය, ප්‍රාදේශීය කාර්යාල හා නිවාඩු නිකේතන ගොඩනැගිලිවල සාමාන්‍ය නඩත්තු කටයුතු නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යාමෙහි ද නිරත විය.

හානියට පත් වූ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල

බෝම්බ ප්‍රහාරයෙන් මහ බැංකු ගොඩනැගිල්ලට තදබල ලෙස හානි සිදු විය. හානියට පත් වූ කුළුණු ගොඩනැගිල්ලේ සුන්බුන් මත රඳා පැවැති බැවින් එම කුළුණු සඳහා ආධාරක යෙදීම සහ සියලුම මහල්වල සුන්බුන් ඉවත් කිරීම සඳහා ක්ෂණිකව ප්‍රතිස්ථාපන කටයුතු ද කරන ලදී. යටි මහලේ එක්රැස් වූ ජලය ඉවත් කිරීම සඳහා වතුර පොම්ප සවි කරන ලදී. තවද යටි මහලේ ජලය එක්රැස්වීම් වලක්වනු පිණිස ඉදිරිපස පැති බැම්ම යලි ගොඩ නගන ලද අතර හානියට පත් වූ බිම් මහලේ කොන්ක්‍රීට් තට්ටුව ආවරණය වන ලෙස තාවකාලික වහලක් ද ඉදි කරනු ලැබිය.

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට එක් කෙරෙන නව ගොඩනැගිල්ල

1994 අරඹන ලද ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට එක් කෙරෙන නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 1996 වර්ෂයේදී ද නොකඩවා කෙරිණ. ගල්පර විශාල වශයෙන් පැවතිම හා පාෂාණ ස්ථරයෙහි දක්නට ලැබුණු දැඩි බැවුම සහ ආරක්ෂක හේතූන් මත වැඩ නතර කිරීම් වැනි අනපේක්ෂිත තත්වයන් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රගතිය කෙරෙහි බලපෑවේය. මේ නිසා නව ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කිරීම 1998 දෙසැම්බර් මාසයේදී කළ හැකිවේයැයි අපේක්ෂා කෙරේ. මෙම ගොඩනැගිලිවල ස්ථානගත කොට ඇති බැංකුවේ දෙපාර්තමේන්තු බොහොමයක්ම නව ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යාමට හැකිවනු ඇත.

රාජගිරියෙහි නව දෙමහල් ගොඩනැගිල්ල

වර්ග අඩි 7,725 ක් පමණ වූ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම 1996 මුල් භාගයේදී නිම කරන ලදී. මෙම ගොඩනැගිල්ල ඉදි කරනු ලැබුයේ ග්‍රාමීය හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවලට සහභාගි වන්නන්ට විකල්ප නේවාසික පහසුකම් සලසාලීම සඳහා ය. එසේ වුවද, බෝම්බ ප්‍රහාරය හේතුකොටගෙන දෙපාර්තමේන්තු බොහොමයක් මෙම ගොඩනැගිල්ලෙහි තාවකාලිකව ස්ථානගත කරනු ලැබිය.

සුබසාධන

සාමාන්‍ය සුබසාධන පහසුකම් සැපයීමට අමතරව සුබ සාධන දෙපාර්තමේන්තුව විසින් බෝම්බ පිපිරීමෙන් පීඩාවට පත් කාර්ය මණ්ඩලයම විශේෂ සුබසාධන පහසුකම් සපයන ලදී.

නිවාස, මෝටර් රථ මිළදී ගැනීම හා සේවකයන්ගේ අනෙකුත් අවශ්‍යතා සඳහා සහනදායී ණය සපයන ලද අතර සේවකයන් හා ඔවුන්ගේ යැපෙන්නන් සඳහා දරණ ලද වෛද්‍ය වියදම් මාණ්ඩලික වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ බැංකුව විසින් අනුමත කරන ලද සීමාවන්ට යටත්ව ප්‍රතිපූරණය කරනු ලැබිය. කෙසේ වුවද, බෝම්බ ප්‍රහාරයට හා ඉන් පසුව ඇතිවූ ගින්නට ලක් වූවන්ගේ වෛද්‍ය අවශ්‍යතා සපුරාලනු වස් එම උපරිම සීමාවන් ලිහිල් කරනු ලැබිය. මේ හැර සීමිත කාලයක් තුළ නොමිලේ දීවා ආහාරය සපයනු ලැබූ අතර ඉන් පසුව සහනදායී මිලට ආපනශාලා පහසුකම් සපයනු ලැබිය. දුම්රිය හා බස් වාර ප්‍රවේශ පත්‍ර සඳහා සියයට 75 සහනාධාරයද, දුම්රිය නිදහස් ගමන් බලපත්‍ර ක්‍රමය ද තවදුරටත් ක්‍රියාත්මක කෙරිණ.

බෝම්බ පිපිරීම නිසා මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයෙන් බැහැර වෙනත් ගොඩනැගිලිවල ස්ථානගත කිරීමට සිදු විය. එම දෙපාර්තමේන්තුවල සේවකයන්ගේ සේවා ස්ථාන අනුව පහසුකම් සැපයීම සිදු කෙරිණ. එසේ වුව ද වසරේ වැඩි කාලයක් වෛද්‍ය සේවාව නිසි පරිදි සැපයීමට නොහැකි විය. වෛද්‍ය ආයතනයේ උපකරණ බොහොමයක්ම ගින්නෙන් විනාශ වී යාමට ඊට හේතු විය. කෙසේ වුවද බෝම්බ ප්‍රහාරයෙන් තුවාල ලැබූ සේවකයන්ගේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය සඳහා ප්‍රමුඛතාව දුන් අතර එහිදී වඩාත් ලිහිල් පිළිවෙතක් අනුගමනය කරනු ලැබිය.

මේ හැර බෝම්බ ප්‍රහාරයට ගොදුරු වූවන්ගේ දේශීය වෛද්‍ය වියදම් වෙනුවෙන් රුපියල් 250,000/= දක්වා සහ විදේශීය වෛද්‍ය වියදම් වෙනුවෙන් රුපියල් 250,000/= දක්වා ප්‍රතිපූරණය කිරීමේ පහසුකම් සපයනු ලැබිය. ඊට අමතරව බෝම්බ ප්‍රහාරයෙන් තුවාල ලැබූවන්ගේ ඉහත සඳහන් සීමාවන් ඉක්මවා යන වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා විශේෂ අරමුදලක් ස්ථාපිත කරනු ලැබිය. බෝම්බ ප්‍රහාරයෙන් හානියට පත් වූ වාහන හිමි බැංකු සේවකයන් සහන සැපයීමේ ක්‍රමයක්ද හඳුන්වා දෙනු ලැබිය.

සියලුම කාර්යය මණ්ඩල ප්‍රතිලාභ ක්‍රමවලට අදාළ දත්ත මූලාශ්‍ර සහ ගිණුම් ද ගින්නෙන් විනාශ විය. එසේ වුව ද, වෙනත් මූලාශ්‍ර වලින් ලබාගත් තොරතුරු පදනම් කොට ගෙන ගිණුම් ක්‍රමය යළි ස්ථාපිත කිරීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. වසර අවසානය වනවිට දෙපාර්තමේන්තුවේ සියලුම කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට හැකිවිය.

ආරක්ෂක සේවා

පුහුණුකිරීම්

ආරක්ෂක කාර්ය මණ්ඩලයට දැනුම ප්‍රතිපෝෂණය කිරීමේ පහත සඳහන් පුහුණුවීම් ලබාදෙන ලදී.

අ. ගිනි නිවන උපකරණ පරිහරණය කිරීම.
ආ. මූලික ප්‍රථමාධාර
ඇ. අවි ආයුධ පරිහරනය.
ඈ. වෙඩි තැබීම.
ඉ. ආරක්ෂක නිලධාරීන්ගේ යුතුකම් හා වගකීම්.

සේවයෙහි යෙදවීම

1996.01.31 දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව ඊට කලින් වූ ස්ථානවලට අමතරව පහත සඳහන් ස්ථානයන්හි ද ආරක්ෂක නිලධාරීන් රාජකාරි සඳහා යොදවන ලදි.

අ. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - 64, කෙලින් විදිය, බත්තරමුල්ල.

ආ. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව - හේමචන්ද්‍ර ගොඩනැගිල්ල, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 3.

ඇ. රාජගිරිය ග්‍රාමීය බැංකු කටයුතු සහ මාණ්ඩලික පුහුණු කිරීමේ විද්‍යාලයේ නව ගොඩනැගිල්ල.

ඈ. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව - ජනාධිපති මාවත, කොළඹ 1. (චාර්ටඩ් බැංකු ගොඩනැගිල්ල.)

ඉ. මහජන බැංකුව, වැව්තෙර ශාඛාව, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ - 10.

ඊ. ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 1.

පරිවාර රාජකාරි

අ. දෙපාර්තමේන්තුව, පොලිසියේද සහාය ඇතිව මුදල් හා රත්‍රන් ප්‍රවාහනය සඳහා පරිවාර ආරක්ෂක සේවා සපයන ලදී. මහ බැංකු අධිපතිට සහ බැංකුවට පැමිණි විදෙස් නියෝජිතයිනට දෙපාර්තමේන්තුව විසින් පරිවාර ආරක්ෂක සේවා සපයන ලදී.

කාර්ය මණ්ඩල පුවත්

1996 වර්ෂය තුළදී ආයතන දෙපාර්තමේන්තුව, බඳවා ගැණීම්, පත්වීම්, උසස්වීම් සහ විශ්‍රාම ගැනිම් ආදී සේවකයන්ට අදාළ කටයුතුවල තවදුරටත් නිරත විය. 1996 ජනවාරි මස 31 දින සිදුවූ බෝම්බ ප්‍රහාරයෙන් සහ අනතුරුව ඇති වූ ගින්නෙන් විනාශ වූ පෞද්ගලික ලිපිගොනු සහ අනෙකුත් දෙපාර්තමේන්තු ලේඛන නැවත සකස් කිරීම සම්බන්ධයෙන් සැළකිය යුතු කාර්යභාරයක් දෙපාර්තමේන්තුවට ඉටු කිරීමට සිදුවිය.

1996 වර්ෂයේදී මහ බැංකුවේ අධිපති ඒ. එස්. ජයවර්ධන මහතා පහත සඳහන් රැස්වීම්වලට සහභාගී විය.

1) 1996 අප්‍රේල් මස 14 දින සිට 28 දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන්හිදී පවත්වන ලද ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්ෂික රැස්වීමට සහභාගී වීම

2) 1996 මැයි 6 දින සිට 12 දින දක්වා සිංගප්පූරුවේ පවත්වන ලද අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණයේ 31 වන සැසිවාරය සහ 25 වන සංවත්සර සම්මේලනයට සහභාගී වීම.

3) 1996 ජූනි 6 දින සිට 7 දින දක්වා එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පැවැති එංගලන්ත බැංකුවේ පවත්වන ලද මහ බැංකු අධිපතිවරුන්ගේ රැස්වීමට
සහ
ජූනි 8 දින සිට ජූනි 10 දින දක්වා ස්විස්ටර්ලන්තයේ බාල් (Basle) හි පවත්වන ලද ඉන්ටර්නැෂල් සෙට්ල්මන්ට් බැංකුවේ (Bank of International Aettlement) 66 වන වාර්ෂික මහ සභා රැස්වීමට සහභාගී වීම.

4) 1996 සැප්තැම්බර් 25 දින සිට ඔක්තෝබර් 8 දින දක්වා වොෂින්ටන් හිදී පවත්වන ලද ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රැස්වීම්වලට සහභාගී වීම.

5) 1996 ඔක්තෝම්බර් 28 දින සිට නොවැම්බර් 2 දින දක්වා. ඉන්දියාවේ බැංගලෝර්හිදී පැවැති ඇප්‍රකා (ආසියානු පැසිපික් කලාපීය කෘෂිකාර්මික ණය සංවිධානය) විධායක මණ්ඩල රැස්වීම සහ ඇප්‍රකා සාමාන්‍ය වාර්ෂික සභා සභා රැස්වීමට සහභාගී වීම.

6) 1996 නොවැම්බර් මස 17 දින සිට 28 දින දක්වා ප්‍රංශයේ පැරිස් නුවර දී පවත්වන ලද ශ්‍රී ලංකා ආධාර කණ්ඩායමේ රැස්වීමට හා ප්‍රංශ රජය සමග පැවැති නිල සාකච්ඡාවලට සහභාගිවීම.

පත්වීම්

1. ග්‍රාමීය ණය අධ්‍යක්ෂ ඩබ්. ඒ. විජේවර්ධන මහතා 1996 පෙබරවාරි මස 28 දින සිට ඔහුගේ රාජකාරිනට අමතරව වැඩබලන සේවක අර්ථසාධක අධිකාරී වශයෙන් පත්කර ගන්නා ලදී.

2. ප්‍රාග්ධන සහ මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධන ඒකකයට අනුයුක්ත විශේෂ නිලධාරී වයි. ඒ. පියතිස්ස මහතා 1996 මාර්තු 1 දින සිට ඔහුගේ රාජකාරිනට අමතරව ආරක්ෂක සේවා අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

3. ආරක්ෂක සේවා අධ්‍යක්ෂ පී. ඒ. පෙරේරා මහතා 1996 මාර්තු මස 1 දින සිට විශේෂ නිලධාරී වශයෙන් පත්කරන ලදී.

4. ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ අධ්‍යක්ෂ ඩී. බෝයගොඩ මහතා 1996 අප්‍රේල් මස 24 දින සිට ඔහුගේ රාජකාරිනට අමතරව වැඩබලන පුහුණු වැඩකටයුතු අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

5. කළමණාකාරිත්ව විගණන අධ්‍යක්ෂ එම්. අයි. එෆ්. හම්ඩ් මහතා 1996 ජූනි මස 1 දින සිට පරිශ්‍ර අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

6 සුභසාධන අධ්‍යක්ෂ එස්. රූපසිංහ මහතා 1996 ජූනි මස 1 දින සිට කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

7. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ ආචාර්ය එන්. එල්. සිරිසේන 1996 ජූනි මස 1 දින සිට සංවර්ධන මුදල් අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

8. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජේ. ඊ. ඩී. කරුණාරත්න මහතා 1996 ජූනි මස 1 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

9. බැංකු සංවර්ධන අතිරේක අධ්‍යක්ෂ එම්. එන්. ආර්. කුරේ මිය 1996 ජූනි මස 1 දින සිට ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

10. ග්‍රාමීය ණය අතිරේක අධ්‍යක්ෂ ඩබ්. එස්. එල්. ප්‍රනාන්දු මහතා 1996 ජූනි මස 1 දින සිට සුභසාධන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

11. සංවර්ධන මුදල් අධ්‍යක්ෂ ටී. පී. සවුන්ද්‍රනායගම්මහතා 1996 ජූනි මස 1 දින සිට ලේකම් වශයෙන් පත් කරන ලදී.

12. පරිශ්‍ර අධ්‍යක්ෂ ටී. එච්. ඩී. පීරිස් මහතා 1996 ජූනි මස 1 දින සිට විශේෂ නිලධාරී වශයෙන් පත් කරන ලදී.

13. පුහුණු වැඩ කටයුතු අධ්‍යක්ෂ ආචාර්ය ඒ. ජේ. එම්. සුහේයිර් 1996 ජූනි මස 1 දින සිට විශේෂ නිලධාරී වශයෙන් පත් කරන ලදී.

14. සේවක අර්ථසාධක අරමුදල් අධිකාරී කේ. සී. එම්. ගුණසේකර මහතා ජූනි මස 01 දින සිට විශේෂ නිලධාරී වශයෙන් පත් කරන ලදී.

15. ලේකම් සී. ඊ. ජයසූරිය මහතා 1996 ජූනි මස 1 දින සිට විශේෂ නිලධාරී වශයෙන් පත් කරන ලදී.

16. විශේෂ නිලධාරී කේ. සී. එම්. ගුණසේකර මහතා 1996 සැප්තැම්බර් මස 9 දින සිට පුහුණු වැඩ කටයුතු අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලද අතර, ඔහු නැවත 1996 නොවැම්බර් 11 දින සිට විශේෂ නිලධාරී වශයෙන් පත් කරන ලදී.

17. විශේෂ නිලධාරී ආචාර්ය එල්. එල්. ගුණරත්න මහතා 1996 නොවැම්බර් මස 11 දින සිට පුහුණු වැඩ කටයුතු අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

විශ්‍රාම ගැනීම් / ඉල්ලා අස්වීම්

1. දෙපාර්තමේන්තු ප්‍රධාන ආචාර්ය ජ්. ජේ. එම්. සුහේයිර් 1996 අගෝස්තු මස 29 දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.
2. දෙපාර්තමේන්තු ප්‍රධාන සී. ඊ. ජයසූරිය මහතා 1996 නොවැම්බර් මස 16 දින සිට බැංකු සේවාවන් විශ්‍රාම ගන්නා ලදී.

මුදා හරිනු ලැබ / නිවාඩු මත සිටි නිලධාරීන් (1996 .12.31 දිනට)

ආචාර්ය ඩී. ජේ. පී ප්‍රනාන්දු මහජන බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ වශයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත,

සී. ද එස්. ජයවර්ධන මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත,

පී. පී. ජයසූරිය මහතා සහකාර සාමාන්‍යාධිකාරී (ආයෝජන) වශයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත,

ටී. එම්. අබේරත්න මිය ජනාධිපති ලේකම් කාර්යාලය වෙත,

ආචාර්ය පී. බී. ජයසුන්දර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන් අර්ධ කාලීනව මුදල් අමාත්‍යාංශය වෙත,

ආචාර්ය රාණී ජයමහ මිය ලන්ඩනයේ පොදුරාජ්‍ය මණ්ඩල කාර්යාලයේ සේවය සඳහා විදේශ නිවාඩු මත

පී. ටී. සිරිසේන මයා මාල දිවයිනේ මුල්‍ය අධිකාරියෙහි සේවය සඳහා විදේශ නිවාඩු මත